# 9. වෙළෙඳාම, ගෙවුම් තුලනය සහ සංචාරක ව්‍යාපාරය

## 9.1 සමස්ත නිරීක්ෂණ

1998 වර්ෂයේදී ශ්‍රී ලංකා ගෙවුම් තුලනයේ වෙළෙඳ සහ ජංගම ගිණුම්වල හිඟයන් තවදුරටත් පහල යාමක් හා සමස්ත ශේෂයෙහි අතිරික්තයක් පෙන්නුම් කරන ලදී. ලෝක අපනයනවල තියුණු පහත වැටීම අනුව යමින් ශ්‍රී ලංකාවේ අපනයන වර්ධන අනුපාතය සියයට 2 දක්වා අඩු විය. ආනයන පරිමාව ඉහළ ගියද, පසුබෑමට ලක් වූ ලෝක වෙළෙඳපොළ තත්ත්වයන් යටතේ බොර තෙල්, තිරිඟු, පොහොර සහ සීනි යන ප්‍රධාන ආනයන භාණ්ඩවල මිල ගණන් තියුණු ලෙස පහත වැටීම නිසා ආනයන වටිනාකම වැඩි වූයේ ඉතා සුළු වශයෙනි (සියයට0.5). ඒ අනුව 1998 දී වෙළෙඳ හිඟය පහත වැටිණි. පසුගිය වර්ෂයට වඩා තරමක් අඩු වුවද, සේවා ගිණුමෙහි අඛන්ඩ ලෙස අතිරික්තයක් වාර්තා කරනු ලැබීය. 1990 වර්ෂයේ වූ ගල්ෆ් යුද්ධය නිසා ක්වේටයෙන් ඉවත් කරනු ලැබූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට ලැබුණු එ.ජ. ඩොලර් දශ ලක්ෂ 78 ක වන්දි ගෙවීම්වලට අමතරව, පෞද්ගලික සංක්‍රාම අඛණ්ඩව වැඩි වූ අතර, එය ගෙවුම් තුලනය කෙරෙහි යහපත් බලපෑමක් ඇති කරනු ලැබීය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1998 දී ජංගම ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස පහත වැටිණි. විදේශීය දිගුකාලීන පෞද්ගලික ප්‍රාග්ධන ගලා ඒම් අඛන්ඩව ඉහළ ගිය අතර, කොටස් වෙළෙඳපොළ කටයුතු තුළින් කෙටිකාලීන පෞද්ගලික ශුද්ධ ප්‍රාග්ධන ගලා යාම් දක්නට ලැබුණි. මේ අතර එ.ජ. ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල පසුගිය වසර පහෙහි සාමාන්‍ය අවප්‍රමාණ වේගය වූ සියයට 6 ට වඩා වැඩි වේගයකින් එනම් සියයට 10 ට ආසන්න ප්‍රමාණයකින් අවප්‍රමාණය වී ඇත. දේශීය මූල්‍ය හා විදේශ විනිමය ප්‍රතිපත්තිය මූල්‍ය වෙළෙඳපොළෙහි ස්ථාවරත්වය පවත්වා ගැනීමේදී දක්වන ලද සාර්ථකත්වය හේතුකොටගෙන ශ්‍රී ලංකාවේ විදේශීය විනිමය හා මුදල් වෙළෙඳපොළ සාපේක්ෂව ස්ථාවරව පැවතිණ. වෙළෙඳ හිඟය අඩු වීම, කැපී පෙනෙන ලෙස පහත වැටුණු ජංගම ගිණුමේ හිඟය, සමස්ත ශේෂයේ අතිරික්තය සහ සාපේක්ෂ වශයෙන් ස්ථායී තත්ත්වයක පැවති විදේශීය විනිමය වෙළෙඳපොළ, 1998 වසරේ බාහිර අංශයේ වර්ධනයෙහි දක්නට ලැබුණු කැපී පෙනෙන ලක්ෂණයන් වේ.

මෙම බාහිර අංශයේ වර්ධනයන්, තරමක්දුරට හෝ ශ්‍රී ලංකාව බාහිර ආර්ථික කම්පනයන්ට ඔරොත්තු දීමේ ශක්තිය පෙන්නුම් කරනු ලැබූ නමුත් තියුණු පහත වැටීමකට ලක් වූ ලෝක වෙළෙඳපොළ තත්වයන්ගේ අහිතකර බලපෑම 1998 දෙවැනි භාගයේදී දැඩි ලෙස දැනෙන්නට විය. වර්ෂයේ ප්‍රථම භාගයේදී සියයට 8 ක් වූ අපනයන වර්ධනය වර්ෂය අවසානය වනවිට සියයට 2 දක්වා පහත වැටුණි. 1998 දී ආනයන සියයට 0.5 කින් වර්ධනය විය. ආනයන ඉල්ලුම පහළ යාම ප්‍රධාන වශයෙන් ලෝක වෙළෙඳ පොළේ පහළ මිල ගණන් නිසා සිදු වූවක් විය. 1998 පළමු මාස කිහිපය තුළදී, විශේෂයෙන් ආයෝජන භාණ්ඩ ඇතුළත් ආනයන පරිමාවෙහි සැළකිය යුතු ඉහළ යාම, 1998 අයවැය මඟින් යෝජනා කරන ලද බදු සහනවලට ආයෝජකයන් විසින් දක්වන ලද ප්‍රතිචාරය පෙන්නුම් කරනු ලබයි. කෙසේ නමුත්, එවක් පටන් ආනයන පරිමාවෙහි ක්‍රමයෙන් අඩු වීමක් දක්නට ලැබුණි. මේ අතර ඉහළ අපනයන මිල ගණන් සහ පහල ආනයන මිල ගණන්වල එකාබද්ධ ප්‍රතිඵලයක් වශයෙන් වෙළෙඳ අනුපාතය සියයට 14 කින් වර්ධනය විය. විදේශීය අංශයෙහි මෙම වර්ධනයන්හි ප්‍රතිඵලයක් වශයෙන් 1997 දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 8.1 ක් වූ වෙළෙඳ හිඟය 1998 දී සියයට 7.2 දක්වා පහත වැටිණ.

1998 දී සේවා ගිණුමෙහි එ.ජ. ඩොලර් දශ ලක්ෂ 143 ක අතිරික්තයක් වාර්තා විය. පොලී ගෙවීම්, ලාභ සහ ලාභාංශ ඇතුළත් ශුද්ධ සාධක ආදායම් ගලා යාම් සියයට 12 කින් වැඩි විය. වාණිජ බැංකු විසින් සිය වෙළෙඳපොළ දායකත්වය වැඩි කිරීමේ අරමුණින් කරන ලද තියුණු ප්‍රචාරාත්මක වැඩපිළිවෙල සහ 1990 දී වූ ගල්ෆ් යුද්ධය නිසා ක්වේටයෙන් ඉවත් කරනු ලැබූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් 31,279 දෙනෙකුට ලැබුණු වන්දි ගෙවීම් හේතුකොටගෙන ශුද්ධ සංක්‍රාම සියයට 8 කින් වැඩි විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ජංගම ගිණුමේ හිඟය අඛන්ඩව සිව් වන වසරටත් තවදුරටත් පහත වැටුණු අතර, එය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත් කල 1997 දී සියයට 2.6 සිට 1998 දී සියයට 1.8 දක්වා අඩු වෙමින් ගෙවුම් තුලනයේ සතුටුදායක වර්ධනයක් පෙන්නුම් කළේය.

1997 දී විශාල පරිමාණයෙන් වූ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 301 ක් වූ පෞද්ගලීකරණයෙන් ලත් ඉපැයීම් 1998 දී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 56 දක්වා අඩු විය. මෙම අඩු වීම පිළිබිඹු කරමින් 1998 දී මූල්‍ය ගිණුමේ ශුද්ධ මූල්‍ය ගලා ඒම් අඩු විය. ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි පවත්නා අවිනිශ්චිත තාවය හේතුකොටගෙන ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ යෝජිත කොටස් අලෙවියෙහි දෙවෙනි අදියර 1999 වර්ෂය දක්වා කල් දමන්නට සිදු විය. ශුද්ධ කෙටිකාලීන පෞද්ගලික ප්‍රාග්ධන ගලා යාම්, වාණිජ බැංකුවල කෙටිකාලීන වගකීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 48 කින් අඩු වීමත්, කොටස් වෙළෙඳපොළ තුළින් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 24 ක ගලා යාමත් සහ අනෙකුත් කෙටිකාලීන පෞද්ගලික ප්‍රාග්ධන ගලා ඒම්හි සුළු ඉහළ යාමත් පෙන්නුම් කරන ලදී. විදේශීය සෘජු ආයෝජන ඇතුළත් දිගුකාලීන පෞද්ගලික ප්‍රාග්ධන ගලා ඒම් අඛන්ඩ ලෙස වැඩි වීම ශ්‍රී ලංකාවේ මධ්‍යකාලීන සංවර්ධන උපාය මාර්ගය කෙරෙහි විදේශීය ආයෝජකයන්ගේ විශ්වාසය පිළිබිඹු කරන්නක් විය. එ.ජ.ඩොලර් දශ ලක්ෂ 150 ක් වූ විදේශීය සෘජු ආයෝජන ගලා එම් වලින් අඩකටත් වඩා වැඩි ප්‍රමාණයක් විදුලි සංදේශ අංශය සඳහා වූ අතර බලශක්ති සහ කර්මාන්ත අංශයන්ටද සැලකිය යුතු ප්‍රාග්ධන ගලා ඒම් විය. වර්ෂය තුළදී රජයට ලැබුණු දිගුකාලීන සහනදායී ප්‍රාග්ධන ගලා ඒම් වැඩි විය. සහනදායී නොවන ප්‍රාග්ධන ගලා ඒම් අඩු වීම හා විදේශීය ණය ආපසු ගෙවීම්වල තරමක් වැඩි වීම හේතුකොටගෙන රජයට ලැබුණු ශුද්ධ ප්‍රාග්ධන ගලා ඒම් සියයට 17 කින් අඩු විය.

## 9.1 සංඛ්‍යා සටහන

**ගෙවුම් තුලනය විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කිරීම** (වාණිජ බැංකු සතු විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක දේශීය බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකා) (අ)

| ශීර්ෂය | එ.ජ.ඩොලර් දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1994 | 1995 | 1996 | 1997 | 1998(ආ) | 1994 | 1995 | 1996 | 1997 | 1998 (ආ) |
| වෙළෙඳ ශේෂය | -1559 | -1505 | -1344 | -1225 | -1157 | -77022 | -77109 | -74276 | -71833 | -73945 |
| අපනයන | 3,209 | 3,807 | 4,095 | 4,639 | 4,735 | 158,554 | 195,092 | 226,801 | 274,194 | 306,329 |
| ආනයන | 4,767 | 5,311 | 5,439 | 5,864 | 5,891 | 235,576 | 272,201 | 301,077 | 346,026 | 380,274 |
| සේවා (ශුද්ධ) | 180 | 152 | 105 | 159 | 143 | 8,884 | 7,796 | 5,805 | 9,386 | 9,201 |
| ලැබීම් | 745 | 821 | 765 | 875 | 913 | 36,793 | 42,045 | 42,358 | 51,692 | 58,986 |
| ගෙවීම් | 566 | 669 | 660 | 716 | 770 | 27,910 | 34,250 | 36,553 | 42,306 | 49,786 |
| ආදායම් (ශුද්ධ)(ඇ) | -162 | -170 | -197 | -160 | -179 | -8068 | -8717 | -10923 | -9417 | -11468 |
| ලැබීම් | 171 | 226 | 186 | 234 | 214 | 8,473 | 11,596 | 10,258 | 13,792 | 13,882 |
| ගෙවීම් | 333 | 396 | 383 | 393 | 392 | 16,541 | 20,312 | 21,182 | 23,210 | 25,350 |
| භාණ්ඩ සේවා හා ආදායම් (ශුද්ධ) | -1541 | -1522 | -1436 | -1225 | -1192 | -76207 | -78030 | -79395 | -71864 | -76212 |
| පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) | 622 | 675 | 710 | 788 | 848 | 30,766 | 34,593 | 39,230 | 46,494 | 54,843 |
| ලැබීම් (ඈ) | 707 | 790 | 832 | 922 | 999 | 34,992 | 40,482 | 46,003 | 54,445 | 64,585 |
| ගෙවීම් | 85 | 115 | 122 | 135 | 151 | 4,226 | 5,889 | 6,773 | 7,951 | 9,742 |
| නිල සංක්‍රාම (ශුද්ධ) | 58 | 61 | 49 | 44 | 55 | 2,890 | 3,114 | 2,709 | 2,625 | 3,490 |
| ජංගම ගිණුම | -860 | -786 | -677 | -393 | -289 | -42551 | -40324 | -37456 | -22745 | -17880 |
| ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම | 943 | 699 | 459 | 602 | 395 | 46,569 | 36,647 | 25,725 | 30,691 | 25,321 |
| ප්‍රාග්ධන ගිණුම | 113 | 117 | 96 | 87 | 61 | 5,589 | 6,009 | 5,286 | 5,140 | 3,862 |
| ප්‍රාග්ධන සංක්‍රාම (ශුද්ධ) | 113 | 117 | 96 | 87 | 61 | 5,589 | 6,009 | 5,286 | 5,140 | 3,862 |
| ලැබීම් | 116 | 121 | 100 | 91 | 65 | 5,720 | 6,191 | 5,495 | 5,386 | 4,164 |
| ගෙවීම් | 3 | 4 | 4 | 4 | 5 | 131 | 182 | 209 | 246 | 301 |
| මූල්‍ය ගිණුම | 830 | 581 | 363 | 515 | 334 | 40,979 | 30,638 | 20,439 | 25,550 | 21,459 |
| දිගුකාලීන | 705 | 502 | 381 | 716 | 398 | 34,849 | 25,939 | 20,962 | 37,029 | 25,904 |
| සෘජු ආයෝජන | 158 | 53 | 120 | 430 | 193 | 7,815 | 2,931 | 6,606 | 25,504 | 12,379 |
| විදේශීය සෘජු ආයෝජන | 158 | 16 | 86 | 129 | 137 | 7,815 | 1,011 | 4,756 | 7,587 | 8,846 |
| පෞද්ගලීකකරණ ලැබීම් | 0 | 37 | 33 | 301 | 56 | 0 | 1,920 | 1,850 | 17,918 | 3,533 |
| පෞද්ගලික දිගුකාලීන(ශුද්ධ)(ඇ) | 295 | 91 | 2 | 47 | 7 | 14,554 | 4,648 | 88 | 3,054 | 711 |
| ලැබීම් (ඉ) | 384 | 194 | 156 | 150 | 149 | 18,992 | 9,937 | 8,628 | 8,741 | 9,873 |
| ගෙවීම් | 90 | 103 | 155 | 102 | 142 | 4,438 | 5,289 | 8,539 | 5,687 | 9,162 |
| රජයේ දිගුකාලීන (ශුද්ධ)(ඊ) | 253 | 358 | 259 | 239 | 198 | 12,479 | 18,359 | 14,268 | 8,471 | 12,814 |
| ලැබීම් | 440 | 674 | 497 | 500 | 487 | 21,757 | 34,526 | 27,442 | 24,761 | 31,525 |
| ගෙවීම් | 187 | 315 | 238 | 262 | 290 | 9,278 | 16,166 | 13,174 | 16,291 | 18,711 |
| කෙටිකාලීන : | 124 | 79 | -18 | -201 | -64 | 6,131 | 4,699 | -523 | -11479 | -4445 |
| විවිධ ආයෝජන | 28 | -2 | 7 | 13 | -24 | 1,334 | -90 | 353 | 749 | -1521 |
| පෞද්ගලික කෙටිකාලීන (ශුද්ධ)(ඇ) | 172 | 33 | -44 | -20 | 8 | 8,495 | 1,702 | -2426 | -1195 | 414 |
| වාණිජ බැංකු වත්කම් (ශුද්ධ)(ඇ) | -158 | 14 | 59 | -323 | 180 | -8160 | -2731 | 1,127 | -23384 | 5,035 |
| වාණිජ බැංකු වගකීම් (ශුද්ධ)(ඇ) | 82 | 35 | -40 | 129 | -228 | 4,461 | 5,818 | 423 | 12,352 | -8374 |
| රජයේ කෙටිකාලීන (ශුද්ධ)(ඇ) | - | - | - | - | - | - | - | - | - | - |
| විගැහි වෙන්කිරීම් | - | - | - | - | - | - | - | - | - | - |
| රුපියලේ අගය පිළිබඳ ගැලපීම් | - | - | - | - | - | -1380 | 6,394 | 4,213 | -562 | 8,559 |
| වැරදීම් හා අත්හැරීම් | 157 | 139 | 150 | -46 | -69 | 11,062 | 5,091 | 7,527 | 8,461 | -2201 |
| සමස්ත ශේෂය (උ) | 240 | 52 | -68 | 163 | 37 | 13,700 | 7,809 | 9 | 15,845 | 13,800 |
| මූල්‍ය වෙනස්වීම් (උ) | -240 | -52 | 68 | -163 | -37 | -13700 | -7809 | -9 | -15845 | -13800 |
| විනිමය අනුපාතය ශ්‍රී ලං.රු./එ.ජ.ඩොලර් | | | | | | 49.42 | 51.25 | 55.27 | 58.99 | 64.59 |
| ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස | | | | | | | | | | |
| වෙළඳ ගිණුම | | | | | | -13.3 | -11.5 | -9.7 | -8.1 | -7.3 |
| ජංගම ගිණුම | | | | | | -7.3 | -6.0 | -4.9 | -2.6 | -1.8 |
| ප්‍රදානයන් හැර ජංගම ගිණුම | | | | | | -7.8 | -6.5 | -5.2 | -2.8 | -2.1 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මෙම සංඛ්‍යා ගෙවුම් ශේෂ අත්පොතේ 5 වන සංස්කරණයට (1993) අනුරූපව,ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ජාත්‍යන්තරව අනුගමනය කරන අයුරින් සකස් කොට ඇත. තවද 1994 සිට විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (වි.ව්‍ය.මු.බැ.ඒ.)දේශීය වාණිජ බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකා ඇත.(විශේෂ සටහන අංක 8 හි තාක්ෂණික සටහන බලන්න.)

(ආ) තාවකාලික

(ඇ) 1994 ගෙවුම් ශේෂ තුලන සංඛ්‍යා ලේඛන සැකසීමේදී විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (වි.ව්‍ය.මු.බැ.ඒ.)දේශීය වාණිජ බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකන ලදී. ඒ අනුව ගෙවුම් තුලන සංඛ්‍යා ලේඛන සැකසීමේදී වි.ව්‍ය.මු.බැ.ඒ. හා අනේවාසිකයන් අතර ගණුදෙනු ඇතුලත් කරනු ලැබ ඇති අතර, වි.ව්‍ය.මු.බැ.ඒ. හා නේවාසිකයන් අතර ගණුදෙනු ඉවත්කර ඇත. වැඩි විස්තර සඳහා විශේෂ සටහන් අංක 8 හි "ගෙවුම් තුලන සංඛ්‍යා ලේඛන සැකසීමේදී වි.ව්‍ය.මු.බැ.ඒ. ගණුදෙනු නැවත අර්ථකථනය කිරීම" මත වූ තාක්ෂණික සටහන බලන්න.

(ඈ) 1990 ගල්ෆ් යුද්ධය නිසා කුවේටයේ රැකියා අහිමි වූ ශ්‍රී ලාංකිකයින්ට වන්දි වශයෙන් එක් අයෙකුට එ.ජ.ඩො. 2500 බැගින් 1997 සහ 1998 වසර වලදී පිළිවෙලින් 26,101 දෙදෙනෙක් හා 31,279 දෙනෙක් සඳහා ලැබුණු එ.ජ.ඩො.දශලක්ෂ 64 හා එ.ජ.ඩො. දශලක්ෂ 78 ද මෙහි අඩංගු වේ.

(ඉ) 1993,1994,1995 යන වසර වලදී ගුවන් යානා 5 ක් ආනයනය කිරීම සඳහා ගෙවන ලද අත්තිකාරම් ගෙවීම්වල ගැලපුම්, ප්‍රාග්ධන ලැබීම්වල ඇතුලත් වේ.


(ඊ) වැඩිමනත් තොරතුරු ඇතුලත් කිරීම සඳහා 1994 පටන් සංඛ්‍යා සංශෝධනය කර ඇත.

(උ) මූල්‍ය අංශයේ සියළුම ගණුදෙනු කාලච්ඡේද අවසානයේ විනිමය අනුපාතයන්ට අනුව පරිවර්තනය කර ඇත.

ලංකා සංවර්ධන මූල්‍ය සමායතන බැංකුව (ලං.ස.මූ.ස.බැ.) විසින් ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි එ.ජ. ඩොලර් දශ ලක්ෂ 65 වටිනා පාවෙන අනුපාතික නෝට්ටු නිකුත් කිරීමෙන් ලද ප්‍රාග්ධන ගැලීම් හා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විසින් ලබා ගන්නා ලද එ.ජ. ඩොලර් දශ ලක්ෂ 43 ක ණය මුදල්ද දිගුකාලීන ප්‍රාග්ධන ගලා ඒම්හි ඇතුළත් විය. කෙසේ වෙතත්, මූලික වශයෙන් එයාර් ලංකා සමාගමට එහි ගුවන් යානා ප්‍රතිසංවිධානය කිරීමේ වැඩපිළිවෙල යටතේ අත්තිකාරම් මුදලක් ලෙස එ.ජ. ඩොලර් දශ ලක්ෂ 48 ක් ගෙවීමට සිදු වීම නිසා මෙම අංශයට ලැබුණු ශුද්ධ දිගුකාලීන ප්‍රාග්ධන ගලා ඒම් අඩු විය.

ප්‍රධාන වශයෙන් ජපන් යෙන් අතිප්‍රමාණ වීම හේතුකොටගෙන, ණය ප්‍රසාරණාත්මක ප්‍රාග්ධන ගැලීම්වලට වඩා වැඩියෙන් විදේශීය ණය ප්‍රමාණය වැඩි වූ අතර දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත් කල 1998 දී විදේශීය ණය සියයට 1 කින් වැඩි විය. ජපන් යෙන් අති ප්‍රමාණය වීම පමණක් විදේශීය ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් දශ ලක්ෂ 200 කින් පමණ වැඩි වීමට හේතු විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් කල විදේශීය ණය සියයට 56 ක් විය. කෙටිකාලීන ණය මුළු විදේශීය ණය වලින් සියයට 6 ක් පමණ අඩු මට්ටමක පැවතින.

**9.1 රූප සටහන**
**ගෙවුම් තුලනය (අ) (ආ)**





(අ) වර්ගිකරණය ගෙවුම් තුලන අත්පොතේ හතර වන සංස්කරණයේ සිට 5 වන සංස්කරණයට වෙනස්වීමත් සමඟ වාණිජ බැංකුවල වත්කම් සහ වගකීම් වල වෙනස්වීම සමස්ථ ශේෂයෙන් ඉවත් කොට ඇත.

(ආ) 1994 සිට විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක දේශීය බැංකු ක්‍රමයේ කොටසක් සේ සලකන ලදී.


1997 වර්ෂයේදී මෙන්ම 1998 දීද ශ්‍රී ලංකාවේ ණය සේවා අනුපාතය සියයට 11 ක් ලෙසට ඇස්තමේන්තු කර ඇත.

**9.2 රූප සටහන**
**විදේශීය වෙළෙඳාම**

9.2.1 රූප සටහන
**වෙළෙඳ ගිණුම**





9.2.2 රූප සටහන (අ)
**අපනයන සහ ආනයන පරිමා දර්ශක (1997 = 100)**





(අ) පෙර පැවැති වාර්ෂික වෙළෙඳ දර්ශකයන් හා ගලපමින් (splicing) 1994 හා 1995 වසර සඳහා වන දත්තයන් ලබාගන්නා ලදී.

9.2.3 රූප සටහන (අ)
**වෙළෙඳ මිල දර්ශකය (1997 = 100)**




(අ) පෙර පැවැති වාර්ෂික වෙළෙඳ දර්ශකයන් හා ගලපමින් (splicing) 1994 හා 1995 වසර සඳහා වන දත්තයන් ලබාගන්නා ලදී.

9.2.4 රූප සටහන
**සේවා වෙළෙඳාම (අ)**




(අ) වර්ගීකරණය ගෙවුම්තුලන අත්පොතේ හතරවෙනි සංස්කරණයේ සිට පස්වෙනි සංස්කරණයට වෙනස්වීමත් සමග සේවා ගිණුමෙන් ආදායම් ඉවත්කර පෙන්වා ඇති අතර එය නව ක්‍රමය යටතේ ජංගම ගිණුමෙහි වෙනම අයිතමයක් ලෙස පෙන්වා ඇත.

**විශේෂ සටහන 8**

# ගෙවුම් තුලන සංඛ්‍යා ලේඛන සැකසීමේදී විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ගණුදෙනු නැවත අර්ථකථනය කිරීම

ගෙවුම් තුලනය යනු ආර්ථිකයන් සෙසු ලෝකයත් සමහ කරන සියළු ආර්ථික ගණුදෙනු (භාණ්ඩ, සේවා, පැවරුම්, මූල්‍ය වත්කම් හා වගකීම් සහ ප්‍රාග්ධනය අදාළව) වල සාරාංශ සංඛ්‍යාලේඛන වාර්තාවකි. ගෙවුම් තුලන සංඛ්‍යාලේඛන සැකසීමේදී අදළ ගණුදෙනු නේවාසික හා අනේවාසිකයන් අතර ගණුදෙනු ලෙස හඳුනා ගනී. වර්ෂයකට වඩා වැඩි කාලයක් රට තුළ සිටින පුද්ගලයන් පොදුවේ නේවාසිකයන් ලෙස සලකනු ලබයි. ගෙවුම් තුලන කටයුතු සඳහා අදළ වන්නේ ආර්ථික කටයුතු කරනු ලබන ව්‍යාපාරයේ පිහිටීම නිසා රටක් තුළ ක්‍රියාත්මක වන විදේශ මූල්‍ය ආයතනද ඇතුළත් ව්‍යාපාර ආයතන ඒවා වෙනත් රටක ලියාපදිංචි කර තිබුනද නේවාසික ලෙස සලකනු ලබයි.

ගෙවුම් තුලන සංඛ්‍යාලේඛන සැකසීමේදී රටවල් නේවාසික/අනේවාසික අතර වෙනස්කම් ලිහිල්ව යොදා ගෙන ඇත. මෙය ගෙවුම් තුලන සංඛ්‍යාලේඛන ජාත්‍යන්තරව සංසන්දනය කිරීම අපහසු කාර්යයක් බවට පත් කර ඇත. මෙලෙසම, අතීතයේ ශ්‍රී ලංකාවේද රට තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවල විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (වි.ව්‍ය.මු.බැ.ඒ.) සංකල්ප වශයෙන් නේවාසික වශයෙන් සැලකිය යුතුව තිබුනද මූල්‍ය හා ගෙවුම් තුලන සංඛ්‍යාලේඛන සැකසීමේදී අනේවාසික හෙවත් මුළුමනින්ම අක්වෙරල ඒකක ලෙස සලකා ඇත. මෙයට හේතු වූයේ වි.ව්‍ය.මු.බැ.ඒ. මගින් ආයෝජන මණ්ඩල (ආ.ම.) නීතියේ 17 වැනි වගන්තිය යටතේ ගැනෙන ආයෝජන සැකසුම් කලාපයේ ක්‍රියාත්මක වන ඒවකට බහුතරයක් විදේශිකයන්ට අයත් වූ සමාගම්වල මූල්‍ය අවශ්‍යතාද ඉටු කරමින් ප්‍රධාන වශයෙන් අක්වෙරළ ගණුදෙනු කිරීම අපේක්ෂා කළ හෙයිනි. කාලයාගේ ඇවෑමෙන් වි.ව්‍ය.මු.බැ.ඒ. හා දේශීය ආර්ථිකය අතර පවත්නා ගණුදෙනු වැඩි වෙමින් පවතින වාතාවරණයක් තුළ මෙම අර්ථ නිරූපනය නැවත සලකා බලන ලදී. ඒ අනුව වි.ව්‍ය.මු.බැ.ඒ. නේවාසික ආයතන ලෙස සැලකීමටත්, මූල්‍ය හා ගෙවුම් තුලන සංඛ්‍යාලේඛනවල අදල වෙනස්කම් සිදු කිරීමටත් කාලය එළඹ ඇතැයි හැඟුණි.

ඒ අනුව වි.ව්‍ය.මු.බැ.ඒ. නේවාසික ව්‍යාපාරික ආයතන ලෙස සැලකීමේ පළමු පියවර ලෙස 1996 දී මුදල් සැපයුම පිළිබඳ වඩා පුළුල් සංකල්පයක් ($M2_b$) ඇති කරමින් වි.ව්‍ය.මු.බැ.ඒ. ගණුදෙනු මූල්‍ය සමස්ථයන්හි ඇතුළත් කරන ලදී (1996 මහ බැංකු වාර්ෂික වාර්තාවේ විශේෂ සටහන් අංක 10). ගෙවුම් තුලන සංඛ්‍යාලේඛන සැකසීමේදී වි.ව.මු.බැ.ඒ. නේවාසික ආයතන ලෙස සැලකීම ඊළඟ පියවරයි. වි.ව්‍ය.මු.බැ.ඒ. නේවාසික ආයතන ලෙස සැලකීම සඳහා බාහිර දත්ත සඳහා ගැලපුම් කර ඇත. මෙම ප්‍රතිශෝධිත අර්ථකථනය යටතේ වි.ව්‍ය.මු.බැ.ඒ. හා අනේවාසිකයන් එනම් විදේශීය රටවල බැංකු හා අනෙකුත් ආයතන අතර ගණුදෙනු ගෙවුම් තුලන සංඛ්‍යා ලේඛන සැකසීමේදී ඇතුළත් කර ඇත. විදේශ ව්‍යවහාර මුදලින් වූ දේශීය ගණුදෙනු එනම් වි.ව්‍ය.මු.ඒ. හා නේවාසිකයන් අතර ගනුදෙණු ගෙවුම් ශේෂ තුලනයෙන් ඉවත් කර ඇත. මෙම තාක්ෂණික සටහනෙන් අර්ථනිරූපනයෙහි වෙනස් වීම සාධාරණීකරණය කිරීමත් එම වෙනස්කම් ගෙවුම් තුලන හා අනෙකුත් බාහිර අංශ දර්ශක මත කරනු ලබන බලපෑමත් පැහැදිලි කෙරේ.

ගෙවුම් තුලන හා මූල්‍ය සංඛ්‍යාලේඛනවල වි.ව්‍ය.මු.බැ.ඒ. නේවාසික ආයතන ලෙස සැලකීම පහත දක්වෙන පරිදි සාධාරණීකරණය කෙරේ.

(අ) මෙලෙස සැලකීම ගෙවුම් තුලන සංඛ්‍යාලේඛන ගෙවුම් තුලන අත්පොතෙහි හා එක්සත් ජාතීන්ගේ ජාතික ගිණුම් ක්‍රමයේ දක්වා ඇති පරිදි බාහිර අංශ ගණුදෙනු සම්මත ජාත්‍යන්තර වර්ගීකරණයට අනුකූල අයුරින් ඉදිරිපත් කෙරෙන අතර එය ශ්‍රී ලංකාවේ ආර්ථික දත්තයන් තවදුරටත් දියුණු කිරීමේ ඉදිරි පියවරක් වනු ඇත.

(ආ) ප්‍රධාන වශයෙන් ආයෝජන මණ්ඩල නීතියේ 17 වැනි වගන්තිය යටතේ අනුමත කරන ලද ආයතන ඇතුළත් නේවාසික ආයතනවලට සේවා සපයමින් වි.ව්‍ය.මු.බැ.ඒ. දේශීය බැංකු ක්‍රමයේ ප්‍රදන අංශයක් බවට පත්ව තිබේ (ගෙවුම් තුලන සංඛ්‍යාලේඛන සැකසීමේදී ආයෝජන මණ්ඩලය යටතට ගැනෙන ආයතන සැමවිට නේවාසිකයන් ලෙස සලකනු ලබන බව සැලකිය යුතුය). 1998 අවසානයේදී අනේවාසික ආයතන මත වූ සියයට 30 හා සසඳන කල වි.ව්‍ය.මු.බැ.ඒ. වල වත්කම් වලින් සියයට 70 කට ආසන්න ප්‍රමාණයක් දේශීය බැංකුවල ආයතන මත වූ හිමිකම් මගින් පෙන්නුම් කරන ලදී. මෙම තත්ත්වය 1980 ගණන්වල මුල් කාලයේ වූ තත්ත්වයට හාත්පසින්ම වෙනස්ය. 1985 දී වි.ව්‍ය.මු.බැ.ඒ. වල වත්කම් වලින් සියයට 62 ක් අනේවාසිකයන් මත වූ හිමිකම්ය.

(ඇ) වි.ව්‍ය.මු.බැ.ඒ. වල ගණුදෙනු වලින් බොහොමයක් දේශීය වාණිජ බැංකු විසින් කරන ලද ඒවාය. ඒ අනුව, 1998 අවසානයේදී ඒවා විසින් දේශීය ආයතනවලට දෙන ලද ණය පිළිබිඹු කරමින් වත්කම් වලින් සියයට 66 ක් දේශීය බැංකුවල වි.ව්‍ය.මු.බැ.එ. මගින් දරණ ලද අතර ඉතිරි සියයට 34 ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විදේශීය බැංකුවල වි.ව්‍ය.මු.බැ.ඒ. මගින් දරණ ලදී.

**විශේෂ සටහන 8 (සම්බන්ධයි)**

(ඇ) වි.ව්‍ය.මු.බැ.ඒ. සම්පත් වලින් වැඩි ප්‍රමාණයක් ප්‍රධාන වශයෙන් ආයෝජන මණ්ඩලය යටතට ගැනෙන ආයතන ඇතුළත් නේවාසික ආයතනවලට අයත් තැන්පතු සහ දේශීය බැංකු ඒකක (දේ.බැ.ඒ.) තම විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු වි.ව්‍ය.මු.බැ.ඒ. වල තැන්පත් කිරීම් ආකාරයෙන් දේශීය ආර්ථික ක්‍රමය තුළින් ඒකරාශී කරනු ලබයි. ප්‍රධාන වශයෙන්ම අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල අරමුදල් වලින් සමන්විත විදේශීය විනිමය අරමුදල් දේ.බැ.ඒ. විසින් තැන්පත් කිරීම මගින් වි.ව.මු.බැ.ඒ. වල සම්පත් වලින් සියයට 30 ක් සපයනු ලබයි (අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වලින් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් නේවාසිකයන් විසින්ම දරනු ලබයි). වි.ව්‍ය.මු.බැ.ඒ. වල සම්පත්වල ඉතිරි කොටසින් වැඩි ප්‍රමාණයක් ආයෝජන මණ්ඩලය යටතට ගැනෙන ආයතනවලට අයත් තැන්පතුවලින් සමන්විත වේ.

(ඉ) දේශීය ආයතන හා දේශීය-විදේශීය හවුල් සමාගම් විශාල ප්‍රමාණයක් ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි වෙමින් පවතින අතර මෙම ආයතන වි.ව්‍ය.මු.බැ.ඒ. පහසුකම් සඳහා සුදුසුකම් ලබන අතර එය වි.ව්‍ය.මු.බැ.ඒ. දේශීය ආර්ථිකය හා ඒකාබද්ධ වීමකට හේතු වේ. 1998 අවසානයේදී අනේවාසිකයන් සමග වූ ගණුදෙනු ප්‍රමාණය වි.ව්‍ය.මු.බැ.ඒ.වල මුළු ගණුදෙනු වලින් සියයට 30 ක් පමණක් විය.

ඉහත දක්වන ලද කරුණු අනුව ගෙවුම් තුලන සංඛ්‍යාලේඛනවල වි.ව්‍ය.මු.බැ.ඒ. හා අනේවාසිකයන් අතර ගණුදෙනු පමණක් ඇතුළත් කිරීම වි.ව්‍ය.මු.බැ.ඒ. හා නේවාසිකයන් අතර ගණුදෙනු ඉවත් කිරීම යෝග්‍ය වේ. මෙම අර්ථ නිරූපනයේ වෙනස්වීම ගෙවුම් තුලනය හා අනෙකුත් බාහිර අංශ ආර්ථික දර්ශක මත බලපෑම් පහත දක්වේ. (1 වැනි සංඛ්‍යා සටහන)

(අ) ආදායම් ගිණුම : වෙනස්කම් පැන නගින්නේ වාණිජ බැංකු වලින් සහ පෞද්ගලික අංශය විසින් පොලී ලැබීම් සහ ගෙවීම්වල වෙනස්කම් වලිනි. වි.ව්‍ය.මු.බැ.ඒ. හා දේ.බැ.ඒ. එක් කිරීම නිසා වාණිජ බැංකුවල විදේශීය වත්කම් හා විදේශීය වගකීම් දෙකොටසම වැඩි වීමත් සමග වාණිජ බැංකුවල පොලී ලැබීම් සහ පොලී ගෙවීම් වැඩි වනු ඇත. ආයෝජන මණ්ඩලය යටතට ගැනෙන ආයතන ප්‍රධාන කොටගත් බැංකු නොවන නේවාසිකයන් විසින් වි.ව්‍ය.මු.බැ.ඒ. වලින් ලබා ගන්නා ලද ණය මත පොලී ගෙවීම් සහ එවැනි නේවාසිකයන් විසින් වි.ව්‍ය.මු.බැ.ඒ.වල කර ඇති තැන්පතු මත පොලී ලැබීම් ඉවත් කිරීමේ හේතුවෙන් බැංකු නොවන පෞද්ගලික අංශයේ පොලී ලැබීම් සහ ගෙවීම් අඩු වනු ඇත. මෙම වෙනස්කම්වල ශුද්ධ ප්‍රතිඵලය වන්නේ 1998 දී ආදායම් ගිණුමෙහි හිඟය අඩු වීමත්, එම ප්‍රමාණයෙන් ජංගම ගිණුමේ හිඟය අඩු වීමත්ය.

(ආ) මූල්‍ය ගිණුම : වෙනස්කම් ප්‍රධාන වශයෙන් ආයෝජන මණ්ඩලය යටතට ගැනෙන සහ නොගැනෙන ආයතන සහ රජය විසින් වි.ව්‍ය.මු.බැ.ඒ. මගින් ලබා ගන්නා ලද ණය ඉවත් කිරීම තුළින් සහ නව අර්ථ නිරූපනයට අනුව වාණිජ බැංකුවල වත්කම් සහ වගකීම්හි වි.ව්‍ය.මු.බැ.ඒ. සහ දේ. බැ.ඒ. දෙකොටසම ඇතුළත් වීම මගින් පැන නැගේ.

- පෞද්ගලික දිගුකාලීන ප්‍රාග්ධනය : මෙම අර්ථ නිරූපනයෙහි වූ වෙනස්කම් හේතුවෙන් 1998 වර්ෂයේදී පෞද්ගලික දිගුකාලීන ප්‍රාග්ධනය ගලා ඒම්හි ශුද්ධ තත්ත්වයේ වෙනස් වීමක් සිදු නොවේ. මෙය හුදෙක් අහඹු සිදු වීමකි.

- පෞද්ගලික කෙටිකාලීන ප්‍රාග්ධනය : ප්‍රධාන වශයෙන් ආයෝජන මණ්ඩලය යටතට ගැනෙන ආයතන සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ප්‍රමුඛ කොටගත් රාජ්‍ය සංස්ථා ඇතුළත් දේශීය පෞද්ගලික අංශය හා වි.ව්‍ය.මු.බැ.ඒ. අතර ගණුදෙනු නව අර්ථ නිරූපනය අනුව නේවාසිකයන් අතර ගණුදෙනු ලෙස සැලකීමත්, ඒවා පැරණි අර්ථ නිරූපණයට අනුව මෙන් නොව කෙටිකාලීන විදේශීය ප්‍රාග්ධන ගලාඒම් ලෙස නොසැලකීමත් නිසා පෞද්ගලික කෙටිකාලීන ප්‍රාග්ධන ගලා ඒම් සහ ගලායාම් සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වනු ඇත. මෙහි ප්‍රතිඵලය වන්නේ 1998 දී පැරණි ක්‍රමය අනුව ශුද්ධ පෞද්ගලික කෙටිකාලීන ප්‍රාග්ධනයෙහි වූ හිඟයක සිට නව ක්‍රමය අනුව සුළු අතිරික්තයක් දක්වා වෙනස් වීමයි.

- රජයේ දිගුකාලීන ප්‍රාග්ධනය : වි.ව්‍ය.මු.බැ.ඒ. වලින් රජයේ ණය ගැනීම් සහ ආපසු ගෙවීම් ඉවත් කර ඇති අතර ඒවා දේශීය සම්පත් මූල්‍යනය යටතේ දක්වා ඇත. 1998 නොවැම්බර් මස රජය විසින් වි.ව්‍ය.මු.බැ.ඒ. වලින් ලබා ගත් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 100 ක සමූහ (Syndicate) ණය මුදල නව අර්ථ කථනය යටතේ දේශීය ණය ගැනීම් ලෙස වර්ගීකරණය කර ඇත.

- වාණිජ බැංකු : දේ.බැ.ඒ. ශේෂයන් වි.ව්‍ය.මු.බැ.ඒ.වල තැන්පත් කිරීම ඉවත් කිරීම සඳහා වත්කම් නැවත අර්ථකථනය කර ඇති අතර වි.ව්‍ය.මු.බැ.ඒ. හා දේ.බැ.ඒ. විසින් අනේවාසිකයන් සමග දරණ

## 1 වැනි සංඛ්‍යා සටහන
## ගෙවුම් තුලනය 1998 (අ)

**පැරණි ඉදිරිපත් කිරීම (වි.ව්‍ය.මු.බැ.ඒ. අක් වෙරළ ඒකක ලෙස සලකා)**

| ශීර්ෂය | හර (එ.ජ.ඩො. දශලක්ෂ) | බැර (එ.ජ.ඩො. දශලක්ෂ) | ශුද්ධ (එ.ජ.ඩො. දශලක්ෂ) |
|---|---|---|---|
| අ. භාණ්ඩ | 4,735 | 5,891 | -1,157 |
| ආ. සේවා | 913 | 770 | 143 |
| ප්‍රවාහන | 400 | 263 | 137 |
| මගී ගාස්තු | 139 | 124 | 15 |
| නැව් කුලී | 34 | 57 | -23 |
| වෙනත් | 227 | 82 | 145 |
| සංචාර | 230 | 202 | 28 |
| රක්ෂණ සේවා | 34 | 18 | 16 |
| වෙනත් ව්‍යා. සේවා | 224 | 253 | -29 |
| රජයේ වියදම් (වෙනත් තැනක සඳහන් නොවන) | 25 | 34 | -9 |
| ඇ. ආදයම් | 214 | 423 | -209 |
| සේවක වන්දි | 12 | 13 | -2 |
| සෘජු ආයෝජන | 2 | 91 | -89 |
| වෙනත් | 200 | 319 | -119 |
| ඈ. ජංගම සංක්‍රාම | 1,054 | 151 | 903 |
| පෞද්ගලික | 999 | 151 | 848 |
| මහ ආණ්ඩුව | 55 | - | 55 |
| ජංගම ගිණුම | 6,915 | 7,235 | -320 |
| ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම | 1,918 | 1,291 | 627 |
| අ. ප්‍රාග්ධන ගිණුම | 65 | 5 | 61 |
| ප්‍රාග්ධන සංක්‍රාම | 65 | 5 | 61 |
| මහ ආණ්ඩුව (වෙනත්) | 55 | - | 55 |
| වෙනත් අංශ(සංක්‍රමික සංක්‍රාම) | 10 | 5 | 5 |
| ආ. මූල්‍ය ගිණුම | 1,853 | 1,287 | 566 |
| පෞද්ගලික ආයෝජන | 1,266 | 989 | 276 |
| දිගුකාලීන ආයෝජන | 373 | 174 | 200 |
| සෘජු ආයෝජන | 150 | 13 | 137 |
| පෞද්ගලිකරණ ලැබීම | 56 | 0 | 56 |
| වෙනත් පෞද්ගලික දිගුකාලීන | 167 | 160 | 7 |
| කෙටි කාලීන | 893 | 816 | 77 |
| විවිධ ආයෝජන | 70 | 93 | -24 |
| වෙනත් පෞද්ගලික කෙටි කාලීන | 452 | 460 | -7 |
| වාණිජ බැංකු වත්කම් | 141 | 219 | -78 |
| වාණිජ බැංකු වගකීම් | 229 | 44 | 186 |
| මහ ආණ්ඩුව | 587 | 297 | 290 |
| දිගුකාලීන | 466 | 157 | 308 |
| වෙනත් දිගුකාලීන | 121 | 140 | -18 |
| කෙටි කාලීන | - | - | - |
| මූල්‍ය අංශය | 607 | 644 | -37 |
| රජය වත්කම් | 12 | 13 | -1 |
| රජය වගකීම් | - | - | - |
| මහ බැංකුව - වත්කම් | 302 | 257 | 46 |
| මහ බැංකුව - වගකීම් | 293 | 291 | 1 |
| ජා.මූ.අ. සමඟ ගණුදෙනු | - | 83 | -83 |
| විගැහි වෙන්කිරීම් | - | - | - |
| රුපියලේ අගය පිළිබඳ ගැලපීම්- | - | - | |
| මූල්‍ය රන් | - | - | - |
| වැරදීම් හා අත්හැරීම් | - | -270 | -270 |

**නව ඉදිරිපත් කිරීම (වි.ව්‍ය.මු.බැ.ඒ. දේශීය බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකා)**

| ශීර්ෂය | හර (එ.ජ.ඩො. දශලක්ෂ) | බැර (එ.ජ.ඩො. දශලක්ෂ) | ශුද්ධ (එ.ජ.ඩො. දශලක්ෂ) |
|---|---|---|---|
| අ. භාණ්ඩ | 4,735 | 5,891 | -1,157 |
| ආ. සේවා | 913 | 770 | 143 |
| ප්‍රවාහන | 400 | 263 | 137 |
| මගී ගාස්තු | 139 | 124 | 15 |
| නැව් කුලී | 34 | 57 | -23 |
| වෙනත් | 227 | 82 | 145 |
| සංචාර | 230 | 202 | 28 |
| රක්ෂණ සේවා | 34 | 18 | 16 |
| වෙනත් ව්‍යා. සේවා | 224 | 253 | -29 |
| රජයේ වියදම් (වෙනත් තැනක සඳහන් නොවන) | 25 | 34 | -9 |
| ඇ. ආදයම් | 214 | 392 | -179 |
| සේවක වන්දි | 12 | 13 | -2 |
| සෘජු ආයෝජන | 2 | 91 | -89 |
| වෙනත් | 200 | 288 | -88 |
| ඈ. ජංගම සංක්‍රාම | 1,054 | 151 | 903 |
| පෞද්ගලික | 999 | 151 | 848 |
| මහ ආණ්ඩුව | 55 | - | 55 |
| ජංගම ගිණුම | 6,915 | 7,204 | -289 |
| ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම | 1,676 | 1,282 | 395 |
| අ. ප්‍රාග්ධන ගිණුම | 65 | 5 | 61 |
| ප්‍රාග්ධන සංක්‍රාම | 65 | 5 | 61 |
| මහ ආණ්ඩුව වෙනත් | 55 | - | 55 |
| වෙනත් අංශ(සංක්‍රමික සංක්‍රාම) | 10 | 5 | 5 |
| ආ. මූල්‍ය ගිණුම | 1,611 | 1,277 | 334 |
| පෞද්ගලික ආයෝජන | 1,124 | 988 | 136 |
| දිගුකාලීන ආයෝජන | 355 | 155 | 200 |
| සෘජු ආයෝජන | 150 | 13 | 137 |
| පෞද්ගලිකරණ ලැබීම | 56 | - | 56 |
| වෙනත් පෞද්ගලික දිගුකාලීන | 149 | 142 | 7 |
| කෙටි කාලීන | 768 | 832 | -64 |
| විවිධ ආයෝජන | 70 | 93 | -24 |
| වෙනත් පෞද්ගලික කෙටි කාලීන | 183 | 175 | 8 |
| වාණිජ බැංකු වත්කම් | 386 | 206 | 180 |
| වාණිජ බැංකු වගකීම් | 130 | 358 | -228 |
| මහ ආණ්ඩුව | 487 | 290 | 198 |
| දිගුකාලීන | 466 | 157 | 308 |
| වෙනත් දිගුකාලීන | 22 | 132 | -110 |
| කෙටි කාලීන | - | - | - |
| මූල්‍ය අංශය | 607 | 644 | -37 |
| රජය වත්කම් | 12 | 13 | -1 |
| රජය වගකීම් | - | - | - |
| මහ බැංකුව - වත්කම් | 302 | 257 | 46 |
| මහ බැංකුව - වගකීම් | 293 | 291 | 1 |
| ජා.මූ.අ. සමඟ ගණුදෙනු | - | 83 | -83 |
| විගැහි වෙන්කිරීම් | - | - | - |
| රුපියලේ අගය පිළිබඳ ගැලපීම්- | - | - | |
| මූල්‍ය රන් | - | - | - |
| වැරදීම් හා අත්හැරීම් | 0 | -69 | -69 |

### ලබාගෙන ආපසු ගෙවීමට ඉතිරිව ඇති විදේශීය ණය (අ)

| ශීර්ෂය | පැරණි 1998 | නව 1998 |
|---|---|---|
| 1. මුළු ණය | 9,615 | 8,753 |
| 1.1 රජය | 7,000 | 6,897 |
| 1.2 දිගුකාලීන | 1,119 | 1,002 |
| 1.3 කෙටිකාලීන | 1.129 | 487 |
| 1.4 ජ.මූ.අ. ලැබීම් | 367 | 367 |
| 2. මුළු ණය ද.ජා.නි. ප්‍රතිශතයක් ලෙස | 61.1 | 55.6 |

### විදේශීය ණය සේවා ගෙවීම් (අ)

| ශීර්ෂය | පැරණි 1998 | නව 1998 |
|---|---|---|
| 1. ණය සේවා ගෙවීම් | 811 | 754 |
| 1.1 ණය ආපසු ගෙවීම් | 492 | 467 |
| 1.2 පොලී ගෙවීම් | 319 | 288 |
| 2. ණය සේවා අනුපාතිකය | | |
| 2.1 සමස්ත අනුපාතිකය | 14.4 | 13.4 |

(අ) තාවකාලික

**විශේෂ සටහන 8 (සම්බන්ධයි)**

ශේෂයන් විදේශීය වත්කම් ලෙස ඇතුළත් කර ඇත. වගකීම්හි නේවාසිකයන්ගේ සියළු විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු ඉවත් කෙරෙන නමුත් වි.ව්‍ය.මු.බැ.ඒ. හා දේ.බැ.ඒ. දෙකොටසෙහිම සමහ ඇති අනේවාසිකයන්ගේ එවැනි තැන්පතු ඇතුළත් කර ඇත. නව ඉදිරිපත් කිරීම යටතේ වාණිජ බැංකුවල දළ විදේශීය වත්කම් හා දළ විදේශීය වගකීම් යන දෙකොටසම සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. දළ විදේශීය වත්කම් වැඩි වන්නේ වි.ව්‍ය.මු.බැ.ඒ. විසින් විදේශයන්හි දරණ ලද වත්කම් දේ.බැ.ඒ. විසින් විදේශයන්හි දරණ ලද වත්කම්වලට එකතු කිරීම නිසාය. වි.ව්‍ය.මු.බැ.ඒ.වල විදේශීය වගකීම් දේ.බැ.ඒ.වල විදේශීය වගකීම්වලට එකතු කර ඇත. කෙසේ නමුත් 1996 මහ බැංකු වාර්ෂික වාර්තාවේ විශේෂ සටහන් අංක 10 හි පැහැදිලි කර ඇති පරිදි නේවාසිකයන්ගේ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු දේශීය බැංකු ඒකකවල විදේශ ව්‍යවහාර මුදලින් වූ දේශීය වගකීම් ලෙස සලකන හෙයින් නව ඉදිරිපත් කිරීම යටතේ විදේශීය වගකීම්වල වැඩි වීම අඩුය.

- මූල්‍ය ගිණුමෙහි මෙම වෙනස්කම්වල ශුද්ධ ප්‍රතිඵලය වන්නේ නව අර්ථ නිරූපනය යටතේ 1998 වර්ෂයේදී ශුද්ධ මූල්‍ය ගැලීම්වල සැලකිය යුතු පහත වැටීමයි.

(ඇ) සමස්ථ ශේෂය : ගෙවුම් තුලන සංඛ්‍යාලේඛන සැකසීමේදී වි.ව්‍ය.මු.බැ.ඒ. නේවාසිකයන් ලෙස සැලකීම සමස්ථ ශේෂය කෙරෙහි බල නොපාන බව සටහන් කළ යුතුය.

(ඈ) විදේශීය ණය හා ණය සේවා ගෙවීම් : දේශීය ආයතනවලට වි.ව්‍ය.මු.බැ.ඒ. මඟින් දෙන ලද ණය දේශීය බැංකු ක්‍රමයේ වූ ණය ලෙස සැලකීම නිසා සමස්ථ විදේශීය ණය තොගය ද.දේ.නි. යෙන් සියයට 5 කින් පහත බසී. දේශීය ආයතන විසින් වි.ව්‍ය.මු.බැ.ඒ. මඟින් ලබා ගන්නා ලද ණය සඳහා පොලී ගෙවීම් නේවාසිකයින් අතර වූ ගණුදෙනුවක් ලෙස සැලකීම නිසා ණය සේවා අනුපාතය සියයට 1 කින් අඩු වේ. මෙයට අනුරූපව රජයේ සහ පෞද්ගලික අංශයේ බැංකු ක්‍රමයට ඇති දේශීය ණය වගකීම් හා දේශීය ණය සේවා ගෙවීම් ඉහළ යයි.

ජාත්‍යන්තර විනිමය වෙළෙඳපොළවල පැවති ඉහළ අවිනිශ්චිතතාවය හේතුකොටගෙන ප්‍රධාන ව්‍යවහාර මුදල්හි විනිමය අනුපාතිකයන් දැඩි ලෙස උච්චාවචනයන්වලට ලක් වීම අඛණ්ඩව පැවතිණ. මෙම තත්ත්වය සංවර්ධනය වෙමින් පවතින රටවල විනිමය අනුපාත කළමනාකරණය කෙරෙහි විශාල අභියෝගයක් වූ නමුත්, මෙරට ක්‍රියාත්මක වන නම්‍ය පාලන විනිමය අනුපාතික ක්‍රමය නිසා ශ්‍රී ලංකාවෙහි විදේශීය විනිමය වෙළෙඳපොළ සාපේක්ෂ වශයෙන් ස්ථාවර තත්ත්වයක පවත්වා ගැනීමට සමත් විය. ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට එරෙහිව වර්ෂය තුළදී සියයට 9.6 කින් අවප්‍රමාණය විය. නැගෙනහිර ආසියානු රටවල ව්‍යවහාර මුදල් විශාල වශයෙන් අවප්‍රමාණය වීම හේතුකොටගෙන, 1997 දී සිදු වූ අතිප්‍රමාණය සමහන් කරමින්, ව්‍යවහාර මුදල් වර්ග 24 ක පැසකින් සමන්විත වූ ශ්‍රී ලංකාවේ මූර්ථ සඵල විනිමය අනුපාතිකය 1998 දී සියයට 12 කින් අවප්‍රමාණය විය.

1998 දී ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 37 ක අතිරික්තයක් වාර්තා කළේය. 1998 වර්ෂය අවසානයේදී දළ නිල විදේශීය සංචිත එම වර්ෂය සඳහා ඇස්තමේන්තු කර ඇති මාස 4 ක ආනයන මූල්‍යනය කිරීම සඳහා ප්‍රමාණවත් විය. වාණිජ බැංකු සංචිත සහ නිල සංචිත ඇතුළත් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 2,907 ක් වූ දළ විදේශීය වත්කම් මාස 5.9 ආනයන මූල්‍යනය කිරීම සඳහා ප්‍රමාණවත් විය.

**9.2 සංඛ්‍යා සටහන**
**විදේශීය වෙළෙඳමෙහි ක්‍රියාකාරිත්වය**

| වර්ෂය | වර්ධන අනුපාතිකය (අ) | | ඒකක වටිනාකම(ආ) (1997 =100) | | අනුපාත | |
|---|---|---|---|---|---|---|
| | අපනයන | ආනයන | අපනයන | ආනයන | වෙළෙඳ අනුපාතිකය(ඇ) | අපනයන/ ආනයන |
| 1996 | 7.6 | 2.4 | 91.5 | 97.7 | 93.6 | 0.79 |
| 1997 | 13.3 | 7.6 | 100.0 | 100.0 | 100.0 | 0.79 |
| 1998(ඈ) | 2.1 | 0.5 | 111.6 | 97.8 | 114.2 | 0.80 |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) වර්ධන අනුපාතිකය එ.ජ.ඩොලර් ඒකකය මඟින් දී ඇත.
(ආ) වෙළඳ දර්ශකයන් ගණනය කිරීමේ රීතිය 1998 වසර සිට වෙනස් කරන ලදී. මෙම ක්‍රමයෙහි වෙනස්වීමේ වැඩි විස්තර සඳහා අංක 73 දරණ ඇමුණුම් සංඛ්‍යා සටහන හා අංක 9 දරණ විශේෂ සටහන බලන්න.
(ඇ) (අපනයන ඒකක වටිනාකම් දර්ශකය / ආනයන ඒකක වටිනාකම් දර්ශකය) x 100
(ඈ) තාවකාලිකයි.

## 9.2 අපනයන

1997 දී සියයට 13 ක්වූ අපනයන වර්ධනය හා සසඳ බැලීමේදී 1998 දී අපනයන වර්ධනය සියයට 2.1 ක් විය. 1998 මුල් භාගය තුළ අපනයන වර්ධනය සියයට 8 ක් වූ නමුත් දෙවන භාගය තුළ වර්ධනය අඩුවීම හේතුකොට සියයට 3 ක ඍණ වර්ධනයක් වාර්තා විය. මෙම තත්ත්වය, රෙදිපිළි හා ඇඟළුම් සහ තේ වල අඩු වර්ධන වේගයත්, ස්වාභාවික රබර් හා රබර් පදනම් කරගත් නිෂ්පාදන,

**9.3 සංඛ්‍යා සටහන**
**අපනයන සංයුතිය**

| කාණ්ඩය | එ.ජ.ඩොලර් දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1994 | 1995 | 1996 | 1997 | 1998(අ) | 1994 | 1995 | 1996 | 1997 | 1998 (අ) |
| 1. කෘෂිකාර්මික අපනයන | 702 | 829 | 961 | 1,060 | 1,088 | 34,692 | 42,478 | 53,206 | 62,667 | 70,225 |
| තේ | 424 | 481 | 615 | 719 | 780 | 20,964 | 24,638 | 34,067 | 42,533 | 50,280 |
| රබර් | 72 | 111 | 104 | 79 | 44 | 3,582 | 5,713 | 5,753 | 4,640 | 2,808 |
| පොල් | 76 | 103 | 110 | 117 | 94 | 3,761 | 5,270 | 6,091 | 6,939 | 6,110 |
| මද නිෂ්පාදන | 50 | 69 | 81 | 82 | 56 | 2,476 | 3,520 | 4,469 | 4,864 | 3,632 |
| වෙනත් | 26 | 34 | 29 | 35 | 38 | 1,285 | 1,750 | 1,622 | 2,075 | 2,478 |
| වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන | 129 | 134 | 132 | 145 | 170 | 6,385 | 6,857 | 7,295 | 8,555 | 11,027 |
| 2. කාර්මික අපනයන (ආ)(ඇ) | 2,399 | 2,870 | 3,006 | 3,436 | 3,544 | 118,544 | 147,094 | 166,543 | 203,114 | 229,437 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 86 | 98 | 95 | 91 | 118 | 4,262 | 5,040 | 5,272 | 5,354 | 7,586 |
| රෙදිපිළි හා ඇඟළුම් | 1,552 | 1,853 | 1,902 | 2,274 | 2,460 | 76,685 | 94,946 | 105,341 | 134,455 | 159,303 |
| ඛනිජ නිෂ්පාදන | 80 | 85 | 104 | 97 | 73 | 3,959 | 4,374 | 5,740 | 5,743 | 4,662 |
| රබර් නිෂ්පාදන | 102 | 153 | 169 | 178 | 178 | 5,026 | 7,851 | 9,357 | 10,513 | 11,528 |
| පිඟන් නිෂ්පාදන | 39 | 46 | 48 | 55 | 54 | 1,920 | 2,371 | 2,677 | 3,246 | 3,478 |
| සම් හා සපත්තු | 90 | 118 | 139 | 183 | 214 | 4,456 | 6,054 | 7,690 | 10,812 | 13,855 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 93 | 124 | 154 | 204 | 182 | 4,572 | 6,348 | 8,572 | 12,076 | 11,811 |
| දියමන්ති හා ස්වර්ණාභරණ | 170 | 196 | 192 | 142 | 68 | 8,419 | 10,023 | 10,643 | 8,384 | 4,421 |
| අනෙකුත් කාර්මික අපනයන | 187 | 197 | 202 | 212 | 197 | 9,245 | 10,087 | 11,251 | 12,531 | 12,793 |
| 3. ඛනිජ අපනයන | 87 | 87 | 96 | 90 | 60 | 4,292 | 4,447 | 5,292 | 5,271 | 3,863 |
| මැණික් | 79 | 78 | 86 | 84 | 56 | 3,917 | 3,972 | 4,771 | 4,899 | 3,577 |
| වෙනත් | 8 | 9 | 10 | 6 | 4 | 375 | 475 | 521 | 372 | 286 |
| 4. වර්ග නොකළ අපනයන (ඇ)(ඈ) | 21 | 21 | 32 | 53 | 43 | 1,026 | 1,073 | 1,760 | 3,141 | 2,803 |
| මුළු අපනයන | 3,209 | 3,807 | 4,095 | 4,639 | 4,735 | 158,554 | 195,092 | 226,801 | 274,193 | 306,328 |

(අ) තාවකාලිකයි
(ආ) ගලපන ලදී
(ඇ) සංශෝධිතයි
(ඈ) ප්‍රතිඅපනයන ඇතුලත් ය.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව
ශ්‍රී ලංකා මහ බැංකුව

පොල් නිෂ්පාදන, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණවල, සෘණ වර්ධනයේත් ප්‍රතිඵලයකි. ලෝක ඉල්ලුම අඩුවීමත්, නැගෙනහිර ආසියානු රටවලින් වැඩිවූ තරඟකාරීත්වයත් මේ අංශයන් කෙරෙහි බලපා ඇත. ප්‍රධාන අපනයන භාණ්ඩය වන රෙදිපිළි හා ඇඟළුම් අංශයෙහි 1997 අවසානයෙහි සිට වර්ධන වේගයේ ඇති වූ අඩුවීම 1998 ජූලි අවසාන වනවිට යථා තත්වයට පත්වීමක් පෙන්නුම් කළද ඉන් අනතුරුව නැවත පසුබෑමකට ලක්විය. 1998 ජූලි මාසය තෙක් ස්ථිරසාරව පැවැති තේ මිල ලෝක නිෂ්පාදනයෙහි පැවැති අතිරික්තයත් අගෝස්තු මාසයේදී ආරම්භ වූ රුසියානු අර්බුදයත් හේතුකරගෙන අවසාන කාර්තුවේදී පහත වැටුණි. රෙදිපිළි හා ඇඟළුම්, තේ, සුළු කෘෂිකාර්මික නිෂ්පාදන, ආහාරපාන හා දුම්කොළ හා ප්‍රවාහන උපකරණ ඉපයීම්වල වර්ධන වේගයෙහි අඩුවීමක් පෙන්නුම් කලද, ධන වර්ධනයක් පෙන්නුම් කළේය. මෙමගින් සමස්ත අපනයන වර්ධනය කෙරෙහි ඇතිවූ සතුටුදායක බලපෑම රබර්, පොල් නිෂ්පාදන, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණවල සෘණ වර්ධනයේ බලපෑම මගින් යටපත් විය.

## කාර්මික නිෂ්පාදන

රෙදිපිළි, ඇඟළුම් ප්‍රමුඛ කොටගත් කාර්මික අපනයනය, මුළු අපනයන ඉපයීම්වල ප්‍රධානතම දායකයාව මුළු අපනයන ඉපයීම් වලින් සියයට 75 කට දයක විය. මෙම අංශයෙහි වර්ධන වේගය 1997 දී පැවති සියයට 14 සමඟ සැසඳීමේදී 1998 දී සියයට 3 ක් විය. මෙම අංශයෙහි ප්‍රධානතම කාණ්ඩය වන රෙදිපිළි හා ඇඟළුම් සියයට 8 කින් වර්ධනය විය. කෙසේ නමුත් නිෂ්පාදන සඳහා පැවති ඉහළ මිල ගණන් සහ පහළ වැටුණු යෙදවුම් හේතුකොට මෙම අංශයෙහි ශුද්ධ විදේශ විනිමය ඉපයීම් පෙර වසරට වඩා සියයට 20 කින් වර්ධනය විය. රෙදිපිළි හා ඇඟළුම්වල ඒකක මිල සියයට 5 කින් වැඩිවූ අතර ප්‍රමාණය සියයට 3 කින් වැඩිවිය. මෙය 1997 දී මෙම වර්ධනය පිළිවෙලින් සියයට 8 කින් හා සියයට 11 ක් වශයෙන් පැවතුනි. මාසික පරිමා දර්ශක අනුව ඇඟළුම් අපනයනයෙහි කාලීන උච්චාවචනයන් පැහැදිලිව දක්නට ලැබේ. එක්සත් ජනපදය හා යුරෝපා වෙළෙඳපොළෙහි ශීත හා ග්‍රීෂ්ම සෘතුවට පෙර ඉහළ අපනයන ප්‍රමාණයක් දක්නට ලැබේ. රෙදිපිළි හා ඇඟළුම් අපනයන වලින් සියයට 90 කට වැඩි ප්‍රමාණයක් ආයෝජන මණ්ඩලයට අයත් සමාගම් මගින් සිදු කරන ලදී. 1997 හි වර්ධනය වූ සියයට 18 හා සැසඳීමේදී ආයෝජන මණ්ඩලයට අයත් ව්‍යාපාර මගින් වූ අපනයන ඉපයීම් සියයට 10 කින් වර්ධනය විය. ආයෝජන මණ්ඩලයට අයත් නොවන ව්‍යාපාරයන්හි අපනයන ඉපයීම් 1997 දී සියයට 34 කින් වැඩි වූ අතර එය මෙම වසර තුළ සියයට 4 කින් අඩු වූයේ වෙළෙඳපොළෙහි පහළ අන්තය කරා භාණ්ඩ නිෂ්පාදනය

විශේෂ සටහන 9

# මාසික වෙළෙඳ දර්ශක

මාසික වෙළෙඳ දර්ශක ආර්ථිකයේ වෙනස්වීම් පිළිබඳ ප්‍රයෝජනවත් තොරතුරු සපයන අතරම ආර්ථිකය පිළිබඳ තීරණ ගැනීමේ දී හා අනිකුත් පර්යේෂණ හා ප්‍රතිපත්තිමය අධ්‍යයනයන්හි වැදගත් යෙදවුමක් ලෙසද ක්‍රියා කරයි. අන්තර්ජාතික වෙළෙඳමේ කාලානුරූප වෙනස්කම් වටහා ගැනීමටද, වාර්ෂිකව පමණක් ජාතික ආදයම් ඇස්තමේන්තු සිදුකරනු වෙනුවට නිරතුරුව ජාතික ආදයම ඇස්තමේන්තු කිරීම පිණිස භාවිතා කිරීමටද වෙළඳ අනුපාතය මගින් මාසික උද්ධමනයට ඇති කරන බලපෑම තේරුම් ගැනීමටද මාසික වෙළෙඳ දර්ශක උපකාරී වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව 1953 දී ප්‍රථම වරට සිය ප්‍රකාශනයන්හි වෙළෙඳ දර්ශක හඳුන්වා දුන් අතර මෙම දර්ශක 1969 දක්වා අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන ලදී. මාසික හා වාර්ෂික යන පදනම් දෙකම මත මෙම දර්ශක ඉදිරිපත් කළ අතර ඒවා ශ්‍රී ලංකා මහ බැංකුවේ මාසික විවරණිකාවන් හා වාර්ෂික වාර්තාවන් මගින් ප්‍රකාශයට පත් කෙරිණ. 1969 දී එතෙක් සම්මත ජාත්‍යන්තර තිරුබදු වර්ගීකරණය (Standard International Trade Clasification) යටතේ පැවති අපනයන හා ආනයන වර්ගීකරණය බ්‍රසල්ස් තිරුබදු නාමාවලිය (Brussels Tariff Nomenclature(BTN)) යටතට ගෙන එන ලදී.[1] මෙය ශ්‍රී ලංකා රේගුව මගින් ආනයන හා අපනයන පිළිබඳ විස්තරාත්මක දත්ත මාසික පදනමක් මත නිකුත් කිරීම ප්‍රමාද වීමට හේතු වූ අතර, එබැවින් මාසික වෙළෙඳ දර්ශක ප්‍රකාශයට පත්කිරීම නවත්වන ලදී.[2] 1969 සිට වාර්ෂික වෙළෙඳ දර්ශක පමණක් ප්‍රකාශයට පත් කරන ලදී.

මාසික වෙළෙඳ දර්ශකවල ප්‍රයෝජනවත් බව සැලකිල්ලට ගෙන, ශ්‍රී ලංකා මහ බැංකුව 1997 දී මාසික වෙළෙඳ දර්ශක ගණනය කිරීම ආරම්භ කරන ලදී. විශාල ප්‍රමාණයක මාසික දත්ත පමාවකින් තොරව සකස් කිරීමට ශ්‍රී ලංකා රේගුවට හැකියාව ලබාදුන් සන්නිවේදන තාක්ෂණයේ නව සොයා ගැනීම් මෙම උත්සාහය පහසු කළේය. මාසික වෙළෙඳ දර්ශක 1996 ජනවාරි සිට 1998 දෙසැම්බර් දක්වා ගණනය කර ඇති අතර මෙම වාර්තාවේ සංඛ්‍යා සටහන් පරිශිෂ්ට අංක 73,74 හා 75 හි දක්වා ඇත.[3]

## දර්ශක මගින් ආවරණය වන ප්‍රමාණය

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාසික වෙළෙඳ දර්ශක මාලාව, ආනයනය හා අපනයනය යන දෙකම සඳහා වූ වටිනාකම, ප්‍රමාණය හා ඒකක වටිනාකම යනාදී වශයෙන් වූ දර්ශක 6 කින් සමන්විත වේ. 1997 අවසානය වනවිට, සංයෝජිත වර්ගීකරණ අංක ක්‍රමය (Harmonized Commodity Description and Coding System(H.S)) යටතේ වර්ගීකරණය කර තිබූ අංක 8 ක මට්ටමෙහි වූ අපනයන හා ආනයන භාණ්ඩ සංඛ්‍යාව පිළිවෙලින් 5,229 හා 8,624 ක් විය. අපනයන භාණ්ඩ කෘෂිකාර්මික, කාර්මික හා ඛනිජ ද්‍රව්‍ය වශයෙන් ප්‍රධාන කාණ්ඩයන් 3 කට බෙදු ඇත. මෙම ප්‍රධාන කාණ්ඩයන් 3 තවදුරටත් උප ප්‍රධාන කාණ්ඩ 16 කටත් උප-උප කාණ්ඩ 70 කටත් බෙදන ලදී. ආනයන භාණ්ඩ, පාරිභෝගික, අන්තර් හා ආයෝජන වශයෙන් කාණ්ඩ 3 කට බෙදු ඇත. මෙම ප්‍රධාන කාණ්ඩ 3 තවදුරටත් උප ප්‍රධාන කාණ්ඩ 18 කටත්, උප-උප කාණ්ඩ 16 කටත් බෙදු ඇත. ප්‍රධාන කාණ්ඩ හා සමහරක් වැදගත් උප කාණ්ඩයන්ගේ දර්ශක පමණක් මෙම වාර්තාවේ ප්‍රකාශයට පත්කර ඇත.

1997 අපනයන හා ආනයන වටිනාකම් වලින් මෙම උප කාණ්ඩ හා උප-උප කාණ්ඩ දනට පිළිවෙලින් සියයට 97 හා සියයට 68 ආවරණය කරයි. අවශ්‍ය වුවහොත් සෑම අවුරුදු 3 කටම වරක් පදනම් වර්ෂය හා දර්ශක වලින් ආවරණය වන ප්‍රමාණය විමර්ශනය හා ප්‍රතිශෝධනය කරනු ඇත. ආනයනවල ආවරණය වන ප්‍රමාණය අනාගතයේදී පුළුල් කිරීමටද බලාපොරොත්තු වේ.

## දර්ශක ගණනය කිරීම

1997 සාමාන්‍ය මාසික වටිනාකමේ එක් එක් කාණ්ඩයට අයත් වටිනාකම් හා ප්‍රමාණයන්, මාසික දර්ශක ගණනයේදී පදනම් අගයන් ලෙස ගනු ලැබූ අතර, 1997 සාමාන්‍ය මාසික වටිනාකම් කොටස් බර තැබීම සඳහා යොද ගන්නා ලදී.[4] පදනම් වර්ෂයේ භාවිතා කළ අපනයන හා ආනයන රේගු සටහන් සංඛ්‍යාව පිළිවෙලින් 204,382 හා 279,592 ක් වේ.

1 1989 දී රේගු වර්ගීකරණය බ්‍රසල්ස් තිරුබදු නාමාවලියේ සිට සංයෝජිත වර්ගීකරණ අංක ක්‍රමය යටතට ගෙන එන ලදී.

2 1969 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ සංඛ්‍යා පරිශිෂ්ටයේ අංක 49 වගුවේ සටහන් අංක 2 හි විස්තර කර ඇති පරිදි

3 ආනයන හා අපනයන ඒකක වාර්තා කරන ක්‍රමය රේගුව මගින් 1995 ට පසුව වෙනස් කරන ලදී. මෙම වෙනස හේතුවෙන් පරිමා දර්ශක ගණනය කිරීමේදී ඇතිවිය හැකි සංකූලතාවයන් වැළැක්වීම සඳහා පැරණි දර්ශක ගණනය කිරීම 1996 ට පමණක් සීමා කරන ලදී.

4 1996 වර්ෂය පදනම් වර්ෂය වශයෙන් භාවිතා නොකරන ලදී. එම වර්ෂය තුළ පැවති දිගුකාලීන නියගය හේතුකොටගෙන වෙළෙඳ රටාවේ (විශේෂයෙන්ම අපනයනයන්ගේ) අසාමාන්‍යතාවයන් පැවතීම හේතුකොටගෙනය.

සෑම කාණ්ඩයකම, වටිනාකම් දර්ශකය සරල දර්ශකයක් ලෙස පවත්නා මාසය හා පදනම් කාලය අතර අනුපාතයක් ලෙස ගණනය කර ඇත. මෙම දර්ශකය

$$\frac{\Sigma_i \; P_{it} \; Q_{it}}{\Sigma_i \; P_{io} \; Q_{io}}$$

ලෙස නිර්වචනය කර ඇති අතර, $P_{it}$ හා $Q_{it}$ පිළිවෙලින් $i$ භාණ්ඩයේ $t$ කාලයේ පැවති මිල හා ප්‍රමාණය වන අතර, $P_{io}$ හා $Q_{io}$ $i$ භාණ්ඩය සඳහා පදනම් වර්ෂයේ පැවති මිල හා ප්‍රමාණය වේ.

ප්‍රමාණ දර්ශකය ලැස්පියර් දර්ශකයක් ලෙස ගණනය කර ඇත. බර තැබීම් (පදනම් කාලයේ වටිනාකම් කොටස්), පවත්නා මාසය හා පදනම් කාලය අතර ප්‍රමාණයන්ගේ අනුපාතයෙන් ගුණ කරනු ලැබේ. එනම් උප කාණ්ඩයන්ගේ ප්‍රමාණ දර්ශකය, උප-උප කාණ්ඩයන්ගේ ප්‍රමාණ දර්ශකයන්ගේ හරිත සාමාන්‍ය යයි. ප්‍රධාන කාණ්ඩයන්ගේ ප්‍රමාණ දර්ශකය උප ප්‍රධාන කාණ්ඩයන්ගේ හරිත සාමාන්‍ය යයි. ප්‍රමාණ දර්ශකය


$$\Sigma_i \, \omega_i \, \frac{Q_{it}}{Q_{io}} = \Sigma_i \left( \frac{P_{io} \; Q_{io}}{\Sigma_i \; P_{io} \; Q_{io}} \right) \cdot \frac{Q_{it}}{Q_{io}}$$

ලෙස නිර්වචනය කර ඇත. පදනම් වර්ෂයේ වටිනාකම් කොටස් $\omega_i$ වේ. මෙය ලැස්පියර් දර්ශකයක් ලෙස සරල කොට පහත දක්වා ඇත.


$$\frac{\Sigma_i \; P_{io} \; Q_{it}}{\Sigma_i \; P_{io} \; Q_{io}}$$

සම ජාතීය භාණ්ඩ සහිත කාණ්ඩ සඳහා දර්ශක ගණනය කිරිමේදී, අදළ මාසයෙහි ප්‍රමාණය, අදළ පදනම් ප්‍රමාණයන්ගෙන් බෙදනු ලැබේ. සමජාතීය නොවන භාණ්ඩ සහිත කාණ්ඩයන් සඳහා ප්‍රමාණ දර්ශක ගණනය කිරීමේදී ගැටළු මතුවේ. එවැනි කාණ්ඩ සඳහා දර්ශක ගණනය කරනු ලබන්නේ, කාණ්ඩයේ ඇති එක් එක් භාණ්ඩයේ හරිත සාමාන්‍යයන් වශයෙනි. කෙසේ වුවද, සැලකියුතු මිල විචලනයන් සහිත වූ භාණ්ඩ සංඛ්‍යාව ඉතා විශාල කාණ්ඩයන්ගේ ප්‍රමාණ දර්ශක, එම කාණ්ඩයන්ගෙන් තෝරාගත් භාණ්ඩ සාම්පලයක් මත පදනම් වේ. එම භාණ්ඩ සාම්පලය තෝරා ගැනීමේදී අදළ කාණ්ඩය තුළ එම භාණ්ඩයේ වටිනාකම් කොටස මෙන්ම එම භාණ්ඩ පැහැදිලිව හඳුනා ගැනීමට ඇති හැකියාවද සැලකිල්ලට ගන්නා ලදී. එම තෝරාගත්

1 රූප සටහන
මාසික අපනයන දර්ශකයන්




2 රූප සටහන
මාසික ආනයන දර්ශකයන්




භාණ්ඩයන්ගේ මාසික ප්‍රමාණ දර්ශක ඒවායේ වටිනාකම් කොටසින් බර තැබීමෙන් එම එක් එක් කාණ්ඩය සඳහා ප්‍රමාණ දර්ශක ගණනය කරයි.

වටිනාකම් දර්ශකය ප්‍රමාණ දර්ශකයෙන් බෙදීමෙන් ඒකක වටිනාකම් දර්ශකය පාෂේ ( Paassche) දර්ශකයක් ලෙස ගණනය කරනු ලැබේ.[5]

කාර්තු හා වාර්ෂික දර්ශකයන්ද මෙම පදනම මතම ගණනය කරනු ලැබේ.

## දර්ශක යොදගැනීමෙන් දක්නට ලැබුණු ප්‍රධාන ප්‍රවනතාවයන්

ඇහළුම් අපනයන පරිමාවේ වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන රූපසටහන් 1 හි දක්වා ඇති පරිදි මාසික අපනයන වටිනාකම් දර්ශක පැහැදිලි

කාලානුරූප වැඩිවීමක් උෂ්ණ සහ ශීත ඍතුවලදී පිළිබිඹු කරයි. ආහාර හා අනිකුත් පාරිභෝගික භාණ්ඩ අපනයනයන්ගේ වැඩිවීම් ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන, රූප සටහන් 2 හි දක්වා ඇති ආකාරයට මාසික ආනයන වටිනාකම් දර්ශක අප්‍රේල් හා දෙසැම්බර් උත්සව සමයන්ට පෙරාතුව වැඩිවීම් පෙන්නුම් කරයි. 1996 ඔක්තෝබර් මස ආනයන පරිමාවේ දක්නට ලැබෙන වැඩිවීම සහල් සඳහා ආනයන බදු සම්පූර්ණයෙන්ම ඉවත් කළ කාලයේ විශාල සහල් තොගයක් ආනයනය කිරීම පිළිබිඹු කරයි.[6] 1998 මැයිවලදී දක්නට ලැබුණු 2 වන ආනයන පරිමාව වැඩිවීම තුළින් ආනයන ඒකක වටිනාකමේ විශාල පහළ යාමකට තුඩුදුන්, යන්ත්‍රසූත්‍ර කොටස් විශාල සංඛ්‍යාවක් ආනයනය කිරීම පෙන්නුම් කරයි. මෙම රූප සටහන් දෙකෙහි දක්වා ඇති පරිදි, අපනයන හා ආනයන වටිනාකම් දර්ශක දෙකම පරිමා දර්ශක හා ආසන්නව විචලනය වන අතර, ඒකක වටිනාකම් දර්ශක සැලකියයුතු ලෙස විචලනය නොවේ.

5 ඒකක වටිනාකම් දර්ශකය වටිනාකම් දර්ශකය හා ප්‍රමාණ දර්ශකය අතර අනුපාතයක් ලෙස ගණනය කර ඇති අතර පහත දක්වෙන සූත්‍රයෙන් දක්වා ඇති පාෂේ (Paasche) දර්ශකය මගින් පෙන්නුම් කරයි.

$$\frac{\sum_i P_{it} Q_{it}}{\sum_i P_{io} Q_{it}}$$


6 සහල් සඳහා වූ තීරුබදු අත්හැරීම පළමුව මාස 6 ක කාලයක් සඳහා 15.4.96 සිට 15.10.96 දක්වා ප්‍රදානය කළ අතර, තවත් මාස 2 ක් සඳහා පසුව දීර්ඝ කරන ලදී.

කරනු ලබන කුඩා ප්‍රමාණ අපනයනකරුවන්ගේ නිෂ්පාදනය කෙරෙහි ආසියාතු මූල්‍ය අර්බුදයෙහි බලපෑම තරමක්දුරට පිළිබිඹු කරමිනි. මෙම උප කාණ්ඩය තුළ ඇඟළුම් අපනයනය සියයට 90 ට දයක වෙමින් සියයට 7 කින් වර්ධනය වූ අතර රෙදිපිළි සියයට 11 කින් වර්ධනය විය. රෙදිපිළි, ඇඟළුම් කර්මාන්තය සඳහා භාවිතා කරන සියළුම අන්තර් හා ප්‍රාග්ධන භාණ්ඩ තීරුබදු වලින් නිදහස් කරමින් 1998 අයවැය මගින් හඳුන්වා දෙන ලද දිරිගැන්වීම් සමූහයෙහි ප්‍රතිලාභ මෙම අංශය විසින් භුක්ති විඳිනු ලැබීය. 1998 දීද කාර්මික අපනයනයන්ගෙන් සියයට 69 කට දයක වූ රෙදිපිළි හා ඇඟළුම් ප්‍රධාන අපනයන උප කාණ්ඩය බවට පත්විය.

සම් හා පාවහන් කාණ්ඩය තුළ ප්‍රධාන වශයෙන් එක්සත් ජනපදයෙන් ගමන් මලු හා අත්බෑග් සඳහා ඉල්ලුම ඉහළයෑම හේතුකොට ගමන් මලු අපනයනය සියයට 40 කින් වැඩිවිය. ක්‍රීඩා භාණ්ඩ හා සාමාන්‍ය පාවැසුම්වල අපනයන අඩුවීම හේතුකොට පාවැසුම් අපනයනය සියයට 7 කින් අඩුවිය. සේවක වැඩවර්ජන හේතුකොට ප්‍රධාන නිෂ්පාදන ආයතනයක ඵලදයිකත්වය පහළයෑම නිසාත් චීනය, දකුණු සහ ආසියාතු රටවල් සමග තරඟ කිරීමේ හැකියාව තවදුරටත් අඩුවීම නිසාත් මේ අංශය පසුබෑමකට ලක්විය. අමෙරිකා එක්සත් ජනපදය හා එක්සත් රාජධානිය යන වෙළෙඳපොළවලට ක්‍රීඩා භාණ්ඩ අපනයනය පහළයෑම නිසා සම් වලින් නිමකළ වෙනත් භාණ්ඩ අපනයනය සියයට 28 කින් අඩුවිය.


යන්ත්‍රසූත්‍ර, යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණ අපනයනයෙන් ලද ඉපයීම් සියයට 11 කින් අඩුවිය. මෙයට හේතු වූයේ ඉවතලන ලෝහ මිශ්‍රිතයන් පරණ වානේ, විදුලිමය උපකරණ හා වදන් සැකසුම් හා දත්ත සැකසුම් වැනි කාර්යාලීය විද්‍යුත් උපකරණ කොටස් අපනයනය පහළ යෑමය. එසේ වුවද, අවසාන වර්ෂ පහ තුළ මෙම කාණ්ඩයෙහි අපනයන ඉපයීම් දෙගුණයක් වූ අතර මුළු කාර්මික අපනයන ඉපයීම්වලට ඇති දයකත්වය සියයට 5 දක්වා වැඩිවිය.

**9.3 රූප සටහන**
**ප්‍රධාන කාණ්ඩ අනුව අපනයන වටිනාකම**



මුළු කාර්මික අපනයනයන්ගෙන් සියයට 5 ක් පමණ වූ රබර් පදනම් කරගත් නිෂ්පාදන භාණ්ඩ 1998 වසරේදී නොවෙනස්ව පැවැතිණි. මෙයට හේතුවූයේ 1997 වසර තුළ රබර් පදනම් කරගත් කර්මාන්ත වලින් සියයට 22 ක්වූ ශල්‍යකර්ම සඳහා භාවිතා කරන අත්වැසුම් නිෂ්පාදනය සියයට 12 කින් අඩුවීමය. මෙයට හේතුවූයේ එක්තරා සමාගමක් විසින් නිෂ්පාදනය කරනු ලබන වෛද්‍ය පරීක්ෂණ සඳහා යොදා ගනු ලබන අත්වැසුම් තාක්ෂණයෙහි වෙනසක් සිදුකිරීම නිසා ඒවායේ නිෂ්පාදන ක්‍රියාවලියට තාවකාලිකව බාධා පැමිණීමය. 1998 නොවැම්බර් මාසය තුළ අළුත් යන්ත්‍රසූත්‍ර භාවිතා වීමත් සමග වෛද්‍ය පරීක්ෂණ සඳහා යොදගනු ලබන අත්වැසුම් නිෂ්පාදනය නැවතත් ආරම්භ විය. කෙසේ නමුත් රබර් මත පදනම් වූ වෙනත් නිෂ්පාදනයන් සියයට 13 කින් වැඩිවූ අතර රබර් ටයර් හා ටියුබ්, ශල්‍ය නොවන අත්වැසුම් බිම් ආවරණ හා කළාල, රබර් පටි හා වෙනත් රබර් නිෂ්පාදනවල ඉහළ ඉපයීම් මෙයට හේතුවිය. ටයර් කර්මාන්තයෙහි නිෂ්පාදන ධාරිතාව වැඩිවීම හා ප්‍රධාන රබර් ටයර් නිෂ්පාදන ආයතනයක් මාස නවයක කාලයකට පසු නැවැත 1997 දෙසැම්බර් මාසයේදී නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම ටයර් අපනයනය අංශයෙහි සතුටුදායක වර්ධනයට හේතුවිය.

**9.4 රූප සටහන**
**ප්‍රධාන කාණ්ඩ අනුව කාර්මික අපනයන වටිනාකම**




ආහාර පාන හා දුම්කොළ උපකාණ්ඩයෙහි අපනයන ඉපයීම් සියයට 30 කින් වැඩිවිය. මෙම උපකාණ්ඩය තුළ සියයට 67 කින් දායක වූ කවවයන් සහ මෘද්වංශීහුන්ගෙන් ලද අපනයන ඉපයීම් සියයට 55 කින් වැඩිවීම මෙයට හේතුවිය. මෙම කර්මාන්තය ඉස්සන් බෝ කරන ප්‍රදේශවල පැතිර ගිය සුදු පුල්ලි රෝගයෙන් අනතුරුව 1997 අවසාන කාර්තුවෙහි සිට නැවැතත් යථා තත්ත්වයට පත්විය. ඉස්සන් බෝ කරන ගොවීන්ට සහනයක් වශයෙන් 1996 අගෝස්තු මාසයේ සිට බලපවත්වන පරිදි අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා ඉස්සන් සඳහා ආහාර ආනයන තීරුබද්දෙන් නිදහස් කරන ලදී. 1998 අවසාන කාර්තුවේදී ඉස්සන් හා පොකිරිස්සන් අපනයනය තියුණු ලෙස අඩුවීම හේතුකොට මෙම උපකාණ්ඩයෙහි වර්ධනය තරමක් දුරට මන්දගාමී විය. ඉස්සන් බෝකරන ගොවිපලවල ඇතිවූ හිස කහවීමේ රෝගය හේතුකරගෙන 1998 අගෝස්තු මාසයෙහි ඉස්සන් බෝකරන ඇතැම් ගොවිපලවල ඉස්සන් වගාව තාවකාලිකව නතර කරන ලදී.

1998 වසරේදී ඛනිජතෙල් නිෂ්පාදන අපනයනය සියයට 25 කින් අඩුවිය. මෙයට ප්‍රධාන හේතුව වූයේ තාපබලාගාර මධ්‍යස්ථානවල ඉන්ධන තෙල් භාවිතය වැඩිවීම නිසා දේශීය පරිභෝජනය වැඩිවීමය. ඛනිජතෙල් නිෂ්පාදන අපනයන ප්‍රමාණය සියයට 12 කින් අඩු වුවද, මුළු වර්ෂය පුරාම තෙල්වල ජාත්‍යන්තර මිල පහළ මට්ටමකට පැවැතීම හේතුකොට මිල ගණන් සියයට 15 කින් අඩුවිය.

ඉල්ලුම අඩුවීම හේතුකරගෙන දියමන්ති (සියයට 54) හා ස්වර්ණාභරණ (සියයට 41) අපනයනය සැලකියයුතු අන්දමින් පහත වැටුණි. මුළු දියමන්ති අපනයනයෙන් සියයට 89 කට දායක වන බෙල්ජියම, ජපානය, තායිලන්තය වැනි රටවල ඉල්ලුම අඩුවීම හේතුකොට දියමන්ති අපනයනය නොකඩවා පහත වැටුණි. ආර්ථික පසුබෑමකට ලක් වූ ජපානය හා නැගෙනහිර ආසියාතු වෙළෙඳපොළවල ඉල්ලුම අඩුවීම හේතුකොට දියමන්ති සඳහා ශ්‍රී ලංකාවෙහි ප්‍රධාන වෙළෙඳපොළ වන බෙල්ජියමට කරන ලද අපනයනය සියයට 58 කින් අඩුවිය. වෙළෙඳපොළෙහි පවත්නා අවිනිශ්චිත භාවය නිසා ප්‍රධාන දියමන්ති මධ්‍යස්ථානය වන බෙල්ජියම සාමාන්‍ය තත්ත්වයට වඩා අඩු දියමන්ති ප්‍රමාණයක් මිලදී ගත් අතර තොග ප්‍රමාණයද අඩුවෙන් පවත්වාගෙන යන ලදී. ඉතා උසස් වර්ගයේ නිෂ්පාදනයන් මිලදී ගනු ලබන ජපන් වෙළෙඳපොළ අහිමිවීම අපනයනකරුවන් කෙරෙහි ඉතා අහිතකර අන්දමින් බලපෑවේය. රටෙහි ප්‍රධාන දියමන්ති නිෂ්පාදකයන්ට සිය සාමාන්‍ය නිෂ්පාදන ප්‍රමාණය පවත්වා

ගැනීමට නොහැකි තත්ත්වයක් උදාවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් සිය නිෂ්පාදනය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුකර ගැනීමට සිදුවිය. මෙම වෙළෙඳපොළෙහි ඇතිවිය හැකිව පැවති වර්ධනය පිරිහීමට ලක් වූ මැණික් හා ස්වර්ණාභරණ නිෂ්පාදනය මගින් යටපත් කෙරිණි. නැගෙනහිර ආසියානු අර්බුදය නිසා සිංගප්පූරුව, ජපානය හා හොංකොංවල වෙළෙඳපොළ අභිමිවීම හේතුකරගෙන, ස්වර්ණාභරණ වෙළෙඳපොළද මෙලෙසින්ම පීඩාවට පත්විය. ස්වර්ණාභරණ කර්මාන්තයට අතදීම පෙරදැරිකර ගෙන මැණික් හා රත්‍රං ආනයනය තීරුබදු වලින් නිදහස් කළ අතර 1997 නොවැම්බර් සිට මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ආරක්ෂක බද්දෙන් ද, 1998 අගෝස්තු මස 24 දින සිට ආදායම් බද්දෙන්ද නිදහස් කරන ලදී.

අනෙකුත් අපනයන නිෂ්පාදනයන් අතර රසායනික නිෂ්පාදන සියයට 11 කින් වැඩි විය. නැගෙනහිර ආසියානු රටවලින් ඇතිවූ තරඟකාරීත්වය හේතුකොට පිඟන් භාණ්ඩ, බිම් හා බිත්ති ආවරණ කරන පිඟන් ගඩොල්, පිඟන් මැටිවලින් සෑදූ පිළිම, විසිතුරු භාණ්ඩ, ප්ලාස්ටික් භාණ්ඩවලින් ලත් අපනයන ඉපයීම් 1998 දී පහළ මට්ටමක පැවැතිණි.

වෙළෙඳපොළෙහි පහළ අන්තය කරා භාණ්ඩ නිපදවන අංශයන් බෙහෙවින් බලපෑමට ලක්වූ බව ප්‍රත්‍යක්ෂ කරුණකි. උසස් නිෂ්පාදනයන් හා විශේෂ මෝස්තර අනුව විශේෂිත වෙළෙඳපොළ සඳහා සපයන භාණ්ඩ නිෂ්පාදනය කෙරෙහි දැඩි බලපෑමක් ඇති නොවීය. වර්තමාන තරඟකාරී ලෝකයෙහි මෙම කර්මාන්තයෙහි රැඳියාව පවත්වාගනු සඳහා නිෂ්පාදනයන් වැඩිදියුණු කිරීමට නම් උසස් තත්ත්වයේ නිෂ්පාදන, මෝස්තරයන් හා නව පන්නයන් ඉක්මනින් වෙනස් කළහැකි ලෙස නවීනතම හා කාර්යක්ෂම තාක්ෂණය පදනම්කරගැනීමත් සුදුසුකම් ලත් සැලසුම්කරුවන් හා පුහුණු ශ්‍රමය ලබාගැනීමත් අත්‍යවශ්‍ය වනු ඇත.

## වැවිලි බෝග

රබර් හා පොල් අපනයනයෙහි සෘණ වර්ධනය තේ අපනයන ඉපයීම් මගින් සමහන් වීම හේතුකොට වැවිලි බෝග අපනයනයෙන් ලද ඉපයීම් පෙර වසරෙහි පැවති මට්ටමෙහිම පවත්වාගත හැකිවිය. තේ නිෂ්පාදන ප්‍රමාණය සියයට 1 ක වැඩිවීමක් පිළිබිඹු කරමින් වාර්තාගත ඉහළම තේ නිෂ්පාදනය වූ කිලෝග්‍රෑම් දශ ලක්ෂ 280 ක් වූ අතර තේ අපනයන ප්‍රමාණය කිලෝග්‍රෑම් දශ ලක්ෂ 272 ක්ව සියයට 1 කින් වැඩිවිය. මේ අතර 1998 දී තේ මිල කිලෝග්‍රෑමයක් එක්සත් ජනපද ඩොලර් 2.87 ක්ව සියයට 7 කින් වැඩිවිය. වර්ෂයේ මුල් මාස පහ තුළ තේ මිල ශක්තිමත්ව පැවැති අතර ඉන් අනතුරුව 1998 අගෝස්තු මාසය දක්වා මඳ වේගයකින් වර්ධනය විය. ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් වලින් (ස්වා.පො.ම.) නොකඩවා පැවැති අධික ඉල්ලුමත් තේ වල ගුණාත්මක භාවය වර්ධනය වීමත්, කෙන්යාව හා ඉන්දියාවෙහි වෙන්දේසි මධ්‍යස්ථානවල සැපයුම අඩුවීමත් තේ වල ඇතිවූ මෙම වර්ධනයට හේතු සාධක විය. අගෝස්තු මාසය මැද සිට ආරම්භ වූ රුසියාවෙහි මූල්‍ය අර්බුදයත්, තේ නිපදවන රටවල ඇතිවූ නිෂ්පාදන අතිරික්තයත් හේතුකොට 1998 අගෝස්තු මස සිට තේ මිල පහත වැටිණි. 1998 අගෝස්තු මාසයේදී රුසියානු රූබලය සියයට 70 කින් අවප්‍රමාණය වීම නිසා රුසියාව ශ්‍රී ලංකාවෙහි ප්‍රධාන තේ ගැණුම්කරු වීම හේතුකොට 1998 ජූලි සිට තේ අපනයනයෙන් ලත් ඉපයීම් පහත වැටුණි. මේ හේතුවෙන් 1998 තේ වල සමුච්චිත වර්ධන වේගය සියයට 8 දක්වා පහත වැටුණි. 1998 මුල් භාගය තුළ තේ අපනයන ඉපයීම් සියයට 33 කින් වැඩිවිය.

ශ්‍රී ලංකාවේ තේ අපනයන සංයුතිය සලකා බලන කල සියයට 58 කට වැඩි ප්‍රමාණයක් තොග වශයෙන් පවතින අතර සියයට 34 ක් පැකට්වලින් සමන්විත වේ. තේ මලු ලෙසද, විදේශීය තේ හා මිශ්‍රණය කිරීමෙන්ද ක්ෂණික හා හරිත තේ වශයෙන්ද සකසන වැඩි එකතුකල වටිනාකමකින් යුතු තේ, මුළු තේ ප්‍රමාණයෙන් සියයට 8 කට අඩු ප්‍රමාණයක් වන අතිරික්තය සමන්විත වේ. ශ්‍රී ලංකාව තේ කිලෝග්‍රෑම් දශ ලක්ෂ 4.3 ක් ආනයනය කර ඇති අතර මෙය 1998 දේශීය තේ නිෂ්පාදනයෙන් සියයට 2 කට වඩා අඩු ප්‍රමාණයකි ශ්‍රී ලංකාවෙහි තේ අපනයනයෙන් සියයට 16 ක ප්‍රමාණයකට දායක වෙමින් පෙර වසරෙහි මෙන් රුසියාව ප්‍රධාන ගැණුම්කරුවා විය. එක්සත් අරාබි එමීර් රාජ්‍ය දෙවන ප්‍රධාන ගැණුම්කරු (සියයට 12) වූ අතර සියයට 11 ක ට දායක වෙමින් තුර්කිය තෙවන ප්‍රධාන ගැණුම්කරුවා විය. අනෙකුත් ප්‍රධාන ගැණුම්කරුවන් වූයේ සිරියාව (සියයට 6), ලිබියාව (සියයට 5) හා සවුදි අරාබියාවය (සියයට 4).

රබර් වලින් ලත් ඉපයීම් සැලකියයුතු අන්දමින් පහත වැටුණි (සියයට 45). අපනයන ප්‍රමාණය (සියයට 33) හා මිල (සියයට 18) පහත වැටීම මෙම අඩුවීමට හේතුවිය. 1998 වසරේදී සෝල් ක්‍රේප් හැර මුළු අපනයනයෙන් සියයට 50 ක් වූ ලේටෙක්ස් ක්‍රේප් හා අනෙකුත් ක්‍රේප් වර්ග වල සාමාන්‍ය අපනයන මිල සියයට 23 කින් අඩු වූ අතර ෂීට් රබර් වර්ගවල අපනයන සාමාන්‍ය මිල සියයට 31 කින් අඩුවිය. සනීපාරක්ෂක හා ඖෂධීය ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා පාවිච්චි කරනු ලබන සෝල් ක්‍රේප්වල සාමාන්‍ය මිල 1998 දී සියයට 6 කින් වැඩිවිය. නැගෙනහිර ආසියානු මූල්‍ය අර්බුදයට පෙරාතුව පවා රබර් අපනයන මිල හා ප්‍රමාණයෙහි අඩුවීමක් සිදුවිය. තායිලන්තය, ඉන්දුනීසියාව වැනි ප්‍රධාන රබර් නිෂ්පාදනය කරනු ලබන රටවල නිෂ්පාදන අතිරික්තයක් පැවතීම රබර්වල මිල අඩුවීමට හේතුවිය. ලෝකයෙහි රබර් අපනයනයෙන් සියයට 88 කට වැඩි ප්‍රමාණයක් දායක වන්නාවූ තායිලන්තය, ඉන්දුනීසියාව, මැලේසියාව වැනි රටවල ඉතා තියුණු අන්දමින් ව්‍යවහාර මුදලේ අගය ක්ෂයවීම 1997 අවසාන භාගයේ සිට ජාත්‍යන්තර රබර් මිල කෙරෙහි බලපාන ලදී. ලෝක සැපයුමෙහි උපනතීන් හා අනාගත මිල පිළිබඳ පුරෝකතනයන් අනුව 1999 හා 2000 දී ලෝක සැපයුමෙහි වැඩිවීමක් හා පහළ මට්ටමක මිළ ගණන් අපේක්ෂිතය. නුදුරු අනාගතයේදී මෙම කර්මාන්තයේහි මිල ගණන් වැඩිවීමේ ලකුණු පෙන්නුම් නොකරයි.

රබර් පදනම් කරගත් කර්මාන්ත අනු කණ්ඩයෙහි වර්ධනය පිළිබිඹු කරමින් රබර්වල දේශීය පරිභෝජනය කිලෝග්‍රෑම් දශ ලක්ෂ 53 දක්වා සියයට 20 කින් වර්ධනය විය. ස්වාභාවික රබර් ආනයනය 1997 පැවති කිලෝග්‍රෑම් 270,891 සිට කිලෝග්‍රෑම් 259,869 දක්වා පහත වැටුණි. රබර් ආනයනය, භාණ්ඩ හා සේවා බද්දෙන් (භා.සේ.බ.) නිදහස් කළ අතර සියයට 10 ක තීරුගාස්තුවක් හා සියයට 5.5 ක ජාතික ආරක්ෂක බද්ද (මෙම අනුපාතය 1998 නොවැම්බර් මස වනතුරු සියයට 4.5 ක්ව පැවතිණි) පැණවීමෙන් දේශීය රබර් නිපදවන්නන් සඳහා ආරක්ෂාව සලසා ඇත.

පොල් මද නිෂ්පාදනයෙන් සියයට 80 කට දයක වන්නා වූ කපාපු පොල් අපනයන සියයට 29 කින් අඩුවිය. පිලිපීනය, ඉන්දුනීසියාව වැනි ප්‍රධාන නිෂ්පාදන රටවල් විසින් ආකර්ශණීය මිල ගණන් ඉදිරිපත් කිරීම මෙයට හේතුවිය. දේශීය නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන මිල ඉහළ මට්ටමක පැවැතීම හේතුකරගෙන දේශීය නිෂ්පාදකයින්ට මෙම මිල ගණන් හා තරඟකිරීමට නොහැකි විය. ඉන්දුනීසියාව පාම්තෙල් අපනයනය තහනම් කිරීම නිසා ඉහළ ගිය ජාත්‍යන්තර මිල ගණන් හේතුකොට පොල්තෙල් නිෂ්පාදනය සඳහා පොල් භාවිතය වැඩිවිය. පොල්තෙල් සඳහා වන අපනයන මිල සියයට 31 කින් එ.ජ.ඩොලර් 1.15 දක්වා වැඩිවිය. 1998 දී කොහු කෙඳි පදනම් කරගත් කර්මාන්ත, විශේෂයෙන් කොහු මෙට්ට කර්මාන්තය සියයට 13 කින් වැඩිවිය. තරඟකාරී රටවලට වඩා අමුද්‍රව්‍ය මිල ඉහළ තත්ත්වයක පැවැතීම නිසා දේශීය කොහු නිෂ්පාදකයෝ දුෂ්කරතාවන්ට මුහුණ දුන්නේය. ශ්‍රී ලංකාව ලෝක වෙළෙඳපොළ වෙත ඉතා උසස් තත්ත්වයේ කොහු භාණ්ඩ නිපදවන බැවින් ඉතා සුළු ලාභාන්තිකය සහිතව වුවත්, අපනයන මට්ටම ආරක්ෂා කරගැනීමට හැකිවිය.

## වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදිත

මිල සැලකියයුතු අන්දමින් වැඩිවීම නිසා (සියයට 18) වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන අපනයන ඉපයීම් සියයට 18 කින් වැඩිවිය. මිල ඉහළයාම හා ප්‍රමාණය වැඩිවීම නිසා ගම්මිරිස් වලින් ලත් අපනයන ඉපයීම් සියයට 94 කින් වැඩිවිය. ඊජිප්තුව, ඉන්දියාව, පකිස්ථානය, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය යන රටවල් වලින් ගම්මිරිස් සඳහා ඉල්ලුම සැලකියයුතු අන්දමින් වැඩිවිය. ප්‍රමාණය අඩු වුවද මිල සියයට 23 කින් වැඩිවීම නිසා කුරුඳු අපනයනය ආදායම සියයට 8 කින් වැඩිවිය. එක්සත් රාජධානිය, ඉතාලිය, ස්පාඤ්ඤය යන රටවලින් පැවති අධික ඉල්ලුම නිසා මිල අඩු වුවද, සකස් නොකළ දුම්කොළවල අපනයන ප්‍රමාණය සියයට 43 කින් වැඩිවිය. මෙම නිෂ්පාදන තුන වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන වලින් ලද අපනයන ඉපයීම් වලින් සියයට 68 කට දයක විය. අළුත් හා වියලන ලද පලතුරු වලින් ලත් ඉපයීම් සියයට 41 කින් පහත වැටිණ. පකිස්ථානයට අපනයනය කරන ලද සියඹලා ප්‍රමාණය සියයට 87 කට වඩා වැඩි ප්‍රතිශතයකින් අඩුවීම මෙම ඉපයීම් අඩුවීමට හේතුවිය. 1997 අපනයනය කරන ලද අළුත් හා වියලන ලද පලතුරු මුළු ප්‍රමාණයෙන් සියයට 67 ක් සියඹලා විය. බුලත් කොළ, කජු, කරාබු නැටි හැර සෙසු වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදනවල වැඩිවීම් වාර්තා විය.

## ඛනිජ නිෂ්පාදිත

වටිනා හා අර්ධ අගනා ගල් වර්ග වලින් ලත් ආදායම (සියයට 34 කින් ) අඩුවීම හේතුකොට ගෙන සියලුම ඛනිජ නිෂ්පාදන වලින් ලත් අපනයන ආදායම සියයට 33 කින් අඩුවූ අතර මෙම අංශය 1998 අපනයන ආදායමෙන් සියයට 1කට දයක විය. ජපානයෙහි මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳපොළ පරිහානිය නොකඩවා තවදුරටත් පැවතීම මැණික් සඳහා වන ඉල්ලුම කෙරෙහි ඉතා අහිතකර බලපෑමක් ඇතිකළේය. තායිලන්තය, තායිවානය, සිංගප්පූරුව සහ මලයාසියාව යන රටවල මැණික් අපනයනය කිරීම සැලකියයුතු අන්දමින් අඩුවිය. 1997 සිදුවූ ආන්තික අඩුවීමට පටහැනිව වටිනා හා අර්ධ වටිනා ගල් අපනයනය සියයට 24 කින් අඩුවිය. එක්සත් ජනපදය හා එක්සත් රාජධානියෙහි වටිනා හා අර්ධ අගනා ගල් වර්ගවල අඩු වටිනාකමක් ඇති නිෂ්පාදන සඳහා ස්ථිර සාර වෙළෙඳපොළක් පැවතිණි. මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හා වැව්ලි සමාගම් අතර මැණික් පතල් ඇති ඉඩම් වෙන්දේසි වලදී ලැබුණු මුදල් සම්බන්ධයෙන් පැවැති ගැටළුව සම්බන්ධව 1998 මාර්තු මසදී විසඳුමක් ඇතිකර ගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් නීත්‍යානුකුල කැනීම් වැඩිදියුණු විය. එහෙත් රාජ්‍ය අංශයේ ඉඩම් මැණික් ආකර සඳහා බදුදීම සම්බන්ධයෙන් පැවැති ගැටළු හේතුකොට නීත්‍යානුකුල නොවූ කැනීම් මේ වනතුරුත් ඉහළ මට්ටමක පවතී. ටැන්සානියාව, වියට්නාමය, මැඩගස්කරය වැනි මැණික් නිෂ්පාදනය කරන රටවල් ලෝක වෙළෙඳපොළට ප්‍රවිෂ්ට වීමත් සමගම මෙම කර්මාන්තයට ඇති තරඟකාරීත්වය වර්ධනය විය. මෙම නවක ප්‍රවේශකයන් නිසා ශ්‍රී ලංකාවෙහි ඇතැම් ගැණුම්කරුවන් විශේෂයෙන් 'ගෙවුඩ' වෙළෙඳපොළෙන් තායි වෙළෙන්දෝ ඈත් වුහ. ලෝපස්, යකඩ, පයිරයිට්ස්, ඉල්මනයිට් හා අනෙකුත් ඛනිජ ද්‍රව්‍ය අපනයනය ආදායම් අඩුවීමේ හේතුවෙන් අනෙකුත් ඛනිජ අපනයනයන්ගෙන් ලත් ආදායම සියයට 30 කින් අඩු විය. කෙසේ නමුදු ඛනිජවලින් ලත් අපනයන ඉපයීම් අඩු වුවද ස්වාභාවික මිනිරන් වලින් ලත් ආදායම ඉහළ ගියේය.

## 9.3 ආනයන

1998 වසරේ සියයට 8 ක වර්ධනයක් සමඟ සසඳන විට ආනයන සඳහා වූ මුළු වියදම සියයට 0.5 ක ආන්තික වර්ධනයක් පෙන්නුම් කරනු ලැබීය. මෙම මන්දගාමී වර්ධනය සාමාන්‍ය ආනයන මිල සියයට 11 කින් පහත වැටීමෙහි සහ ආනයන පරිමාව සියයට 12 කින් වර්ධනය වීමෙහි ප්‍රතිඵලයකි. පාරිභෝජන භාණ්ඩ (සීනි, තිරිඟු, රසායනික පොහොර සහ ඛනිජ තෙල්) අන්තර් සහ ආයෝජන භාණ්ඩවල ජාත්‍යන්තර මිල ගණන් පහත වැටීම ආනයන භාණ්ඩවල මිල ගණන් අඩුවීම කෙරෙහි බලපෑවේය. පාරිභෝජන භාණ්ඩ සඳහා ආනයන වියදම සියයට 4 කින් වැඩිවූ අතර රසායනික පොහොර ඛනිජ නිෂ්පාදිත සහ දියමන්ති ආනයන වියදම පහත වැටීම හේතුකොටගෙන අන්තර් භාණ්ඩ සඳහා වූ ආනයන වියදම සියයට 4 කින් අඩුවිය. කෙසේ වුවද ඛනිජ තෙල් නිෂ්පාදිත අත්හල පසු

අන්තර් භාණ්ඩ ආනයනය සියයට 3 කින් වර්ධනය විය. ආයෝජන භාණ්ඩ ආනයන 11.5 කින් වර්ධනය වූ අතර යන්ත්‍රසූත්‍ර සහ ගමනා ගමනය සඳහා වූ අමතර කොටස් ආනයනය කිරීම වැඩිවීම මේ කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑවේය. අවුරුද්දේ උත්සව කාලවලදී විශේෂයෙන් අප්‍රේල් සහ දෙසැම්බර් මාසවලදී ඉල්ලුමට සරිලන ලෙස ආහාර හා කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ ආනයන විශාල වශයෙන් ඉහළයාම නිසා මාසික ආනයන පරිමාවේ කාලීන උච්චාවචනයක් දක්නට ලැබේ.

## පාරිභෝගික භාණ්ඩ

පාරිභෝගික භාණ්ඩ කාණ්ඩයෙහි වර්ධනය සඳහා මුළුමනින්ම හේතුවූයේ කල් පවත්නා පාරිභෝගික භාණ්ඩයන්ගේ පැවති සැලකිය යුතු වර්ධනයයි සහල් නිෂ්පාදනය මද වශයෙන් යථා තත්ත්වයට පත්වීම, තිරිඟු සහ සීනි සඳහා ජාත්‍යන්තර මිල ගණන් අඩුවීම සහ 1997 වසරෙහි සීනි සඳහා වූ සහනදායී බදු අත්හැරීම හේතුවෙන් ඉතා ඉහළ මට්ටමක පැවති සීනි ආනයන ප්‍රමාණය අඩුවීම පිලිබිඹු කරමින් ආහාර සහ පාන වර්ගයන්ගේ ආනයන වියදම සියයට 7 කින් පහත වැටුණි. සීනි සඳහා 1997 අගෝස්තු 11 සිට මාස 5 ක කාලපරිච්ඡේදයක් සඳහා වූ බදු අත්හැරීම සියයට 17 සිට සියයට 10 දක්වා අඩු කළ අතර 1998 ජනවාරි 16 දින සිට බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයක් සඳහා රු.3.50 ක්වූ විශේෂිත බදු අනුපාතයක් පාදක කොටගත් බදු අත්හැරීමක් ක්‍රියාත්මක කෙරිණි. ජාත්‍යන්තර මිල අඩුවීමේ හේතුවෙන් තිරිඟු ආනයන වියදම සියයට 8 කින් පහත වැටිණි. තිරිඟු ආනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 879,500 දක්වා සියයට 11.5 කින් වැඩි වූ අතර තිරිඟු පිටි ආනයනය මෙට්‍රික් ටොන් 46,283 ක් විය. 1998 වර්ෂයේ මහ කන්නයේ අස්වැන්න ඉහළ යාම හේතුවෙන් සහල් ආනයන ප්‍රමාණය සියයට 42 කින් අඩුවිය. පූර්ණ බදු අත්හැරීම කෙරෙහි වෙළෙඳපොළ දක්වන ප්‍රතික්‍රියාවන් පිළිබිඹු කරමින් මෙම වර්ෂයෙහි ආනයනය කළ මෙට්‍රික් ටොන් 167,600 ක්වූ සහල් ප්‍රමාණයෙන් මෙට්‍රික් ටොන් 125,200 ක් ආනයනය කරන ලද්දේ බදු අත්හැරීම බලපැවැත්වූ 1998 ජනවාරි මාසයේදීය. සහල් සඳහා පූර්ණ බදු අත්හැරීමක් 1997 නොවැම්බර් 20 දින සිට 1998 ජනවාරි 31 දින දක්වා බලපැවැත්වුනි. කිරි නිෂ්පාදන, තිරිඟු පිටි, වියලි සහ අනෙකුත් මාළු, වියලි මිරිස් සහ අර්තාපල් ආනයනය අධික ලෙස ඉහළ යාමත් සමග අනෙකුත් සියළු ආහාර වර්ග ආනයනය සියයට 10 කින් වැඩිවිය.

**9.4 සංඛ්‍යා සටහන**

**ආනයනයන්හි අවසන් උපයෝජනය අනුව වර්ගීකරණය**

| කාණ්ඩය | එ.ජ.ඩොලර් දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1994 | 1995 | 1996 | 1997 | 1998(අ) | 1994 | 1995 | 1996 | 1997 | 1998(අ) |
| 1. පාරිභෝගික භාණ්ඩ | 1,048 | 1,181 | 1,234 | 1,223 | 1,255 | 51,810 | 60,508 | 68,372 | 72,062 | 80,956 |
| ආහාර හා පාන වර්ග | 602 | 720 | 801 | 781 | 723 | 29,739 | 36,901 | 44,377 | 45,996 | 46,543 |
| සහල් | 13 | 2 | 91 | 73 | 42 | 655 | 122 | 5,118 | 4,331 | 2,621 |
| සීනි | 180 | 170 | 145 | 184 | 129 | 8,875 | 8,737 | 8,026 | 10,788 | 8,384 |
| තිරිඟු | 118 | 198 | 204 | 139 | 127 | 5,825 | 10,155 | 11,267 | 8,128 | 8,133 |
| වෙනත් | 291 | 349 | 361 | 385 | 425 | 14,384 | 17,887 | 19,966 | 22,749 | 27,405 |
| වෙනත් පාරිභෝගික භාණ්ඩ | 447 | 461 | 433 | 442 | 532 | 22,071 | 23,607 | 23,995 | 26,066 | 34,413 |
| 2. අන්තර් භාණ්ඩ | 2,307 | 2,702 | 2,767 | 3,096 | 2,977 | 114,004 | 138,475 | 153,117 | 182,754 | 192,240 |
| ඛනිජ තෙල් | 296 | 387 | 479 | 539 | 345 | 14,641 | 19,827 | 26,525 | 31,828 | 22,275 |
| පොහොර (ආ) | 63 | 86 | 76 | 66 | 62 | 3,097 | 4,406 | 4,189 | 3,916 | 3,989 |
| රසායනික ද්‍රව්‍ය | 121 | 143 | 134 | 136 | 143 | 5,975 | 7,310 | 7,402 | 8,024 | 9,241 |
| රෙදිපිළි හා ඇඟළුම් | 1,038 | 1,159 | 1,168 | 1,386 | 1,397 | 51,299 | 59,375 | 64,601 | 81,816 | 90,099 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 789 | 928 | 910 | 969 | 1,030 | 38,992 | 47,557 | 50,400 | 57,170 | 66,636 |
| 3. ආයෝජන භාණ්ඩ | 1,366 | 1,189 | 1,204 | 1,325 | 1,477 | 67,524 | 60,916 | 66,647 | 78,232 | 95,322 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 559 | 503 | 649 | 742 | 786 | 27,635 | 25,769 | 35,987 | 43,853 | 50,592 |
| ගමනාගමන උපකරණ | 454 | 304 | 179 | 208 | 264 | 22,425 | 15,564 | 9,885 | 12,276 | 17,098 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 241 | 272 | 263 | 272 | 303 | 11,898 | 13,956 | 14,540 | 16,030 | 19,590 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 113 | 110 | 113 | 103 | 124 | 5,566 | 5,627 | 6,235 | 6,073 | 8,042 |
| 4. වර්ග නොකළ ආනයන | 45 | 240 | 234 | 220 | 182 | 2,238 | 12,301 | 12,940 | 12,978 | 11,757 |
| මුළු ආනයන (ඇ) | 4,767 | 5,311 | 5,439 | 5,864 | 5,891 | 235,576 | 272,200 | 301,076 | 346,026 | 380,275 |

(අ) තාවකාලිකයි
(ආ) 1997 සිට පොහොර සඳහා වන දත්තයන් පොහොර සමාගමෙන් හා වෙනත් පොහොර ආනයනකරුවන් වෙනුවට රේගු සංඛ්‍යා උපයෝගී කරගන්නා ලදී.
(ඇ) ගලපන ලදී.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව
සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව
ලංකා පොහොර සමාගම හා වෙනත් පොහොර ආනයනකරුවෝ
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව
ශ්‍රී ලංකා මහ බැංකුව

කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ කාණ්ඩයෙහි මෝටර් රථ සහ යතුරුපැදි ආනයනය සියයට 55 කින් වැඩිවූ අතර දේශීය වශයෙන් නිෂ්පාදිත ටයර් සහ ටියුබ් බහුල වශයෙන් භාවිතයට ගැනීමේ හේතුවෙන් ටයර් සහ ටියුබ් ආනයනය සියයට 2 කින් පහත වැටිණි. ගුවන් විදුලි යන්ත්‍ර සහ රූපවාහිනී යන්ත්‍ර ආනයනය සියයට 2 කින් ඉහළ නැගුණි. ඉහළ මිල ගණන් හේතුවෙන් බෙහෙත් සහ ඖෂධ ද්‍රව්‍ය ආනයනය සියයට 17 කින් ඉහළ ගියේය. මුද්‍රිත ද්‍රව්‍ය, ගෘහ විදුලි උපකරණ සහ රෙදිපිළි නිමැවුම් සඳහා අවශ්‍ය උපාංග ආනයන 1998 වසරේදී වැඩිවූ අනෙකුත් කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ වේ.

## අන්තර් භාණ්ඩ

ආනයන පරිමාවේ පැවති වර්ධනය යටපත් කරමින් ජාත්‍යන්තර මිල ගණන් විශාල වශයෙන් අඩුවීම හේතුවෙන් අන්තර් භාණ්ඩ ආනයන සඳහා වූ වියදම සියයට 4 කින් පහත වැටිණි. අඩු මිල ගණන් හේතුවෙන් පොහොර සඳහා වූ ආනයන වියදම සියයට 7 කින් පහත වැටිණි. අඩු මිල ගණන් සහ දේශීය වශයෙන් තොග රැස්කිරීමේ හේතුවෙන් 1998 වසරේ රසායනික පොහොර ආනයනය විශාල වශයෙන් ඉහළ යාමට හේතුවිය. ආනයන පරිමාව සියයට 10 කින් ඉහළ නැගුණද, අඩු මිල ගණන් නිසා රෙදිපිළි සඳහා වූ ආනයන වියදම පහත් මට්ටමක පැවතිනි. කෙසේ වුවද, රෙදිපිළි සඳහා වූ ආනයන පිරිවැය සියයට 1 කින් වර්ධනය විය. බොරතෙල් වැඩි වශයෙන් ආනයනය කළද බනිජ තෙල් සඳහා වූ වියදම සියයට 18 කින් පහත වැටුණි. බනිජ තෙල් බැරලයක් සඳහා වූ මිල ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 19.42 සිට 13.63 දක්වා මෙම කාලපරිච්ඡේද දෙක අතරදී පහත වැටිණි. මිල ගණන් අඩුවීම සහ ආනයන කරන ලද ප්‍රමාණය අඩු වීම නිසා අනෙකුත් බනිජතෙල් නිෂ්පාදන සියයට 53 කින් පහත වැටිණි. 1997 දී තෙල් පිරිපහදුව තාවකාලිකව වසා දැමීම නිසා ඇතිවූ හිඟය පියවීම පිණිස පිරිපහදු කරන ලද බනිජ තෙල් විශාල ප්‍රමාණයක් ආනයනය කරන ලදී. බනිජ තෙල් අත්හළ පසු අන්තර් භාණ්ඩ ආනයනය සියයට 3 කින් වර්ධනය විය. දියමන්ති කර්මාන්තයෙහි මන්දගාමී ස්වරූපය පිළිබිඹු කරමින් දියමන්ති ආනයනය පහත වැටිණි. රසායනික ද්‍රව්‍ය ආනයන සියයට 5 කින් වර්ධනය විය. ආහාර, සබන්, සතුන් ඇති කිරීමේ සහ රබර් පදනම් කරගත් කර්මාන්ත සඳහා වූ අමුද්‍රව්‍ය ආනයනය ඉහළයාම හේතුකොට අනෙකුත් අන්තර් භාණ්ඩ ආනයනය සියයට 6 කින් වර්ධනය විය.

**9.5 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන ආනයනයන්හි ප්‍රමාණ (අ)**

මෙ. ටො. දහස්

| ශීර්ෂය | 1994 | 1995 | 1996 | 1997 | 1998(ආ) |
|---|---|---|---|---|---|
| සහල් | 58 | 9 | 341 | 306 | 168 |
| 1 වන කාර්තුව | 37 | 8 | 1 | 104 | 136 |
| 2 වන කාර්තුව | 12 | ... | 23 | 9 | 12 |
| 3 වන කාර්තුව | 5 | ... | 117 | 12 | 2 |
| 4 වන කාර්තුව | 4 | 1 | 201 | 181 | 18 |
| තිරිඟු | 826 | 1,057 | 913 | 789 | 880 |
| 1 වන කාර්තුව | 178 | 315 | 201 | 302 | 340 |
| 2 වන කාර්තුව | 259 | 213 | 303 | 172 | 155 |
| 3 වන කාර්තුව | 222 | 323 | 157 | 168 | 126 |
| 4 වන කාර්තුව | 168 | 206 | 252 | 147 | 259 |
| සීනි | 491 | 417 | 381 | 545 | 444 |
| 1 වන කාර්තුව | 127 | 133 | 94 | 176 | 79 |
| 2 වන කාර්තුව | 147 | 76 | 84 | 163 | 129 |
| 3 වන කාර්තුව | 134 | 95 | 58 | 83 | 99 |
| 4 වන කාර්තුව | 83 | 113 | 146 | 123 | 137 |
| බනිජතෙල් (බොර තෙල්) | 1,898 | 1,860 | 2,033 | 1,814 | 2156 |
| 1 වන කාර්තුව | 503 | 332 | 566 | 299 | 567 |
| 2 වන කාර්තුව | 547 | 452 | 493 | 389 | 431 |
| 3 වන කාර්තුව | 364 | 584 | 466 | 606 | 662 |
| 4 වන කාර්තුව | 484 | 492 | 508 | 520 | 496 |
| පොහොර | 427 | 452 | 361 | 391 | 440 |
| 1 වන කාර්තුව | 99 | 185 | 104 | 56 | 109 |
| 2 වන කාර්තුව | 159 | 97 | 60 | 87 | 98 |
| 3 වන කාර්තුව | 71 | 56 | 53 | 87 | 82 |
| 4 වන කාර්තුව | 97 | 115 | 144 | 161 | 151 |

(අ) ගලපන ලදී.
(ආ) තාවකාලිකයි

මූලයන් : ශ්‍රී ලංකා රේගුව
සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව
ලංකා පොහොර සමාගම හා
වෙනත් පොහොර ආනයනකරුවෝ
ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව

## ආයෝජන භාණ්ඩ

1997 වසරේ සියයට 10 කින් වර්ධනය වූ ආයෝජන භාණ්ඩ සඳහා වූ වියදම 1998 වසරේදී සියයට 12 කින් වර්ධනය විය. පළමු මාස 5 තුළදී ඉහළ වර්ධනයක් පෙන්වූ ආනයන වියදම පසුව ක්‍රමයෙන් පහත වැටිණි. පළමු මාස 5 තුළ සාමාන්‍ය වර්ධනය සියයට 23 ක් විය. 1998 වසරේ අයවැය යෝජනා මගින් කෘෂිකර්මය, ගමනාගමන, රෙදිපිළි සහ ඇඟළුම් හා විදුලි සංදේශ සේවාවන් සඳහා ඉදිරිපත් කළ දිරිදීම් සමූහය සඳහා දක්වූ ක්ෂණික ප්‍රතිචාරය හේතුකොට යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ගමනාගමනය සඳහා වූ උපකරණ ආනයන පළමු මාස දෙක තුළදී සියයට 44 ක් සහ සියයට 20 ක් වශයෙන් පිළිවෙලින් වර්ධනය විය. විශාල ව්‍යාපාර ආයතනයන්ට තම සේවක සේවිකාවන්ට ප්‍රවාහන පහසුකම් වෙනුවෙන් බස්රථ සහ වෑන්රථ මිලදී ගැනීමට බදු අත්හැරීමක් ලබාදෙන ලදී.

ආයෝජන භාණ්ඩ ආනයනයට ජාත්‍යන්තර මිල ගණන් අඩුවීමෙහි ප්‍රතිලාභ ලබාගත් අතර මෙම බලපෑම එහි ඒකක වටිනාකම් දර්ශකය සියයට 8 කින් පහත වැටීමෙන් පෙන්නුම් කෙරේ. මේ අනුව ආයෝජන භාණ්ඩ ප්‍රමාණයෙහි වර්ධනය සියයට 21 ක් වැනි වඩා ඉහළ අගයක් ගන්නා ලදී. මෙම 1997 වසරේ ඇතිවූ වර්ධන ප්‍රවනතාව තවදුරටත් පවත්වා ගනිමින් ඇඟළුම් සහ රෙදිපිළි කර්මාන්තයට අවශ්‍ය යන්ත්‍රසූත්‍ර දත්ත සැකසුම් යන්ත්‍ර, ට්‍රැක්ටර්, විදුලි සංදේශ හා ඉදිකිරීම් අංශයන් මෙම වර්ධනය පිළිබිඹු විය. මගී ප්‍රවාහන වෑන්රථ සහ බස්රථ, විශේෂයෙන් ආසන 30

සහ ඊට වැඩි ආසන පහසුකම් සහිත බස්රථ, ශීතකරණ සහිත ට්‍රක්රථ, මෝටර් රථ වැසි සහ මෝටර්රථ අමතර කොටස් හා උපාංග විශාල වශයෙන් ආනයන කරන ලද හෙයින් ප්‍රවාහන උපකරණ ආනයනය සියයට 27 කින් ඉහළ ගියේය. වාණිජ යටිතල පහසුකම් සහ දේපල වෙළඳාම් අංශයන්හි සම්බන්ධ ඉදිකිරීම් කටයුතුවල දිගටම පැවති වර්ධනය පිළිබිඹු කරමින් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම සියයට 12 කින් වර්ධනය විය.

### වෙළෙඳ දිශාව

1998 වසරේදීද ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ ප්‍රධානම වෙළඳ ගැණුම්කරු වශයෙන් තවදුරටත් පැවතිණි. ඇමෙරිකා එක්සත් ජනපදයට අපනයනය කරන ලද ඇහළුම් නිෂ්පාදන ප්‍රමාණය ඉහළයාම හේතුවෙන් 1997 වසරේ සියයට 36 ක් වූ ඇමෙරිකා එක්සත් ජනපදයට හිමිව තිබූ වෙළෙඳපොළ කොටස 1998 වසරේදී සියයට 40 දක්වා ඉහළ ගියේය. ඇමෙරිකා එක්සත් ජනපදයට අපනයනය කළ ඇහළුම්වල වටිනාකම සියයට 12 කින් ඉහළ නැගුණි. එක්සත් රාජධානිය සියයට 11 ක දයකත්වයක් පෙන්නුම් කරමින් දෙවැනි විශාලතම ගැණුම්කරු විය. ඇහළුම් නිෂ්පාදන වැඩි වශයෙන් මිලදී ගැනීම හේතුවෙන් සියයට 5 ක වෙළඳ දයකත්වයක් ලබා ගත් ජර්මනිය ජපානය අභිබවමින් තෙවන ස්ථානයට පත්විය. 1997 වසරේදී කාර්මික රටවල් සියල්ල එක්ව ගත්කල මුළු අපනයනයෙන් සියයට 73 කට දයක වූ අතර 1998 වසරේදී එහි දයකත්වය සියයට 74 ක් බවට පත්විය. එමෙන්ම නැගෙනහිර ආසියානු රටවලට කරන ලද ආනයනය 1998 වසරේදී සියයට 23 කින් අඩුවිය. කෙසේ වුවත් මැදපෙරදිගට කෙරෙන අපනයනයන් වැඩිවීමේ හේතුවෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළෙඳපොළ දයකත්වය පෙර වසරේ පැවති සියයට 21 මට්ටමෙහිම පවත්වා ගැනීමට හැකිවිය. අඩු තේ ප්‍රමාණයක් රුසියාවට අපනයනය කිරීමේ හේතුවෙන් ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් සඳහා කෙරුනු අපනයනයන් සියයට 13 කින් අඩුවීමක් පෙන්නුම් කරයි. බටහිර කාර්මික රටවල් ශ්‍රී ලංකාවේ අපනයනයන් වැඩි වශයෙන් මිලදී ගැනීමෙන් ශ්‍රී ලංකාවේ ප්‍රධානම වෙළඳ හවුල් කරු බවට පත්වූහ.

1996 වසරේ සිට ශ්‍රී ලංකාවේ විශාලතම තනි ආනයන සැපයුම්කරු වූ ඉන්දියාව අභිබවමින් ජපානය නැවත එම තත්ත්වය අත්පත් කරගන්නා ලදී. සංවර්ධනය වූ රටවල ආනයන දයකත්වය සියයට 35 සිට සියයට 37 ක් දක්වා වැඩි කරමින් ජපානයෙන් කළ ආනයන සියයට 16 කින් ඉහළ ගිය අතර ඇමෙරිකා එක්සත් ජනපදය හා එක්සත් රාජධානියෙන් කල ආනයනය වර්ධනය පිළිවෙලින් සියයට 23 හා සියයට 8 වශයෙන් විය. ඛනිජ තෙල් අපනයනයෙහි මිලෙහි ඇතිවූ බලපෑම හේතුවෙන් මැදපෙරදිග රටවල් වලින් කළ ආනයන සියයට 29 කින් පහත වැටුණ අතර වෙළෙඳපොළ දයකත්වය සියයට 9 සිට සියයට 6 දක්වා අඩුවීමක් පෙන්නුම් කරයි. කෙසේ නමුත් මෙම රටවල් සමග පැවති වෙළෙඳ හිඟය නැවත පුළුල් කරමින් නැගෙනහිර ආසියානු රටවල ආනයන සියයට 7 කින් වර්ධනය විය.

## 9.4 සේවා සහ ආදයම්

1998 වර්ෂය තුළදී සේවා ගිණුමෙහි එ.ජ. ඩොලර් දශ ලක්ෂ 143 ක අතිරික්තයක් වාර්තා විය. මෙය පසුගිය වර්ෂයේ වාර්තා වූ ඩොලර් දශ ලක්ෂ 159 හා සසඳන විට වඩා අඩු අතිරික්තයක් වූ අතර එය වරාය හා සම්බන්ධ සේවාවන්ගේ පසුබෑම පිළිබිඹු විය. ලැබීම්වල (සියයට 3) සුළු වර්ධනය හේතුකොටගෙන ගෙවීම් වේගවත්ව (සියයට 13) වර්ධනය වීම නිසා 1998 දී ප්‍රවාහන සේවාවන්ගේ ශුද්ධ ලැබීම් සියයට 12 කින් පහත වැටිණි. ආනයන හා අපනයන වෙළෙඳමේ මන්දගාමී වර්ධනය සහ නැව් භාණ්ඩ හා ප්‍රති නැව්ගත කිරීම් කටයුතුවල පසුබෑම වරාය ආශ්‍රිත සේවාවන්ගේ ලැබීම්වල අඩු වීමට හේතු වූ අතර, භාණ්ඩ ප්‍රවාහන ගාස්තු ඉහළ යාම ප්‍රවාහන සේවාවන්ගේ ඉහළ ගෙවීම්වලට තරමක්දුරට හේතු විය. විශේෂයෙන් නැගෙනහිර ආසියානු රටවල් මුල්කොටගත් පසුගාමී ලෝක ආර්ථික තත්ත්වය සහ පෙබරවාරි, මාර්තු මාසවල සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාර හේතුකොටගෙන ඇති වූ අයහපත් ආරක්ෂක තත්ත්වය නිසා 1998 වර්ෂයේ මුල් මාස කිහිපය තුළදී සංචාරක පැමිණීම්වල පසුබෑමක් දක්නට ලැබිණ. නැගෙනහිර ආසියානු රටවල තරඟකාරිත්වයද වර්ෂය තුළදී සංචාරක පැමිණීම්වල පසුබෑමට බලපෑම් කරන ලදී. කෙසේ වෙතත් සියයට 16

**9.6 සංඛ්‍යා සටහන**
**ශුද්ධ සේවා, ආදයම් සහ සංක්‍රාම (අ)**

| විෂය | එ.ජ.ඩොලර් දශලක්ෂ | | රුපියල් දශලක්ෂ | |
|---|---|---|---|---|
| | 1997 | 1998(ආ) | 1997 | 1998(ආ) |
| 1. ප්‍රවාහනය | 156 | 137 | 9,194 | 8,836 |
| 2. සංචාරක | 29 | 28 | 1,728 | 1,826 |
| 3. රක්ෂණ සේවා | 10 | 16 | 578 | 1,011 |
| 4. වෙනත් ව්‍යාපාරික සේවා | -29 | -29 | -1723 | -1889 |
| 5. රජයේ වියදම් (වෙනත් තැනක සඳහන් නොවන) | -6 | -9 | -392 | -583 |
| මුළු සේවා | 159 | 143 | 9,386 | 9,201 |
| 1. සේවක ගෙවීම් | -2 | -2 | -91 | -99 |
| 2. සෘජු ආයෝජන ආදයම් | -75 | -89 | -4424 | -5747 |
| 3. වෙනත් (ඇ) | -83 | -88 | -4902 | -5621 |
| මුළු ආදයම් | -160 | -179 | -9417 | -11468 |
| 1. පෞද්ගලික (ඈ) | 788 | 848 | 46,494 | 54,843 |
| 2. මහ ආණ්ඩුව | 44 | 55 | 2,625 | 3,490 |
| මුළු ජංගම සංක්‍රාම | 832 | 903 | 49,119 | 58,333 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මෙම සංඛ්‍යා කිරීම ගෙවුම් තුලන අත්පොතෙහි 5 වන සංස්කරණයට (1993) අනුරූපව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ජාත්‍යන්තරව අනුගමනය කරන අයුරින් සකස් කොට ඇත.

(ආ) තාවකාලික.

(ඇ) 1994 සිට ගෙවුම් ශේෂ තුලන සංඛ්‍යා ලේඛන සැකසීමේදී විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක (වි.ව්‍ය.මු.බැ.ඒ.) දේශීය බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකාන ලදී. ඒ අනුව ගෙවුම් තුලන සංඛ්‍යා ලේඛන සැකසීමේදී වි.ව්‍ය.මු.බැ.ඒ. හා අනේවාසිකයින් අතර ගනුදෙනු ඇතුලත් කරනු ලැබ ඇති අතර වි.ව්‍ය.මු.බැ.ඒ. සහ නේවාසිකයන් අතර ගණුදෙනු ඉවත් කරනු ලැබ ඇත. වැඩි විස්තර සඳහා විශේෂ සටහන් අංක 8 හි ගෙවුම් තුලන සංඛ්‍යා ලේඛන සැකසීමේදී වි.ව්‍ය.මු.බැ.ඒ. ගණුදෙනු නැවත අර්ථකථනය කිරීම මතවූ තාක්ෂණික සටහන බලන්න.

(ඈ) 1990 දී ගල්ෆ් යුද්ධය නිසා කුවේටයේ රැකියා අහිමි වූ ශ්‍රී ලාංකිකයන්ට වන්දි වශයෙන් එක් අයෙකුට ඒ.ජ.ඩො. 2,500 බැගින් 1997 හා 1998 දී පිළිවෙලින් 26,101 දෙනෙක් හා 31,279 දෙනෙක් සඳහා ලැබුණු එ.ජ.ඩොලර් දශලක්ෂ 64ක් හා එ.ජ. ඩොලර් 78 ද මෙහි අඩංගු වේ.

ක පැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරමින්, වර්ෂයේ අවසාන කාර්තුවේදී සංචාරක පැමිණීම් යලි යථා තත්ත්වයකට පත් වීමක් දක්නට විය. මෙය වර්ෂය තුළදී සංචාරක පැමිණීම්වල සියයට 4 ක සමස්ත වර්ධනයට හේතු වූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රවාහන සේවා ලැබීම් සියයට 10 කින් වර්ධනය විය. ප්‍රවාහන ගෙවීම් සියයට 12 කින් ඉහළ යමින් ශුද්ධ ප්‍රවාහන ලැබීම් සුළු වශයෙන් අඩු විය. මෙයට හේතු වූයේ ශ්‍රී ලාංකිකයන් විශාල වශයෙන් විවේකය ගත කිරීම සඳහා හා ව්‍යාපාර කටයුතු සඳහා වඩාත් ලාභදායී නැගෙනහිර ආසියාතු කලාපයේ රටවලට සංචාරය කිරීම වැඩි වීමයි.

ගෙවුම් තුලන අත් පොතෙහි පස්වැනි සංස්කරණයට අනුව පොලී ආදායම්, විදේශීය සෘජු ආයෝජන ආදායම් සහ සේවා නියුක්තිකයන්ට කරනු ලබන වන්දි ගෙවීම් ඇතුළත් ආදායම් ගිණුමේ හිඟය, 1997 දී වාර්තා වූ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 160 හා සැසඳීමේදී 1998 දී එය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 178 දක්වා වැඩි විය. උච්චාවචනයන්ට ලක් වූ ජාත්‍යන්තර ආයෝජන වාතාවරණයක් තුළ විදේශ විනිමය වෙළෙඳුම් කටයුතු අඩු වීම හා ජාත්‍යන්තර පොලී අනුපාතික අඩු වීම හේතුවෙන් මහ බැංකුවේ විදේශීය ආයෝජන ආදායම් අඩු වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. ආදායම් ගිණුමෙහි මුළු ගලා යාම් පසුගිය වර්ෂයේ වූ මට්ටමේම පැවතින.


## 9.5 ජංගම සංක්‍රාම

පසුගිය වර්ෂයේදී මෙන්ම වැඩි වන ප්‍රවනතාවයට අනුව යමින්, පෞද්ගලික සංක්‍රාම ලැබීම් සියයට 8 කින් වර්ධනය වීම මුළුමණින්ම හේතුකොටගෙන, 1998 වර්ෂය තුළදී ශුද්ධ ජංගම සංක්‍රාම තවදුරටත් සැලකිය යුතු ලෙස සියයට 8 කින් වැඩි විය. ශ්‍රමිකයින්ගේ ප්‍රේෂන හා සේවක වන්දි ලැබීම්වල වර්ධනයක් සිදුව ඇත. 1990 වර්ෂයේ ගල්ෆ් යුද්ධ සමය තුළදී අස්ථානගත වූ ක්වේට්හි සේවය කල ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් 31,279 දෙනෙකුට එක් අයෙකුට එ.ජ. ඩොලර් 2,500 බැගින් වන්දි වශයෙන් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 78 ක් වර්ෂය තුළදී ලැබුණි. ශුද්ධ සංක්‍රාම ලැබීම් 1998 දී සියයට 8 කින් වැඩි වී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 848 ක් වූ අතර, එය 1997 වර්ෂයේ වූ සියයට 64 ක ආවරණය හා සැසඳීමේදී මෙම වර්ෂයේ භාණ්ඩ, සේවා සහ ආදායම් ගිණුමේ හිඟයෙන් සියයට 70 ආවරණය කිරීමට ප්‍රමාණවත් විය. ප්‍රධාන වශයෙන් ආහාර ද්‍රව්‍ය හා භාණ්ඩ ආධාර වලින් සමන්විත නිල ජංගම සංක්‍රාම 1998 වර්ෂය තුළදී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 55 දක්වා සියයට 25 කින් වැඩි විය. 1998 දී ඉන්දියාවද අයවැය සඳහා එ.ජ. ඩොලර් දශ ලක්ෂ 25 ක විශේෂ මුදල් ප්‍රදානයක් ලබා දුනි.

## 9.6 ප්‍රාග්ධන සංචලන

1997 දී වාර්තා වූ සියයට 6 ක වර්ධනය සමඟ සැසඳීමේදී ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුමෙහි ශුද්ධ ගලා ඒම් සියයට 34 කින් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 395 දක්වා අඩු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1997 දී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 163 ක් වූ සමස්ත ශේෂයේ අතිරික්තය 1998 දී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 37 දක්වා පහත වැටිණ.

**9.5 රූප සටහන**
**ප්‍රාග්ධන ගලාඒම්**




සටහන : ගෙවුම් තුලන අත්පොතේ 4 වැනි සංස්කරණයේ සිට 5 වන සංස්කරණයට වෙනස්වීමත් සමග මීට ඉහතදී ජංගම ගිණුමේ ඇතුලත් කරන ලද පෞද්ගලික සහ රජයේ ප්‍රාග්ධන සංක්‍රාම දිගුකාලීන ප්‍රාග්ධන ගලාඒම් ලෙසත්, මීට ඉහතදී මූල්‍ය අංශයේ ඇතුලත් කරන ලද වාණිජ බැංකුවල වත්කම් සහ වගකීම්වල වෙනස්වීම් කෙටිකාලීන ප්‍රාග්ධන ගලාඒම් ලෙසත් වර්ගීකරණය කර ඇත.

1994 සිට විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (වි.ව්‍ය.මු.බැ.ඒ.) දේශීය බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකන ලදී.

### ප්‍රාග්ධන සංක්‍රාම

1997 වර්ෂයේ දී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 91 ක් වූ ශුද්ධ ප්‍රාග්ධන සංක්‍රාම 1998 දී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 65 දක්වා පහත වැටුණි. සංවර්ධනය වෙමින් පවත්නා රටවලට ගලා යන විදේශ ආධාර අඩු වීම පිළිබිඹු කරමින් ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ ආධාරවල ප්‍රදාන ලෙස ලැබෙන පංගුවද අඩු වෙමින් පවතී. නිල ව්‍යාපෘති ප්‍රදාන සියයට 34 කින් අඩු විය. වර්ෂය තුළදී මුළු අධාර වලින් සියයට 67 කට දායක වූ ජපානය ශ්‍රී ලංකාවට ආධාර සපයන ප්‍රධාන රට ලෙස තවදුරටත් පැවතුණි.

### දිගුකාලීන ප්‍රාග්ධනය

ප්‍රධාන වශයෙන්ම පෞද්ගලිකකරණ ලැබීම් අඩු වීම සහ අනෙකුත් පෞද්ගලික දිගුකාලීන ණය අරමුදල් ගලා යාම් වැඩි වීම හේතුවෙන් ශුද්ධ පෞද්ගලික දිගුකාලීන ආයෝජන එ.ජ. ඩොලර් දශ ලක්ෂ 200 දක්වා සියයට 58 කින් අඩු විය. පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඇතිව රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රයත්නයන් තවදුරටත් ක්‍රියාත්මක වූ අතර මෙම වැඩපිළිවෙල තුළින් ලැබුණු විදේශ විනිමය 1997 දී වූ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 301 හා සසඳන කල 1998 වර්ෂයේදී එජ ඩොලර් දශ ලක්ෂ 56 ක් විය. 1998 වර්ෂයේදී පෞද්ගලිකකරණ ලැබීම් රජයේ තීරු බදු සාප්පු සංකීර්ණය අයත් ඔරියන්ට් ලංකා සමාගම (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 11) සහ එයාර් ලංකා සමාගමේ කොටස් වලින් සියයට 26 ක් එමිරේට් සමාගමට විකිණීමෙන් (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 45) ලත් ලැබීම් වලින් සමන්විත විය. 1999 දී සහ 2000 දී එයාර් ලංකා සමාගමේ යෝජිත ගුවන්යානා ප්‍රතිසංවිධානය කිරීමේ වැඩපිළිවෙල යටතේ ගුවන් යානා මිලදී ගැනීම සඳහා කරන ලද අත්තිකාරම් ගෙවීම් හේතුවෙන් දිගුකාලීන ගලායැම් සියයට 39 කින් වැඩි විය. ජාතික ගුවන් සේවය ව්‍යාප්ත කිරීමේ වැඩපිළිවෙලට ගමනාන්ත රටවල් හා ගුවන් ගමන් වාර ගණන වැඩි කිරීම් ඇතුළත්ය. මෙය මධ්‍යකාලීන ගුවන්යානා

ප්‍රතිසංවිධානය කිරීමේ වැඩපිළිවෙල යටතේ කෙරෙනු ඇත. ඉදිරි වර්ෂ දෙක තුළදී ගුවන්යානා හයක් මිලදී ගැනීමට සැලසුම් සකස් වෙමින් පවතී. සලකා බලන කාලය තුළ ප්‍රධාන තැනක් ගත් අනෙකුත් දිගුකාලීන ප්‍රාග්ධන ගලාඒම් වූයේ, දිගුකාලීන ආයෝජන ව්‍යාපෘතීන් සඳහා ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් (මුල් ණය මුදල ආසියානු සංවර්ධන බැංකුව විසින් සහතික කරන ලද සහ පොලී ගෙවීම් ශ්‍රී ලංකා රජය විසින් සහතික කරන ලද) පාවෙන අනුපාතික නෝට්ටු නිකුත් කිරීම මගින් ලබා ගත් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 65 සහ දුරකථන සංවර්ධන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම ණය මුදල් වශයෙන් ලබා ගත් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 43 ක්ය. වර්ෂය තුළදී විදේශීය සෘජු ආයෝජන ගැලීම් 1997 ට වඩා තරමක් වැඩිය. වර්ෂය තුළදී විදේශීය සෘජු ආයෝජන ගැලීම් වලින් වැඩිම ප්‍රමාණයක් විදුලි සංදේශ (සියයට 55), විදුලි බලය (සියයට 19) සහ රබර් ආශ්‍රිත කර්මාන්ත (සියයට 6) යන අංශවලට විය. ආයෝජන ගලායාම් ප්‍රධාන වශයෙන් මාලදිවයිනේ සංචාරක ව්‍යාපෘති සම්බන්ධයෙන් විය.

දිගුකාලීන ණය ආපසු ගෙවීම ඉහළ මට්ටමක පැවතීමත්, සහනදායී නොවන ණය ලැබීම් අඩු වීමත් යන දෙකෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් වශයෙන් රජයේ ශුද්ධ දිගුකාලීන ප්‍රාග්ධන ගලාඒම් සියයට 17 කින් අඩු විය. ද්විපාර්ශවීය සහ බහුපාර්ශවීය මූලාශ්‍ර මගින් රජයට ලැබුනු සහනදායී ණය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 466 දක්වා සියයට 40 කින් වැඩි විය. මෙම කාලය තුළ සැලකිය යුතු ප්‍රමාණයක සහනදායී ණය ආධාර ලැබුණු අංශ වූයේ විදුලිබල උත්පාදනය, ජල සම්පාදන ව්‍යාපෘත සංවර්ධනය, සෞඛ්‍යය, විදුලි සංදේශ සහ ග්‍රාමීය සංවර්ධන කටයුතු යන අංශයන්ය. ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය ප්‍රධාන බහුපාර්ශවීය ණය මූලාශ්‍රයන් වූ අතර, 1998 වර්ෂය තුළදී එමගින් ලැබුණ සහනදායී ණය ආධාර පිළිවෙලින් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 117 ක් සහ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 91 ක් වශයෙන් 1997 ට සාපේක්ෂව පිළිවෙලින් සියයට 23 ක් සහ සියයට 16 ක වර්ධනයක් පෙන්නුම් කරනු ලැබීය. ජපානය ශ්‍රී ලංකාවට ණය ආධාර ලබා දෙන ප්‍රධාන මූලය ලෙස තවදුරටත් ක්‍රියාත්මක විය. ජපානය විසින් ලබා දෙන ලද ආධාර ප්‍රමාණය 1997 වර්ෂයේ වූ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 118 සිට 1998 වර්ෂයේ එ.ජ.ඩොලර් දශ ලක්ෂ 189 ක් දක්වා වැඩි විය. 1997 දී ලැබුණු මුළු ආධාර ප්‍රමාණයෙන් සියයට 36 ක් වූ ජපානයේ දායකත්වය, 1998 දී සියයට 41 ක් දක්වා වැඩි විය.

## කෙටිකාලීන ප්‍රාග්ධනය

ප්‍රධාන වශයෙන් වාණිජ බැංකුවල විදේශ වත්කම් අඩු වීම නිසා, 1998 වර්ෂයේදී කෙටිකාලීන පෞද්ගලික ප්‍රාග්ධන ලැබීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 768 ක් දක්වා සියයට 54 කින් වැඩි වූ අතර කෙටිකාලීන ප්‍රාග්ධන ගෙවීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 832 දක්වා සියයට 19 කින් වැඩි විය.

1998 දී විවිධ ආයෝජන එ.ජ. ඩොලර් දශ ලක්ෂ 70 දක්වා සියයට 50 කින් අඩු විය. ලෝක කොටස් වෙළෙඳපොළෙහි පහත වැටීමේ සහ නැගෙනහිර ආසියානු මූල්‍ය අර්බුදයේ බලපෑම්, කොළඹ කොටස් වෙළෙඳපොළටද බලපෑ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ විදේශීය විකුණුම් දක්නට ලැබුණි. 1998 මැයි මාසයේදී ඉන්දියාව සහ පාකිස්ථානය විසින් කරන ලද න්‍යෂ්ටික අත්හද බැලීම් නිසා විදේශ ආයෝජකයන් අතර ආසියානු කලාපය පිළිබඳ අවිනිශ්චිතතාවය තවදුරටත් වර්ධනය වීම හේතුවෙන් කොළඹ කොටස් වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය තවදුරටත් පහත වැටිණි. මේ නිසා 1997 වර්ෂයේදී පැවැති ශුද්ධ ගලා ඒම් හා සසඳ බැලීමේදී 1998 දී විවිධ ආයෝජන ශුද්ධ ගලා යාමක් බවට පත් විය. විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක නොවන මූලාශ්‍රවලට ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කෙටිකාලීන ණය ආපසු ගෙවීම් අඩු වීම හේතුවෙන්, 1997 දී දක්නට ලැබුණු ශුද්ධ ගලා යාම් හා සසඳ බලනවිට අනෙකුත් පෞද්ගලික කෙටිකාලීන ප්‍රාග්ධන 1998 දී ශුද්ධ ගලා ඒමක් බවට පරිවර්තනය විය.

විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල තැන්පතු සහ අත්තිකාරම්හි වෙනස් වීම් මූල්‍ය ගිණුමේ වාණිජ බැංකුවල වත්කම් හා වගකීම්වල වෙනස්කම්වලට විශාල ලෙස බලපාන ලදී. විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක වල විදේශීය ණය ගැනීම් අඩුවීම නිසා වාණිජ බැංකුවල වගකීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 228 කින් අඩු වූ අතර, ප්‍රධාන වශයෙන් විදේශීය බැංකු සමඟ පැවැති විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක තැන්පතු පහත වැටීම හේතුකොටගෙන වාණිජ බැංකුවල වත්කම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 180 කින් අඩු විය.

## 9.7 විනිමය අනුපාතික සංචලනයන්

1997 අග භාගයේදී ජාත්‍යන්තර විදේශීය විනිමය වෙළෙඳපොළ තුළ දක්නට ලැබුණු අවිනිශ්චිතතාවයන් හා උච්චාවචනයන් 1998 මුල් භාගය තුළදීත් අඛණ්ඩව පැවති අතර, වර්ෂයේ අවසාන භාගයේදී එය ස්ථාවර වීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කළේය. ඉන්දුනීසියානු ව්‍යවහාර මුදල වන රුපියා හැරුණුවිට 1997 දී නැගෙනහිර ආසියානු මූල්‍ය අර්බුදයෙන් දැඩි පීඩනයට ලක් වූ කලාපයේ සියලුම මුදල් වර්ග 1998 තුළදී යථා තත්ත්වයට පත් වුණි. ආර්ථික හා දේශපාලන අවිනිශ්චිතතාවයන් නිසා මෙම වසර තුළදී එ.ජ. ඩොලරයට එරෙහිව ඉන්දුනීසියානු රුපියා, සියයට 31 කින් අඛණ්ඩ ලෙස අවප්‍රමාණය විය. දැඩි ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන් නිසා වෙළෙඳපොළ විශ්වාසනීයත්වය තරමක්දුරට නැවත ලඟා කර ගැනීමත් සමඟ කොරියානු වොන් (සියයට 42), තායිලන්ත බාත් (සියයට 29), පිලිපීන පෙසෝ (සියයට 3), මැලේසියානු රින්ගිට් (සියයට 2) සහ සිංගප්පූරු ඩොලර් (සියයට 1) වර්ෂය තුළදී එ.ජ. ඩොලරයට එරෙහිව අතිප්‍රමාණය විය.

මේ අතරතුර මූල්‍ය අංශයේ පවත්නා ගැටළුවලට පිළියම් සෙවීමේ මූලික ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර වශයෙන් ජපන් යෙන්, එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 13 කින් අතිප්‍රමාණය විය. රුසියානු සමූහ ආණ්ඩුවේ රූබල් අර්බුදය සහ බ්‍රසීලයේ මූල්‍ය අංශයේ ප්‍රශ්න හේතුකොටගෙන වර්ෂයේ පසු භාගය තුළදී ජාත්‍යන්තර විදේශීය විනිමය වෙළෙඳපොළේ අවිනිශ්චිතතාවය නැවත ඉස්මතු විය.

**9.7 සංඛ්‍යා සටහන**

**විනිමය අනුපාතික වෙනස්වීම**

| මුදල් වර්ගය | විදේශීය මුදල් ඒකකයකට රුපියල් අගය | | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශත වෙනස්වීම (අ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්ෂය අග අනුපාතිකය | | | වාර්ෂික සාමාන්‍ය | | | ලක්ෂමය | | වාර්ෂික සාමාන්‍ය | |
| | 1996 | 1997 | 1998 | 1996 | 1997 | 1998 | 1997/1996 | 1998/1997 | 1997/1996 | 1998/1997 |
| ජර්මන්. මාර්ක් | 36.46 | 34.24 | 40.36 | 36.75 | 34.07 | 36.80 | 6.5 | -15.2 | 7.8 | -7.4 |
| ප්‍රංශ ප්‍රැන්ක් | 10.81 | 10.23 | 12.03 | 10.81 | 10.12 | 10.98 | 5.6 | -14.9 | 6.8 | -7.8 |
| ඉන්දියානු රුපියල් | 1.58 | 1.56 | 1.59 | 1.56 | 1.63 | 1.57 | 1.3 | -1.3 | -4.5 | 3.8 |
| ජපන් යෙන් | 0.49 | 0.47 | 0.59 | 0.51 | 0.49 | 0.50 | 3.6 | -20.3 | 4.1 | -1.6 |
| බ්‍රිතාන්‍ය පවුම් | 95.86 | 101.60 | 112.62 | 86.34 | 96.69 | 107.05 | -5.6 | -9.8 | -10.7 | -9.7 |
| එ.ජ.ඩොලර් | 56.71 | 61.29 | 67.78 | 55.27 | 58.99 | 64.59 | -7.5 | -9.6 | -6.3 | -8.7 |
| විශේෂ ගැණුම් හිමිකම් | 81.38 | 82.69 | 95.44 | 80.23 | 81.17 | 87.66 | -1.6 | -13.4 | -1.2 | -7.4 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) වෙනස්වීම ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කර ගෙනය. සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය අඩුවීම පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකාව විසින් සිය විනිමය අනුපාතිකය නම්‍යව කණමණාකරනය කිරීම තවදුරටත් අඛණ්ඩව කරගෙන යන ලදී. ශ්‍රී ලංකාව අනුගමනය කල විනිමය අනුපාතික ප්‍රතිපත්තිය අපනයන අංශයේ වර්ධනය සහ විදේශ විනිමය වෙළෙඳපළේ ස්ථායීතාවය ආරක්ෂා කර ගැනීමට හේතු විය. පසුගිය වර්ෂයට වඩා වැඩි වේගයකින් අවප්‍රමාණය වෙමින් 1998 දී ශ්‍රී ලංකා රුපියල එක්සත් ජනපද ඩොලරයට එරෙහිව සියයට 9.6 කින් අවප්‍රමාණය විය. මේ අතර වර්ෂය තුළදී එ.ජ. ඩොලරය ප්‍රධාන ව්‍යවහාර මුදල් බොහොමයකට එරෙහිව අවප්‍රමාණය වීම නිරූපනය කරමින් ශ්‍රී ලංකා රුපියල විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) වලට එරෙහිව සියයට 13.4 කින් අවප්‍රමාණය විය. සමස්තයක් වශයෙන් 1997 ජූලි මස මුල් වකවානුවේ නැගෙනහිර ආසියානු රටවල මූල්‍ය අර්බුදය ඇති වීමේ සිට මේ දක්වා ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 13 කින් අවප්‍රමාණය විය. මෙය මෙම කාලපරිච්ඡේදය තුළදී ඉන්දුනීසියානු රුපියා සියයට 69 කින්ද, මැලේසියානු රින්ගිට් සියයට 34 කින්ද, පිලිපීන පේසෝ සියයට 33 කින්ද, තායිලන්ත බාත් සියයට 30 කින්ද, කොරියානු වොන් සියයට 25 කින් සහ සිංගප්පූරු ඩොලර් සියයට 14 කින්ද අවප්‍රමාණය වීම සමඟ සැසඳිය හැක.


වෙළෙඳ හවුල් කරුවන් හා තරඟ කරුවන් යන දෙ කොටස නියෝජනය කරනු ලබන ව්‍යවහාර මුදල් 24 ක පැසකින් සමන්විත ශ්‍රී ලංකාවේ නාමික සඵල විනිමය

**9.6 රූප සටහන**

**සඵල විනිමය අනුපාතික**


9.6.1 රූප සටහන

**මූර්ත සඵල විනිමය අනුපාතිකය (1995 = 100)**




9.6.2 රූප සටහන

**නාමික සඵල විනිමය අනුපාතිකය (1995 = 100)**



අනුපාතික දර්ශකය 1998 තුළදී සියයට 12 කින් අවප්‍රමාණය විය. මේ අතර මූර්ත සඵල විනිමය අනුපාතිකය එනම් ශ්‍රී ලංකාව සහ ඇයගේ වෙළෙඳ හවුල් කරුවන් හා තරඟ කරුවන් අතර ඇස්තමේන්තු කරන ලද උද්ධමන අනුපාතිකයේ වෙනස සඳහා ගලපන ලද නාමික සඵල විනිමය අනුපාතිකය, වර්ෂය තුළදී සියයට 12 කින් අවප්‍රමාණය විය.

## 9.8 විදේශ වත්කම්

1997 අවසානයේ පැවැති එ.ජ. ඩොලර් දශ ලක්ෂ 3,132 හා සසඳ බැලීමේදී ශ්‍රී ලංකාවේ දළ විදේශ වත්කම් 1998 අවසානයේ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 2,907 ක් විය. 1998 වසර අවසානයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ දළ විදේශීය වත්කම් සියයට 2 කින් අඩු විය. විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල විදේශ ආයෝජනයන් පහත වැටීම හේතුකොටගෙන වාණිජ බැංකුවල දළ විදේශ වත්කම් 1997 වර්ෂයේ වූ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 1,103 සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 923 දක්වා පහත වැටිණි. විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක මගින් බාහිර ණය ගැනීම් අඩු වීමේ හේතුවෙන් වාණිජ බැංකුවල දළ විදේශීය වගකීම් වඩා වැඩි ප්‍රමාණයකින් (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 228 කින්) අඩු විය. ඒ අනුව, වාණිජ බැංකුවල ශුද්ධ විදේශ වත්කම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 48 කින් වර්ධනය විය. 1998 වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ රජයේ විදේශීය වත්කම් වලින් සමන්විත දළ නිල සංචිත එ.ජ. ඩොලර් දශ ලක්ෂ 1,984 දක්වා එ.ජ. ඩොලර් දශ ලක්ෂ 45 කින් පහත වැටුණි. කෙසේ නමුත් ජා.මූ.අ. ට ගෙවූ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 83 හා ආසියානු නිෂ්කාශණ සංගමයේ ශේෂයෙන් පියවීම් ඇතුළත් දළ නිල කෙටි කාලීන වගකීම් විශාල ලෙස පහත වැටුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශුද්ධ නිළ සංචිත එ..ජ. ඩොලර් දශ ලක්ෂ 37 කින් වර්ධනය වූ අතර එම ප්‍රමාණයේ අතිරික්තයක් සමස්ථ ගෙවුම් ශේෂයෙහි පෙන්නුම් කරන ලදී. 1998 වර්ෂය අවසානයේදී පැවැති මුළු විදේශ වත්කම් 1998 වර්ෂයේ මාස 5.9 ක ආනයන මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් වූ අතර දළ නිල සංචිත ප්‍රමාණය මාස 4 ක එම වර්ෂයේ ආනයන මූල්‍යනය කිරීමට ප්‍රමාණවත් විය.

## 9.9 විදේශීය ණය

1997 වර්ෂයේ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 8,197 ක් වූ ශ්‍රී ලංකාවේ මුළු විදේශීය ණය ප්‍රමාණය 1998 අවසානයේදී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 8,753 ක් දක්වා වැඩි විය. මෙම වැඩි වීමෙන් සියයට 85 කට වඩා වැඩි ප්‍රමාණයක්, විශේෂයෙන්ම එ.ජ. ඩොලරයට එරෙහිව ජපන් යෙන්හි ශක්තිමත් වීම ඇතුළත්ව, විනිමය අනුපාතිකයේ වෙනස්වීම

9.8 සංඛ්‍යා සටහන

**ශ්‍රී ලංකාවේ විදේශීය වත්කම්**

| ශීර්ෂය | එ.ජ.ඩොලර් දශලක්ෂ(අ) | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1994 | 1995 | 1996 | 1997 | 1998 | 1994 | 1995 | 1996 | 1997 | 1998 |
| 1. රජය (ආ) | 23 | 17 | 23 | 19 | 20 | 1,132 | 938 | 1,295 | 1,192 | 1,372 |
| 2. රාජ්‍ය නියෝජ්‍යකත්ව | - | - | - | - | - | - | - | - | - | - |
| 3. මහ බැංකුව (ඇ) | 1,999 | 2,046 | 1,915 | 2,009 | 1,964 | 99,859 | 110,521 | 108,506 | 123,093 | 132,900 |
| 4. මුළු නිල වත්කම් | 2,022 | 2,063 | 1,937 | 2,029 | 1,984 | 100,991 | 111,459 | 109,800 | 124,286 | 134,272 |
| 5. වෙළෙඳ බැංකු (ඈ) | 853 | 839 | 780 | 1,103 | 923 | 42,607 | 45,338 | 44,211 | 67,596 | 62,561 |
| 6. මුළු විදේශීය වත්කම් | 2,874 | 2,902 | 2,717 | 3,132 | 2,907 | 143,598 | 156,797 | 154,011 | 191,881 | 196,833 |
| 7. දළ නිල වත්කම් මගින් ආවරණය කළහැකි ආනයන මාස ගණන | | | | | | | | | | |
| 7.1 වෙළෙඳ භාණ්ඩ | 5.1 | 4.7 | 4.3 | 4.2 | 4.0 | | | | | |
| 7.2 භාණ්ඩ හා සේවා | 4.5 | 4.1 | 3.8 | 3.7 | 3.6 | | | | | |
| 8. මුළු වත්කම් මගින් ආවරණය කළහැකි ආනයන මාස ගණන | | | | | | | | | | |
| 8.1 වෙළෙඳ භාණ්ඩ | 7.2 | 6.6 | 6.0 | 6.4 | 5.9 | | | | | |
| 8.2 භාණ්ඩ හා සේවා | 6.5 | 5.8 | 5.3 | 5.7 | 5.2 | | | | | |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකඟවන ලද නියෝජන අනුපාතිකයට අනුව පරිවර්ත්‍ය කරන ලද මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ සමහර ශීර්ෂයන් හැර ඉතිරිය පහත සඳහන් කාලපරිච්ඡේද අවසානයේ වූ විනිමය අනුපාතිකයින්ට අනුව පරිවර්ත්‍ය කර ඇත.


| වර්ෂය | 1994 | 1995 | 1996 | 1997 | 1998 |
|---|---|---|---|---|---|
| එ.ජ.ඩොලර් එකකට රුපියල් | 49.98 | 54.05 | 56.71 | 61.29 | 67.78 |

(ආ) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් නමින් ඇති ගිණුමේ හර ශේෂයන් ඇතුලත් කිරීම සඳහා 1985 සිට සංඛ්‍යා සංශෝධනය කර ඇත.

(ඇ) වාණිජ බැංකු විසින් මහ බැංකුවේ තැන්පත් කර ඇති විදේශ මුදල් ගිණුම් වලට අදළ මුදල් සංචිත ඇතුලත් කිරීම සඳහා 1993 සිට සංඛ්‍යා සංශෝධනය කර ඇත.

(ඈ) 1994 සිට ගෙවුම් තුලන සංඛ්‍යා ලේඛන සැකසීමේදී විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක දේශීය බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකා ඇත. ඒ අනුව ගෙවුම් තුල සංඛ්‍යා ලේඛන සැකසීමේදී වි.ව්‍ය.මු.බැ.ඒ. හා අනේවාසිකයන් අතර ගණුදෙනු ඇතුලත් කරනු ලැබ ඇති අතර වි.ව්‍ය.මු.බැ.ඒ. හා නේවාසිකයන් අතර ගණුදෙනු ඉවත් කරනු ලැබ ඇත. විස්තර සඳහා විශේෂ සටහන් අංක 8හි 'ගෙවුම් ශේෂ තුලන සැකසීමේදී වි.ව්‍ය.මු.බැ.ඒ. ගණුදෙනු නැවත අර්ථකථනය කිරීම' මතවූ තාක්ෂණික සටහන බලන්න.

**9.7 රූප සටහන**
**විදේශීය වත්කම් (ත්‍රෛමාසිකව)**




නිසා ඇති වූවක් විය. මැදි හා දිගුකාලීන ණය ප්‍රමාණය මුළු ණය ප්‍රමාණයෙන් සියයට 94 ක් වූ අතර, එය ප්‍රධාන වශයෙන් ආසියානු සංවර්ධන බැංකුව, ජපානය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් ලැබුණු සහනදායි ආධාර වලින් සමන්විත විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලබාගෙන නොපියවා ඉතිරිව ඇති ණය ප්‍රමාණය මෙම වර්ෂය තුළ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 367 දක්වා සියයට 15 කින් අඩු විය.

1998 දී නොගෙවා ඉතිරිව ඇති මුළු ණය ප්‍රමාණයෙන් සියයට 79 ක් රජයේ ණය විය. ප්‍රධාන වශයෙන් ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව මහින් නිකුත් කරන ලද එ.ජ. ඩොලර් දශ ලක්ෂ 65 ක් වූ පාවෙන අනුපාතික නෝට්ටු ප්‍රමාණය නිසා 1998 වර්ෂය තුළදී රජයේ ඇප සහිත රාජ්‍ය සංස්ථාවල හා පෞද්ගලික අංශයේ නොපියවා ඉතිරිව ඇති ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 724

**9.9 සංඛ්‍යා සටහන**
**නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය (අ)**

| ශීර්ෂය | එ.ජ.ඩොලර් දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1994 | 1995 | 1996 | 1997 | 1998(ආ) | 1994 | 1995 | 1996 | 1997 | 1998 (ආ) |
| 1. මැදි හා දිගුකාලීන ණය | 7,788 | 8,152 | 7,988 | 7,719 | 8,266 | 389,232 | 440,570 | 452,944 | 473,043 | 560,279 |
| 1.1 රජයේ (ඇ) | 6,216 | 6,637 | 6,554 | 6,346 | 6,897 | 310,665 | 358,710 | 371,648 | 388,925 | 467,477 |
| 1.2 රජයේ ඇප සහිත රාජ්‍ය සංස්ථා | 696 | 640 | 637 | 670 | 724 | 34,802 | 34,582 | 36,098 | 41,061 | 49,052 |
| 1.3 රජයේ ඇප සහිත පෞද්ගලික අංශය | 261 | 279 | 267 | 270 | 278 | 13,027 | 15,066 | 15,144 | 16,521 | 18,854 |
| 1.4 ජා.මූ.අ.න් කළ ගැණුම් | 615 | 596 | 530 | 433 | 367 | 30,738 | 32,212 | 30,054 | 26,536 | 24,896 |
| 2. කෙටි කාලීන ණය | 510 | 542 | 498 | 478 | 487 | 25,487 | 29,309 | 28,262 | 29,323 | 33,001 |
| 2.1 රජය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 2.2 මහ බැංකුවේ ණය ගැනීම් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 2.3 අනෙකුත් (ඇ)(ඈ) | 510 | 542 | 498 | 478 | 487 | 25,487 | 29,309 | 28,262 | 29,323 | 33,001 |
| 3. මුළු ණය (1+2) | 8,298 | 8,694 | 8,486 | 8,197 | 8,753 | 414,719 | 469,879 | 481,206 | 502,366 | 593,280 |
| විශේෂිත අයිතමයන් | | | | | | | | | | |
| මැදි හා දිගු කාලීන ණය | | | | | | | | | | |
| 1. ව්‍යාපෘති ණය | 4,218 | 4,594 | 4,654 | 4,530 | 5,160 | 210,818 | 248,296 | 263,918 | 277,637 | 349,738 |
| 2. ව්‍යාපෘති නොවන ණය | 1,835 | 1,871 | 1,724 | 1,612 | 1,641 | 91,719 | 101,137 | 97,745 | 98,788 | 111,221 |
| 3. සැපයුම්කරුවන්ගේ ණය | 161 | 256 | 239 | 343 | 251 | 8,051 | 13,837 | 13,537 | 21,015 | 17,020 |
| 4. ජා.මූ.අ.ණය | 615 | 596 | 530 | 433 | 367 | 30,738 | 32,212 | 30,054 | 26,536 | 24,896 |
| 5. අනෙකුත් ණය (ඉ) | 959 | 834 | 841 | 801 | 847 | 47,907 | 45,088 | 47,690 | 49,067 | 57,405 |
| මුළු ණය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන් | 70.8 | 66.7 | 61.1 | 54.3 | 55.6 | 71.6 | 70.4 | 62.6 | 56.4 | 58.4 |
| කෙටිකාලීන ණය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන් | 4.4 | 4.2 | 3.6 | 3.2 | 3.1 | 4.4 | 4.4 | 3.7 | 3.3 | 3.2 |
| කෙටිකාලීන ණය මුළු ණයවල ප්‍රතිශතයක් වශයෙන් | 6.1 | 6.2 | 5.9 | 5.8 | 5.6 | 6.1 | 6.2 | 5.9 | 5.8 | 5.6 |

මූලයන් : ශ්‍රී ලංකා මහ බැංකුව
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

(අ) 1994 සිට ගෙවුම් තුලන දත්ත සැකසීමේදී විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (වි.ව්‍ය.මු.බැ.ඒ) අක් වෙරළ ඒකක ලෙස නොව දේශීය බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකන ලදී. නව සංස්කරණය යටතේ වි.ව්‍ය.මු.බැ.ඒ. ණය දේශීය ගණුදෙනු සේ සළකා නොපියවා ඉතිරිවූ විදේශීය ණය දත්තයන් සකසා ඇත. වැඩි විස්තර සඳහා විශේෂ සටහන් අංක 8 හි" ගෙවුම් තුලන සංඛ්‍යා ලේඛන සැකසීමේදී වි.ව්‍ය.මු.බැ.ඒ. ගණුදෙනු නැවත අර්ථකථනය" මතවූ තාක්ෂණික සටහන බලන්න.

(ආ) තාවකාලික


(ඇ) වැඩි මනත් තොරතුරු ඇතුලත් කිරීම සඳහා 1994 සිට සංඛ්‍යා සංශෝධනය කර ඇත.

(ඈ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහණ ණය සහ වෙනත් වෙළෙඳ ණය ඇතුලත් වේ.

(ඉ) රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය මගින් ගත් ණය ඇතුළුව දිගු කාලීන ණය

දක්වා සියයට 8 කින් වැඩි විය. 1997 දී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 54 ක් වූ සමස්ත විදේශීය ණය ප්‍රමාණය 1998 දී සියයට 56 දක්වා වැඩි විය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතට ගැනෙන ව්‍යවසායයන් ලබා ගත් ණය හේතුවෙන්; නොගෙවා ඉතිරිව ඇති කෙටිකාලීන ණය, වර්ෂය අවසානය වනවිට එ.ජ. ඩොලර් වටිනාකම් අනුව සියයට 2 කින් ඉහළ ගිය අතර, නොපියවා ඉතිරිව ඇති කෙටිකාලීන ණය සමස්ථ ණය ප්‍රමාණයෙන් සියයට 6 ක් පමණක් විය. මින් වැඩි ප්‍රමාණයක් අපනයන සැකසුම් කර්මාන්තවල අමු ද්‍රව්‍ය සැපයීම සඳහා වූ සැපයුම් කරුවන්ගේ ණය සහ ලංකා ඛනිජ තෙල් නීතගත සංස්ථාවේ වෙළෙඳ ණය වලින් සමන්විත විය.

**9.8 රූප සටහන**
**විදේශීය ණය**




සටහන : 1994 සිට විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (වි.ව්‍ය.මු.බැ.ඒ.) දේශීය බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකන ලදී.

## 9.10 ණය සේවා ගෙවීම්

මැදි හා දිගුකාලීන ණය ආපසු ගෙවීම් හා සියළු විදේශීය ණය වෙනුවෙන් කරන ලද පොලී ගෙවීම් අඩංගු ණය සේවා ගෙවීම් 1998 වර්ෂයේදී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 754 දක්වා සියයට 3 කින් වැඩි විය. මෙයට හේතු වූයේ ණය ආපසු ගෙවීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 37 කින් වැඩි වීමේ සහ ණය සඳහා පොලී ගෙවීම එ.ජ. ඩොලර් දශ ලක්ෂ 15 කින් අඩු වීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයයි. ණය ආපසු

**9.10 සංඛ්‍යා සටහන**
**ණය සේවා ගෙවීම්(අ)**

| ශීර්ෂය | එ.ජ.ඩොලර් දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1994 | 1995 | 1996 | 1997 | 1998(ආ) | 1994 | 1995 | 1996 | 1997 | 1998(ආ) |
| 1. ණය සේවා ගෙවීම් | 540 | 764 | 746 | 733 | 754 | 26,644 | 38,652 | 40,953 | 42,645 | 48,504 |
| 1.1 ණය ආපසු ගෙවීම් | 290 | 452 | 439 | 430 | 467 | 14,313 | 22,642 | 24,007 | 24,764 | 29,895 |
| (i) ජා.මූ.අරමුදලට | 13 | 33 | 47 | 66 | 83 | 616 | 1,184 | 2,314 | 3,290 | 5,100 |
| (ii) අනෙකුත් (ඇ) | 277 | 419 | 392 | 364 | 384 | 13,697 | 21,458 | 21,693 | 21,475 | 24,794 |
| 1.2 පොලී ගෙවීම් | 250 | 312 | 307 | 303 | 288 | 12,330 | 16,011 | 16,946 | 17,881 | 18,609 |
| (i) ජා.මූ.අරමුදලට | 7 | 8 | 7 | 6 | 6 | 348 | 407 | 409 | 361 | 376 |
| (ii) අනෙකුත් (ඇ) | 242 | 304 | 300 | 297 | 282 | 11,982 | 15,604 | 16,537 | 17,520 | 18,233 |
| 2. වෙළෙඳ භාණ්ඩ අපනයනය හා සේවාවන්ගේ ඉපැයීම | 3,954 | 4,627 | 4,861 | 5,514 | 5,648 | 195,347 | 237,137 | 269,159 | 325,885 | 365,316 |
| 3. වෙළෙඳ භාණ්ඩ අපනයන, සේවා හා පෞද්ගලික සංක්‍රාම | 4,833 | 5,644 | 5,878 | 6,670 | 6,861 | 238,812 | 289,215 | 325,420 | 394,122 | 443,782 |
| 4. ණය සේවා අනුපාතික (ඈ) | | | | | | | | | | |
| 4.1 2 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය | 13.7 | 16.5 | 15.3 | 13.3 | 13.4 | 13.6 | 16.3 | 15.2 | 13.1 | 13.3 |
| (ii) ජා.මූ.අරමුදලේ ගණුදෙනු හැර | 13.1 | 15.6 | 14.2 | 12.0 | 11.8 | 13.1 | 15.6 | 14.2 | 12.0 | 11.8 |
| 4.2 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය | 11.2 | 13.5 | 12.7 | 11.0 | 11.0 | 11.2 | 13.4 | 12.6 | 10.8 | 10.9 |
| (ii) ජා.මූ.අරමුදලේ ගණුදෙනු හැර | 10.8 | 12.8 | 11.8 | 9.9 | 9.7 | 10.8 | 12.8 | 11.7 | 9.9 | 9.7 |
| 5. රජයේ ණය සේවා ගෙවීම් | | | | | | | | | | |
| 5.1 රජයේ ණය සේවා ගෙවීම් (ඉ) | 324.1 | 342.2 | 378.5 | 393.4 | 417.0 | 15,749 | 17,888 | 20,947 | 24,060 | 26,063 |
| 5.2 1 හි ප්‍රතිශතයක් වශයෙන් | 60 | 45 | 51 | 54 | 55 | 59 | 46 | 51 | 56 | 54 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 1994 සිට ගෙවුම් තුලන දත්ත සැකසීමේදී විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක (වි.ව්‍ය.මු.බැ.ඒ.) අක් වෙරළ ඒකක ලෙස නොව දේශීය බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකන ලදී. නව සංස්කරණය යටතේ වි.ව්‍ය.මු.බැ.ඒ. ණය දේශීය ගණුදෙනු සේ සළකා නොපියවා ඉතිරිවූ විදේශිය ණය දත්තයන් සකසා ඇත. වැඩි විස්තර සඳහා විශේෂ සටහන් අංක 8 හි "ගෙවුම් තුලන සංඛ්‍යා ලේඛන සැකසීමේදී වි.ව්‍ය.මූ.බැ.ඒ. ගණුදෙනු නැවත ඵර්ථකථනය" මතවූ තාක්ෂණික සටහන බලන්න.
(ආ) තාවකාලික
(ඇ) වැඩිමනත් තොරතුරු ඇතුලත් කිරිමසඳහා 1994 පටන් සංඛ්‍යා සංශෝධනය කර ඇත.
(ඈ) වර්ෂය තුළ විනිමය අනුපාතිකයන්හි සිදුවූ වෙනස්වීම හේතුවෙන් රුපියල් වටිනාකම හා ඇ.එ.ජ.ඩොලර් වටිනාකම අනුව වෙන්වෙන් වශයෙන් ගත් කල ණය සේවා අනුපාතිකයන් වෙනස් වේ.
(ඉ) ජා.මූ.අරමුදලෙහි ගණුදෙනු හැර

ගෙවීම වැඩි වීමට හේතු වූයේ ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් සඳහා 1988 ත් 1990 ත් අතර සහ දීර්ඝ කරන ලද ව්‍යුහාත්මක ගැලපුම් ණය පහසුකම් සඳහා 1991 ත් 1994 ත් අතර කාලය තුළ ජා.මූ. අරමුදලින් ලබා ගත් ණය වෙනුවෙන් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 83 ක් ආපසු ගෙවීම සහ අනෙකුත් ණය ආපසු ගෙවීම එ.ජ. ඩොලර් දශ ලක්ෂ 384 දක්වා වැඩි වීමත් නිසාය. පොලී අනුපාතික අඩු වීමේ ලෝක ප්‍රවනතාවය හේතුවෙන් ණය සඳහා වූ පොලී ආපසු ගෙවීම සැලකිය යුතු ප්‍රමාණයකින් පහත වැටුණි.

සලකා බලන කාලය තුළ අපනයන ඉපයීම්වල මන්දගාමී වර්ධනයත්, ණය සඳහා පොලී ගෙවීම අඩු වීමත් යන දෙකෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් වශයෙන් 1997 සියයට 13.3 ක් වූ ණය සේවා අනුපාතය 1998 දී සියයට 13.4 ක් දක්වා සුළු වශයෙන් වැඩි විය. ණය සේවා ගෙවීම් භාණ්ඩ, සේවා සහ පෞද්ගලික සංක්‍රාමවල අනුපාතයක් වශයෙන් ගත් කල එය සලකා බලන කාලය තුළ සියයට 11 ක් ලෙස නොවෙනස්ව පැවතිණි.

## 9.11 විදේශීය වෙළෙඳ වාතාවරණය සහ ප්‍රතිපත්තිය

### ආනයන හා අපනයන පාලන

ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම හා තීරුබදු ප්‍රතිපත්තිය, තීරුබදු නොවන සීමාවන් ක්‍රමයෙන් අඩුකරමින් අවිධිමත් තීරුබදු අත්හැරීම් සහ බදු සහන මගින් ඇතිවන ව්‍යාකූලතා ක්‍රමයෙන් ඉවත් කරන අතරම, තීරුබදු අඩුකිරීම හා තීරුබදු ව්‍යුහය සරල කිරීම තුළින් වෙළඳාම හා තීරුබදු ව්‍යුහය තාර්කික කිරීම කෙරෙහි තවදුරටත් යොමුවිය. ආනයන සහ අපනයන සඳහා වූ බලපත්‍ර අවශ්‍යතාවයන් ප්‍රධාන වශයෙන් ජාතික ආරක්ෂාව, මහජන සෞඛ්‍යය, පරිසර සංරක්ෂණය සහ දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කිරීම වැනි කරුණු සඳහා අවශ්‍ය යැයි සැලකෙන හොඳින් නිර්වචනය කරන ලද පටු ලැයිස්තුවකට සීමාකර ඇත. දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කිරීමේ අරමුණින් ඉරිඟු ආනයනය බලපත්‍ර යටතේ පවත්වාගෙන යනු ලබන අතර, හරිත ආරක්ෂණ හේතූන් මත වී ආනයනය බලපත්‍ර යටතේ පවතී. රජය සහ ඇඹරුම් කම්හලක් වන ප්‍රීමා ලංකා සමාගම අතර පවතින ගිවිසුමෙහි කොන්දේසි සපුරාලනු පිණිස තිරිඟු සහ ධාන්‍ය, තිරිඟු පිටි සහ ධාන්‍ය පිටි 1998 දීද තවදුරටත් බලපත්‍ර පාලනය යටතේ පවත්වාගෙන යන ලදී. මෙතෙක් පවත්වාගෙන යනු ලැබූ සමහර සීමාවන් ලිහිල් කරන ලද අතර 1969 අංක 1 දරණ ආනයන සහ අපනයන පාලන පනතට, 1998 අප්‍රේල් 8 වන දින සිට බලපවත්වන පරිදි සිදුකළ සංශෝධනය මගින්, ආනයන සඳහා වන අත්තිකාරම් ගෙවීමේ ඉහළ සීමාව එ.ජ.ඩොලර් 3,000 සිට එ.ජ.ඩොලර් 7,500 දක්වා වැඩි කිරීමද එයට ඇතුලත් විය. මෙම වසර තුළදී තෝරාගන්නා ලද මෝටර් රථ කොටස් ආනයන බලපත්‍ර පාලනය යටතට ගන්නා ලදී. වසර තුනක් පැරණි පරිමා ධාරිතාව 3,250 ට අඩු ඩීසල් එන්ජින් සඳහා බලපත්‍ර අවශ්‍යතාවය වසර පහක් පැරණි එන්ජින් වශයෙන් සංශෝධනය කරන ලදී. වසර 5 කට වඩා පැරණි වාහන ආනයනය සඳහා ආනයනකරුවන් බලපත්‍ර ලබාගත යුතු වේ. කෙසේ වුවද, භාණ්ඩ ප්‍රවාහනය සඳහා භාවිතා කරන, වසර 7 කට වඩා අඩු කාලයක් පැරණි සමහර මෝටර් වාහන, බලපත්‍රයකින් තොරව ආනයනය කිරීමට 1998 නොවැම්බර් 17 ද සිට මාස 4 1/2 ක කාලයක් සඳහා ඉඩ සලසාදෙන ලදී. මෙය අවිධිමත් ප්‍රතිපත්තිමය වෙනසක් බැවින් මෙම තීරණය වර්තමාන ප්‍රතිපත්තිමය දිශාවට පරස්පර විරෝධී බවක් දක්වයි. සංක්ෂිප්ත වශයෙන් ගත් කල, රේගු දත්ත ලේබන අංකිත ක්‍රමයේ (Harmonised System Code -HSC) අංක 6 ක මට්ටමේ ඇති 6,000 ක් පමණ වන මුළු භාණ්ඩ සංඛ්‍යාවෙන් භාණ්ඩ 300 ක් පමණ 1998 අවසානය වනවිට ආනයන බලපත්‍ර යටතේ පැවතිණි.

පරිසරය සුරැකීමේ සහ පෞරාණික වස්තු ආරක්ෂා කිරීමේ අරමුණින් අපනයන වර්ග 4 ක් පමණක්, එනම් කොරල් කොටස් සහ සිප්පි කටු, දව සහ දව භාණ්ඩ (කළුවර), ඇත් දළ සහ ඇත්දළ නිෂ්පාදිත සහ 1945 ට පෙර ලියාපදිංචි කරන ලද මගී ප්‍රවාහන මෝටර් රථ යනාදිය අපනයන බලපත්‍ර යටතේ තවදුරටත් පවත්වාගෙන යන ලදී.

### විදේශීය වෙළෙඳම මත වූ තීරුබදු සහ අනෙකුත් බදු

එළඹෙන සහශ්‍ර වර්ෂයේ අභියෝගවලට මුහුණදීම සඳහා විදේශීය වෙළෙඳම සහ වාණිජ කටයුතු පහසුවෙන පරිදි පවතින රේගු පරිපාලන ක්‍රමය ප්‍රතිසංවිධානය කිරීමේ අරමුණින් අඩු තීරුබදු අනුපාතයන් සහිත සරල සහ විනිවිද පෙනෙනසුළු තීරුබදු ක්‍රමයක් මගින් අපනයන තරඟකාරිත්වයක් ඇතිකිරීමට යෝග්‍ය වූ වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීමෙන් අපනයන මූලික වූ වර්ධනයක් දිරිගැන්වීම කෙරෙහි ශ්‍රී ලංකාවේ තීරුබදු ප්‍රතිපත්තිය යොමු විය. මේ සම්බන්ධයෙන්, තීරුබදු ව්‍යුහය අධ්‍යයනය කොට වඩාත් සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා රජය මගින් 1997 දී පත්කරන ලද තීරුබදු පිළිබඳ ජනාධිපති කොමිසම, ඔවුන්ගේ නිර්දේශ 1998 ජූලි මාසයේදී ඉදිරිපත් කරන ලදී. තීරුබදු පිළිබඳ ජනාධිපති කොමිසම මගින් පවත්නා තීරුබදු පහළ දැමීමට සහ අදියර දෙකකින්, තීරු දෙකකින් යුත් තීරුබදු ක්‍රමයක් කරා යොමුවීමටද නිර්දේශ කරන ලදී. මෙම නිර්දේශ අනුව යමින් 1995 පෙබරවාරි සිට ක්‍රියාත්මක වූ 10, 20 සහ 35 යන ප්‍රතිශත වලින් යුත් තීරු තුනේ තීරුබදු ක්‍රමය වෙනුවට 1998 නොවැම්බර් 6 වන දින සිට බලපැවැත්වෙන පරිදි 5,10 සහ 30 යන ප්‍රතිශත වලින් යුත් තීරු තුනේ තීරුබදු ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය නොකරන සියළුම කාර්මික අමුද්‍රව්‍ය සහ යාන්ත්‍රික උපකරණ සියයට 5 තීරුව යටතේ වර්ගීකරණය කරන ලදී. තීරුබදු ව්‍යුහය තීරු දෙකේ බදු ක්‍රමයක් දක්වා තවදුරටත් ඒකාබද්ධ කිරීම වසර 2000 දී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

### 9.11 වැනි සංඛ්‍යා සටහන
### සඵල ආනයන බදු එකතු කිරීමේ අනුපාතය (අ)

| වර්ගය | 1996 | 1996 | 1997(ආ) | 1998(ඇ) |
|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | **10.7** | **10.3** | **11.7** | **12.7** |
| ආහාරපාන වර්ග | **10.1** | **9.1** | **11.4** | **12.6** |
| සහල් | 38.5 | 0.3 | 6.3 | 2.4 |
| පිටි | 0.0 | 2.3 | 0.0 | 0.0 |
| සීනි | 14.6 | 15.9 | 17.8 | 20.8 |
| තිරිඟු හා ධාන්‍ය | 0.0 | 0.0 | 0.0 | 0.0 |
| කිරි හා කිරි නිෂ්පාදන | 11.5 | 11.5 | 11.8 | 11.5 |
| කරවල | 2.0 | 2.1 | 1.6 | 1.1 |
| වෙනත් මාළු නිෂ්පාදන | 4.6 | 4.2 | 4.9 | 4.8 |
| වෙනත් ආහාර | 18.7 | 19.0 | 17.9 | 20.5 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | **11.8** | **12.6** | **12.2** | **12.8** |
| මෝටර් රථ හා සයිකල් | 21.7 | 24.3 | 24.5 | 23.6 |
| ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී යන්ත්‍ර | 6.9 | 12.1 | 11.5 | 12.4 |
| රබර් ටයර් හා ටියුබ් | 33.6 | 32.5 | 33.5 | 32.0 |
| බෙහෙත් හා ඖෂධ | 1.5 | 1.5 | 1.3 | 0.9 |
| ආහාර නොවන වෙනත් ද්‍රව්‍ය | 11.1 | 10.6 | 9.4 | 10.1 |
| **අන්තර් භාණ්ඩ** | **9.1** | **8.1** | **5.9** | **4.7** |
| පොහොර | 0.0 | 0.0 | 0.1 | 0.0 |
| බොර තෙල් | 41.1 | 33.5 | 21.7 | 26.4 |
| වෙනත් ඛනිජ තෙල් | 23.4 | 24.6 | 18.7 | 16.7 |
| රසායන ද්‍රව්‍ය හා සංයෝග | 9.8 | 7.6 | 7.6 | 5.8 |
| ඩයි වර්ග පදම් කිරීමේ හා වර්ණ වර්ග | 8.8 | 8.2 | 7.1 | 7.5 |
| කඩදාසි හා ඝන කඩදාසි | .8 | 6.9 | 6.0 | 6.0 |
| රෙදිපිළි හා ඇඟළුම් | 1.0 | 1.1 | 0.8 | 0.1 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 9.2 | 5.7 | 5.2 | 4.8 |
| **ආයෝජන භාණ්ඩ** | **10.1** | **7.6** | **7.0** | **6.0** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 8.7 | 9.3 | 9.1 | 9.3 |
| ගමනාගමන උපකරණ | 21.6 | 18.9 | 17.3 | 11.8 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 6.2 | 3.9 | 3.4 | 3.0 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 10.1 | 6.7 | 6.3 | 4.4 |
| **එකතුව** | **9.7** | **8.5** | **7.7** | **7.4** |

මූලයන් : ශ්‍රී ලංකා රේගුව
සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

(අ) මුළු තීරුබදු එකතුව මුළු ආනයන වටිනාකමෙහි (පි.ර.ග) ප්‍රතිශතයක් ලෙස
(ආ) සංශෝධිතයි
(ඇ) තාවකාලිකයි

භාණ්ඩ සුළු ප්‍රමාණයක්, තීරු තුනේ තීරුබදු ව්‍යුහයෙන් පිටත පවත්වාගන්නා ලදී. තීරුබදු ව්‍යුහය සරල කිරීමේ හා විෂමතා අවම කිරීමේ අරමුණින් තීරුබදු ව්‍යුහය නිසි පරිදි සකස් කිරීමට යොමු වූ වර්තමාන ප්‍රතිපත්තියට අනුකූලව මෝටර් රථ සහ ජීප් රථ ආනයන සඳහා වූ සියයට 50-100 පරාසයක පැවතුනු තීරු බද්ද සියයට 30 ක ඒකීය බද්දක් ලෙස අඩුකරන ලදී. කෙසේවුවද, රජයේ අයබදු ඉලක්ක ආරක්ෂාකර ගැනීම සඳහා සියයට 10 ක නිෂ්පාදන බද්දක් පනවන ලදී. 1997 නොවැම්බර් 6 දින සිට තීරු තුනේ බදු ව්‍යුහයෙන් පිටත පවත්වාගෙන යනු ලැබූ, බොරතෙල් සහ ඛනිජතෙල් නිෂ්පාදිත සඳහා වූ ආනයන බද්ද සියයට 25 සිට සියයට 30 ක ඉහළ අනුපාතයක් දක්වා වැඩිකරන ලදී. අදාළ ක්‍රියාපටිපාටි සරල කිරීම සඳහා ප්‍රවාහන, පණිවිඩ හුවමාරු සහ වෛද්‍ය උපකරණ සඳහා ලබාදුන් බදු සහන තීරුබදු රහිත භාණ්ඩ යටතට වර්ගීකරණය කරන ලදී. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා කටයුතු ජාත්‍යන්තර තත්ත්වයට ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රීඩා භාණ්ඩ ආනයනද බදු වලින් නිදහස් කරන ලදී. දේශීය කෘෂිකාර්මික අංශය මැදිකාලීනව අඩු මට්ටමක තීරුබදු ක්‍රමයකට හැඩ ගැසීමට ඉඩදීම සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන මත ආනයන බද්ද වර්තමානයේ පවතින සියයට 35 ක මට්ටමෙහිම පවත්වා ගන්නා ලදී. කෙසේ වුවද, කෘෂිකාර්මික බීජ වර්ග සහ රෝපණ ද්‍රව්‍ය ආනයන තීරුබදු රහිතව පවත්වා ගන්නා ලදී. භාණ්ඩ කිහිපයක් පමණක් සියයට 20 ක තීරු මට්ටම යටතේ පවත්වාගත් අතර සීමිත භාණ්ඩ කිහිපයක්, එනම්, සීනි, දුම්කොළ සහ මත්පැන් තීරුතුනේ බදු ක්‍රමයෙන් පිටත විශේෂ බදු අනුපාත යටතේ පවත්වා ගන්නා ලදී.

තීරුබදු වලින් නිදහස් භාණ්ඩ ලැයිස්තුව 1997 නොවැම්බර් මාසයේදී 26 සිට 39 දක්වා ඉහළ ගිය අතර බීජ, පලතුරු සහ රෝපණය සඳහා ආනයන කරන ලද සියුම් බීජ සහ පැල සහ ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා ආනයනය කරන ලද රත්රන්, දළ දියමන්ති ගල්, දියමන්ති කුඩු ලැයිස්තුවෙන් ඉවත් කිරීමෙන් සහ සමහර ඖෂධ වර්ග සහ කිරි, එළවළු සහ පලතුරු යුෂ ඇසිරීමට භාවිතා කරන ඇසුරුම් ද්‍රව්‍ය 1998 නොවැම්බර් 6 වන දින සිට බලපවත්වන පරිදි ඇතුලත් කිරීමෙන් නැවත ලැයිස්තුව සංශෝධනය කෙරිණි. තීරුබදු වලින් නිදහස් කරන ලද ද්‍රව්‍ය ලැයිස්තුව 39 ක්ව පැවතිණි. 1992 අවසාන භාගයේ සිටම අපනයන අංශය සියළුම අපනයන බදු සහ වටිනාකම අනුව පනවන බදු වලින් නිදහස්ව පැවති අතර සමහර ද්‍රව්‍ය සඳහා පැවති අපනයන සෙස් බදු සහ පුරස්කාර 1998 වසරේදීද පවත්වා-ගන්නා ලදී.

ආනයන සඳහා පැවති 8,12 සහ 18 යන අනුපාත වලින් යුත් තීරු තුනේ පිරිවැටුම් බදු ක්‍රමය වෙනුවට 1998 අප්‍රේල් 1 වැනි දින සිට බලපවත්වන පරිදි සියයට 12.5 ක තනි සාමාන්‍ය අනුපාතයකින් යුත් භාණ්ඩ හා සේවා බද්දක් (භා.සේ.බ.) ක්‍රියාත්මක කරන ලදී. භාණ්ඩ හා සේවා බද්ද යටතේ සියළුම අපනයන ශූන්‍ය අනුපාතයකට යටත් වන අතර අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය කිහිපයක් පමණක් එම බද්දෙන් නිදහස් කර ඇත. ලැයිස්තුවෙන් නිදහස්කර ඇති ද්‍රව්‍ය හෝ ශූන්‍ය අනුපාත යටතේ වර්ග කර ඇති ද්‍රව්‍ය හැරුණුකොට තීරුබදු රහිත හෝ සහිත සියළුම ආනයන භා.සේ. බද්දට යටත් වේ.

වර්තමාන ප්‍රතිපත්තිවල අරමුණු අනුව යමින් ජාතික වැදගත්කමක් ඇති ඉතා අත්‍යාවශ්‍ය භාණ්ඩ කිහිපයකට පමණක් ආනයන බදු සහන සීමා කරන ලදී. තීරුබදු ව්‍යුහයෙහි ඇතිවන ව්‍යාකූලතාවයන් අවම කිරීමේ අරමුණින්, සම්පූර්ණයෙන් බදු අත්හැරීම සිදු කළ පූර්ණ හෝ පියලි කළ පරිප්පු (සියයට 35 බදු තීරුව), කරවල, වියලි හාල්මැස්සන් සහ වියලි ඉස්සන්, සතුන් බෝකිරීම් සඳහා යොදගන්නා සජීවී සතුන් සහ සංවිධිත ප්ලෝරොසන්ට් ලාම්පු (සියයට 10 බදු තීරුව) සහ ටින්මාළු (සියයට 10 බදු තීරුව) සඳහා වූ අර්ධ බදු අත්හැරීම් 1998 නොවැම්බර් 6 සිට බලපැවැත්වෙන පරිදි තීරු බදුවලින් නිදහස් කරන ලදී. කිරිපිටි සඳහා (සියයට 20 බදු තීරුව) වන සියයට 10

අර්ධ බදු අත්හැරීමද, තීරු බදු ව්‍යුහයේ පැවති සියයට 20 අනුපාතයේ සිට සියයට 10 අනුපාතය දක්වා අඩු කිරීමෙන් ඉවත් කරන ලදී. තීරුබදු ව්‍යුහයෙහි විෂමතා ඉවත් කිරීම සඳහා විටමින්වලට ලබාදී තිබූ පූර්ණ බදු අත්හැරීම 1998 නොවැම්බර් 6 සිට බලපැවැත්වන පරිදි බදු නිදහස් කිරීමේ ලැයිස්තුවට ඇතුළත් කරන ලදී.

මහ කන්නයේ සාර්ථක අස්වැන්න හේතුවෙන් 1997 නොවැම්බර් 20 දින හඳුන්වා දුන් සහල් සඳහා වූ පූර්ණ බදු අත්හැරීම (සියයට 35 බදු තීරුව) 1998 ජනවාරි 31 දින ඉවත් කරන ලදී. 1997 නොවැම්බර් 27 සිට 1998 ජනවාරි 31 දක්වා කාලසීමාව තුළදී අල සහ ළූණු සඳහා සියයට 15 ක අර්ධ බදු අත්හැරීමක් ලබාදෙන ලදී. සීනි ආනයන සඳහා 1997 අගෝස්තු 11 ද සිට බලපවත්නා පරිදි පනවන ලද සියයට 10 ක්වූ අර්ධ බදු අත්හැරීම 1998 ජනවාරි 16 ද සිට කිලෝග්‍රෑමයට රු. 3.50 බැගින් වන විශේෂ බදු අනුපාතයක් දක්වා වෙනස් කරන ලදී. පොල්තෙල් හැර කෑමට ගන්නා වෙනත් තෙල්වර්ග සඳහා 1997 ජනවාරි 13 දින සිට බලපවත්වන පරිදි මාස 18ක් සඳහා ලබාදුන් සියයට 20 ක අර්ධ බදු අත්හැරීම 1998 ජූනි 18 ද සිට බලපවත්වන පරිදි සියයට 30 දක්වා වැඩි කරන ලදී. 1997 ජනවාරි 13 දින සිට කොප්පරා සඳහා ලබාදුන් සියයට 20 ක් වූ අර්ධ බදු සහනය නොවෙනස්ව පවත්වා ගන්නා ලදී. වැඩි ආහාර මිල හේතුවෙන් ඉහළ යමින් පවතින ජීවන වියදමට සහනයක් සැලසීම සඳහා, තිරිඟු ඇට සඳහා ලබාදී තිබූ අර්ධ බදු අත්හැරීම (සියයට 20) වසර තුළ දිගටම පවත්වාගන්නා ලදී.

අන්තර් භාණ්ඩවලට සහන සැලසීමක් වශයෙන් ඉතා සීමාසහිත බදු අත්හැරීම ප්‍රමාණයක් ප්‍රදානය කරන ලදී. පිටි නිෂ්පාදිත සඳහා සාධාරණ මිලකට අමුද්‍රව්‍ය ලබාගැනීමට හැකිවීම පිණිස මහා පරිමාණයේ නිෂ්පාදකයන්ට තිරිඟු පිටි ආනයනය කිරීමට ඉඩ සැලසීම සහ ඒ සඳහා පූර්ණ බදු අත්හැරීමක් ලබාදීමත් 1998 ජනවාරි 21 දින සිට බලපවත්වන පරිදි ක්‍රියාත්මක කරන ලදී. ඉස්සන්ගේ ආහාර සඳහා පූර්ණ බදු අත්හැරීමක් 1996 අගෝස්තු 24 සිට 1998 අගෝස්තු 23 කාලසීමාව තුළදී ප්‍රදානය කරන ලද අතර 1998 ජනවාරි 1 ද සිට වසරක කාලසීමාවක් සඳහා ආසන 30 හෝ ඊට වැඩි ප්‍රමාණයක් සහිත බස්රථ සඳහා පූර්ණ බදු අත්හැරීමක් ලබාදෙන ලදී. සේවකයන්ට ප්‍රවාහන පහසුකම් සැපයීම පිණිස සේවායෝජකයන් දිරිගැන්වීම සඳහා ආසන 15 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සහිත කෝච් රථ සඳහා 1998 මාර්තු 16 ද සිට බලපවත්වන පරිදි වසරක කාලසීමාවක් සඳහා පූර්ණ බදු අත්හැරීමක් ලබාදෙන ලදී. ආයෝජන මණ්ඩල තත්ත්වයේ පහසුකම් ලබන පුද්ගලික මාධ්‍ය ආයතන සමඟ තරඟ කිරීමට හැකියාවක් ඇති කිරීම සඳහා 1997 මැයි 7 ද සිට රාජ්‍ය විද්‍යුත් මාධ්‍ය ආයතනවලට මාධ්‍ය උපකරණ සඳහා පූර්ණ බදු අත්හැරීමක් ලබාදෙන ලදී.

මෙම සියළු සංශෝධන සමඟ 1997 ක්‍රියාත්මක වූ විදුලි උත්පාදක යන්ත්‍ර, එල්.පී.ගෑස්, ඛනිජතෙල් නිෂ්පාදිත, කැරලි ආකාරයෙන් යුත් කපු නූල් සහ සජීවි එළවන් සඳහා ලබාදුන් බදු අත්හැරීම් ඉවත් කිරීම නිසා 1997 වසරේ බදු අත්හැරීම් හේතු කොට රජයට අහිමිව ගිය රුපියල් දශලක්ෂ 11,550 ක්වූ බදු මුදල් 1998 වසරේදී රුපියල් දශලක්ෂ 6,245 දක්වා අඩුකර ගැනීමට හැකිවිය. විවිධ ද්‍රව්‍ය සඳහා තනි පුද්ගලයන්ට ලබාදුන් බදු අත්හැරීම අඩුකිරීමද මෙම වර්ධනයට හේතුවිය. මෙම බදු අත්හැරීම් සහ සහන, ජාතික අවශ්‍යතා අරමුණු ඉටුකිරීමට අනුග්‍රහයක් දක්වූවද, මෙවැනි අවිධිමත් බදු අත්හැරීම් මගින් අවිනිශ්චිත බව ඇති කරන අතර කාර්යක්ෂම වෙළඳපොළක් වර්ධනය වීමට බාධා ඇතිවේ. එසේ වුවද ව්‍යාකූලතා අවම කිරීමේ නැඹුරුවක් පැහැදිලිව පෙන්නුම් කරන ප්‍රතිපත්ති මාර්ගයක් මෑත අතීතයේ වෙළඳ හා තීරුබදු පරිපාලන ක්‍රමය තුළ දක්නට ලැබිණි.

බදු අනුපාත සහ බද්දට යටත්වන ආනයන අඩුවීම පිළිබිඹු කරමින්, සාමාන්‍යය ආනයන බදු අනුපාතය එනම්, ආනයන බදු එකතුව සහ ගලපන ලද මුළු ආනයන අතර අනුපාතය 1997 පැවති සියයට 7.7 සිට සියයට 7.4 දක්වා 1998 වසරේදී පහත වැටුණි. අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ වලින් බද්දට යටත්වන ආනයනවල අඩුවීම පිළිබිඹු කරමින් බද්දට යටත් වන ආනයන හා මුළු ආනයන අතර අනුපාතය 1997 පැවති සියයට 37.0 සිට 1998 වසරේදී සියයට 35.4 දක්වා අඩුවිය. සමහර අමුද්‍රව්‍ය සඳහා 1998 අයවැයෙන් ලබාදුන් බදු සහනවල බලපෑම හේතුවෙන් අන්තර් භාණ්ඩ කාණ්ඩයෙහි, සාමාන්‍ය බදු අනුපාතය 1997 පැවති සියයට 5.9 සිට සියයට 4.7 දක්වා පහත වැටුණි.

ආයෝජන භාණ්ඩ සඳහා විශේෂයෙන්ම ප්‍රවාහන භාණ්ඩවල, සාමාන්‍ය තීරුබදු අනුපාතයද 1998 දී පහත වැටුණි. ට්‍රැක්ටර්, ලොරි පස් කපන යන්ත්‍ර ශීතනය කළ ට්‍රක්රථ සහ ට්‍රැක්ටර් නිපදවීමට අවශ්‍ය ද්‍රව්‍ය සඳහා 1998 අයවැයෙන් සලසන ලද බදු සහන මාලාවක් සහ විශාල වාණිජ ආයතනවලට සිය සේවකයන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීමට අවශ්‍ය බස්රථ සහ කෝච් රථ ආනයනයන් වෙනුවෙන් සපයන ලද බදු අත්හැරීම් මෙම පහත වැටීම්වලට හේතුවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රවාහන උපකරණ සඳහා සාමාන්‍ය තීරුබදු අනුපාතය 1997 පැවති සියයට 17.3 සිට 1998 වසර තුළදී සියයට 11.8 දක්වා පහත වැටුණි.

පාරිභෝගික භාණ්ඩ කාණ්ඩයේ ආහාර සහ පාන වර්ග සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ කාණ්ඩ දෙකේම ආනයන සඳහා සාමාන්‍ය තීරුබදු අනුපාතය ඉහළ නැංවිණි. ආහාර සහ පාන වර්ග කාණ්ඩයෙහි තීරුබදුවල ඉහළයෑම ප්‍රධාන වශයෙන්ම සීනි ආනයන මගින් පිළිබිඹු විය. සීනි සඳහා ලබාදුන් බදු අත්හැරීම 1997 අගෝස්තු 11 දින සියයට 17 සිට සියයට 10 දක්වා අඩුකිරීමෙන් හා 1998 ජනවාරි 16 සිට විශේෂ බද්දක් බවට වෙනස් කිරීමෙන් ඇතිවූ බලපෑම 1998 වසරේ පැවති සැලකියයුතු ලෙස ඉහළ ගිය සාමාන්‍ය බදු අනුපාතයෙන් පිළිබිඹු විය. ආහාර නොවන පාරිභෝගික ද්‍රව්‍ය සඳහා බදු අනුපාතයේ ඉතා සුළු ආන්තික වෙනසක් පමණක් පෙන්නුම් කෙරිණි.

## රෙදිපිළි සහ ඇඟළුම් පංගු ප්‍රමාණයන් වෙන් කිරීම

1995 දී හඳුන්වා දෙන ලද අපනයනකරුවන්ගේ ක්‍රියාකාරිත්වය මත පදනම් කර ගත් පංගු වෙන් කිරීමේ ක්‍රමය 1998 දීද ක්‍රියාත්මක විය. පංගු කාණ්ඩ යටතට ගැනෙන නිෂ්පාදන නැව්ගත කිරීමට අවසර දෙන ලද්දේ සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් ගෙවීම ඔප්පු කිරීමෙන් පසු පමණි. අළුත් පංගු වෙන් කිරීමේදී නව ආයෝජනයන් සිදු කල හෝ සිය වර්තමාන ධාරිතාව පුළුල් කල අපනයනකරුවන් සඳහා ප්‍රමුඛත්වය දෙන ලදී. ක්‍රියාකාරිත්වය මත පදනම් කර ගත් පංගු වෙන් කිරීමෙන් පසු ඉතිරි පංගු ප්‍රමාණය වෙන් කිරීම සිදු කරන ලද්දේ ප්‍රධාන සංචිත පංගු (pool quota) ක්‍රමය යටතේ සේවකයන්-ගේ අනුපාතය මත වූ අතර, එහිදී පංගු ප්‍රමාණ අදල නොවන රටවලට අපනයන කරන්නන්ට සහ පංගු ප්‍රමාණ අදළ වන රටවලට පංගු ප්‍රමාණ යටතට නොගැනෙන ඇඟළුම් වර්ග අපනයන කරන්නන්ට ප්‍රමුඛත්වයක් ලබා දුණි. පසුගිය වසරේ අඩු උපයෝජනයක් ඇති කාණ්ඩ 'අක්‍රිය' (cold) කාණ්ඩ ලෙස නම් කල අතර, ඒවා වෙන් කිරීම සිදු කරන ලද්දේ නැව්ගත කිරීම වැඩ කරන දින හතක් තුළ සිදු කල යුතුය යන කොන්දේසිය මතය. සංචිත පංගු වෙන්කිරීමේ ක්‍රමය යටතේ භාවිතා කළ විවිධ ක්‍රම තුළ පැවති දුෂ්කර පිලිවෙත් වලින් පෙන්නුම් කෙරෙන්නේ උපරිම උප-යෝජනයක් ලබා ගැනීම සඳහා වඩා දුපරීක්ෂාකාරී අධීක්ෂණයක් සහ පාලනයක් අවශ්‍ය බවයි. 1998 වසරේ ඇමෙරිකා එක්සත් ජනපදය සඳහා පිරිමින්ගේ සහ පිරිමි ළමුන්ගේ කබා සහ කමිස වැනි වර්ගවලට පංගුවල අධි උපයෝජනයක් පැවතීම නිසා ඇමෙරිකා එක්සත් ජනපද රජයෙන් සිදු විය හැකි තහනම් පැනවීම වැළැක්වීමට රෙදිපිළි පංගු මණ්ඩලයට සිදු වීම හේතුවෙන් පංගු පරි-පාලනයෙහි කිසියම් අවුල් ස්වභාවයක් ඇති විය.

නම්‍ය කොන්දේසි යටතේ ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපීය සංගමය සහ කැනඩාව සඳහා ලැබී ඇති පංගු ප්‍රමාණ පිළිවෙලින් සියයට 3, සියයට 13 සහ සියයට 8 කින් වැඩි විය. ඒ අනුව 1998 වසර තුළදී ලැබී ඇති සමස්ත පංගු ප්‍රමාණය සියයට 5 කින් වැඩි විය. සමස්ත පංගු උපයෝජන අනුපාතය පසුගිය වසරේ පැවති සියයට 74 හිම පැවතිණ. විවිධ කාණ්ඩ සහ විවිධ රටවල් අනුව පංගු උපයෝජනයේ පුළුල් වෙනසක් පෙන්නුම් කරන ලදී. නියමිත ඒකක සඳහා ඉල්ලුම ප්‍රමාණවත් නොවීම සහ දේශීය නිෂ්පාදකයන් ඔවුන්ගේ ධාරිතාවය වැඩි වටිනාකමක් ඇති වෙනත් පංගු කාණ්ඩ නිෂ්පාදනයට යෙදවීම හෝ පංගු යටතට නොගැනෙන ඇඟළුම් නිෂ්පාදනය යනාදිය පංගු උපයෝජනය අඩු වීමට බලපෑ හේතුන් අතර විය. පංගු ප්‍රමාණවලට අයත් නොවන ඇඟළුම් අපනයන ඉහළ යාම සහ ඇමෙරිකා එක්සත් ජනපද සහ කැනේඩියානු වෙළෙඳපළවලට සපයන ලද වඩා ජනප්‍රිය කාණ්ඩවලට අයත් ඇඟළුම්වල අධි උපයෝජනයක් පෙන්වීම තුළින් මේ බව විද්‍යාමාන වේ. පංගු උපයෝජනයේ කැපී පෙනෙන ඉහළ යාමක් පෙන්නුම් කල වර්ග අතර පිරිමින්ගේ සහ පිරිමි ළමුන්ගේ කබා, පිරිමින්ගේ සහ පිරිමි ළමුන්ගේ කමිස, ගැහැණුන්ගේ සහ ගැහැණු ළමුන්ගේ කබා සහ ඇඳුම්, කමිස සහ හැට්ට, ගැහැණුන් සහ ගැහැණු ළමුන්ගේ ඇඳුම් කට්ටල සහ කමිස, රාත්‍රි ඇඳුම්, ගවුම්, කබා සහ දිග කලිසම් වේ. එම වෙළෙඳපොළ සඳහාම, සාය සහ තුවා වැනි ඒකක සඳහා ලැබී ඇති පංගු ප්‍රමාණය සහ උපයෝජනය 1997 ට වඩා ඉහළ මට්ටමක පැවතිණි. ඒ සමඟම සමහර වර්ග සඳහා ලැබී ඇති පංගු ප්‍රමාණය ඉහළ ගියද, ඒවා සඳහා උපයෝජනය අඩු මට්ටමක පැවතිණි. යුරෝපීය සංගමයෙන් ලැබී ඇති පංගු ප්‍රමාණය ඉහළ ගියද, සෑම වර්ගයක් සඳහාම පංගු උපයෝජන අනුපාතය පහළ වැටුණි. කැනේඩියානු පංගු ප්‍රමාණ සලකා බැලීමේදී සතුටුදායක මටටමක පංගු උපයෝජනයක් පෙන්නුම් කළේ කාණ්ඩ කිහිපයක් පමණි. පංගු වෙන් කර ඇති රටවලට යවන ලද ඇඟළුම් අපනයන සඳහා සියයට 9 ක වර්ධනයක් පෙන්නුම් කලද, පංගු ක්‍රමය යටතේ අපනයන කල ඇඟළුම්වල අනුපාතය 1996 පැවති සියයට 63 සිට සියයට 62 දක්වා 1997 වසරේදී පහත වැටිණි. ඇමෙරිකා එක්සත් ජනපදයට පංගු ක්‍රමය යටතේ අපනයන 1996 පැවති සියයට 88 සිට 1997 වසර තුළ සියයට 83 දක්වා පහත වැටුණු අතර, යුරෝපීය සංගමයට සහ කැනඩාවට පංගු අනුපාත පිළිවෙලින් සියයට 28 සහ සියයට 87 පැවතිනි.

පංගු ක්‍රමය තවදුරටත් රෙදිපිළි සහ ඇඟළුම් වෙළෙඳ-මෙහි වැදගත් පාලනයක් ලෙස ක්‍රියා කරයි. රෙදිපිළි සහ ඇඟළුම් පිළිබඳ උරුගුවේ සම්මුතියට අනුව වසර 2005 දී පංගු ප්‍රමාණ සම්පූර්ණයෙන්ම ඉවත් වීම සිදු වනතුරු, පවත්නා රාමුව තුළ සම්පූර්ණ විභවතාවයකින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ප්‍රශස්ත මට්ටමකින් පංගු උපයෝජනය සිදු කිරීම තහවුරු කළයුතුව ඇත. එබැවින් පංගු පරිපාලනය කාර්යක්ෂමව සිදු කළයුතුව ඇත. වෙළෙඳපොළ මුල් කොටගත් පංගු වෙන්දේසි ක්‍රමයක් හරහා පංගු බෙද දීම පංගු උපයෝජනයේදී වඩා හොඳ ප්‍රතිඵල ලබා දෙන ක්‍රමයක් විය හැකි වුවද, නව ආයෝජනයන් සඳහා දිරි ගැන්වීම, කලාපීය කර්මාන්තශාලා ඇති කිරීම සහ වැඩිපුර රැකියා අවස්ථා ඇති කිරීම වැනි අවශ්‍යතාවයන් ශ්‍රී ලංකාවේ පංගු පරිපාලනය තුළට ඇතුල් වී ඇත. පංගු වෙන් කිරීමේ ක්‍රමය තුළ මූලික වෙනසක් ඇති කිරීමට අවශ්‍යතාවයක් නැති විය හැකි වුවද, පංගු ක්‍රමය නිසි පරිදි බාධාවකින් තොරව ක්‍රියාකාරී වීම තහවුරු කිරීම තුළින් රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්තය සහ වෙළෙඳාම් වර්ධනය බාධාවකින් තොරව පවත්වාගෙන යාම පංගු පරිපාලකයන්ගේ වගකීම වේ. එවිට රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්තයෙහි හා වෙළෙඳමෙහි වර්ධනයට බාධා නොපැමිණෙනු ඇත. පරිහානියට පත් වී ඇති ලෝක වෙළෙඳපොළ තත්ත්ව යටතේ ලෝකයේ සැපයුම්කරුවන් අතර තරඟකාරිත්වය වැඩි වී තිබීම නිසාත්, වසර 2005 න් පසු පංගු වලින් තොර වෙළෙඳ වාතාවරණයක් යටතේ වැඩි තරඟකාරිත්වයකට මුහුණ දීම පිණිස දුෂ්කරතාවන් ගෙන් තොරව අවතීර්ණය වීම සඳහාත් මෙය වඩාත් වැදගත් වේ.

## අපනයනකරුවන් සඳහා දිරි ගැන්වීම

අපනයනකරුවන් සහ අනෙක් කර්මාන්තකරුවන් ඉලක්ක කරමින් 1998 අයවැයෙන් යෝජනා කරන ලද විවිධ දිරි ගැන්වීම්, රජය මගින් 1998 වසර තුළදී ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, කෘෂිකර්මාන්තය නවීකරණය කිරීමට

අවශ්‍ය හරිත නිවාස රෝපණය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ඇසුරුම් ද්‍රව්‍ය, ශීතාගාරික රථ ආදිය සහ මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයට අවශ්‍ය වන්නාවූ යන්ත්‍ර සහ උපකරණ සහ අමු ද්‍රව්‍ය රේගු බදු හා භාණ්ඩ සහ සේවා බද්දෙන් නිදහස් කරන ලදී.

කලාපීය කාර්මීකරණය දිරි ගැන්වීම සඳහා දුෂ්කර සහ ඉතා දුෂ්කර ප්‍රදේශවල 1998 වසර අග වනතෙක් කර්මාන්ත පිහිටුවන ආයෝජකයන් දිරි ගැන්වීම සඳහා ඔවුනට ආයෝජන මණ්ඩලයේ දිරි ගැන්වීම ක්‍රමය ලබා දෙන ලදී. මේ සම්බන්ධයෙන් ආයෝජකයන්ගෙන් ලැබුණු දිරි ගන්නා සුළු ප්‍රතිචාරය සැළකිල්ලට ගනිමින් 1999 අයවැය මගින් මෙම පහසුකම තවත් අවුරුද්දක් සඳහා දීර්ඝ කරන ලදී. එබැවින් 1999 දෙසැම්බර් 31 දිනට ප්‍රථම අඩු පහසුකම් ඇති ප්‍රදේශවල කර්මාන්ත පිහිටුවන අපනයනකරුවන්ට බදු විරාම, ප්‍රාග්ධන භාණ්ඩ සහ අමු ද්‍රව්‍ය සඳහා ආනයන බදු සහන සහ විනිමය පාලන පනතේ කොන්දේසි වලින් නිදහස් වීම වැනි ආයෝජන මණ්ඩල පහසුකම් ලබා දෙන ලදී.

උසස් තාක්ෂණයක් ලබා ගැනීම සඳහා නව සහ පවත්නා කර්මාන්තවලට ආයෝජනය කිරීම දිරි ගැන්වීම සඳහා 1996 අයවැයෙන් හඳුන්වා දුන් රාජ්‍ය මූල්‍ය දිරි ගැන්වීමේ ක්‍රමය 1998 අයවැය මගින් තව වසර දෙකක කාලයකට දීර්ඝ කරන ලදී. මෙම ක්‍රමය මගින් රුපියල් දශලක්ෂ 4 කට වඩා වැඩියෙන් ආයෝජනය කරන නව සමාගම් සහ රුපියල් දශලක්ෂ 1 කට වඩා වැඩියෙන් ආයෝජනය කරන පවත්නා සමාගම් ආනයන තීරු බද්දෙන් නිදහස් කරනු ලැබේ. යන්ත්‍ර සහ උපකරණ ආනයන කරන කුඩා කර්මාන්තවලට වාසි ලබා දීම සඳහා මෙම ක්‍රමය සඳහා අවශ්‍ය වන අවම ආයෝජන සීමාව 1999 අයවැය මගින් ඉවත් කරන ලදී. කෙසේ වුවද, ආදායම් බදු සහනය අදාළ වන්නේ රුපියල් දශලක්ෂ 4 ක අවම ආයෝජනයක් සිදු කරන්නන් සඳහා පමණි.

## අපනයනකරුවන් සඳහා ආයතනික පහසුකම්

විවිධ සම්ප්‍රදායික නිෂ්පාදන සංවර්ධන ආයතන, අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව සහ අනෙකුත් අදල රාජ්‍ය ආයතන මගින් අපනයනකරුවන් ආයතනික පහසුකම් ලබා ගන්නා ලදී. අපනයන සංවර්ධන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන ව්‍යවසායකයන් සංවර්ධනය කිරීමේ වැඩපිළිවෙලවල්, නිෂ්පාදන වර්ධනය, වෙළෙඳපළ වැඩි දියුණු කිරීම, වෙළඳම සම්බන්ධ තොරතුරු සැපයීම, මූල්‍යමය ආධාර ලබා දීම සහ හිතකර ආර්ථික ප්‍රතිපත්තිමය වාතාවරණයක් සඳහා රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම තුළින් ප්‍රධාන වශයෙන්ම සම්ප්‍රදායික නොවන අපනයන වැඩි දියුණු කිරීමේ වැදගත් කාර්ය භාරයක් ඉටු කරන ලදී. තේ, රබර් සහ පොල් වැනි සම්ප්‍රදායික අපනයනයන් සඳහා ආයතනික පහසුකම් එම නිෂ්පාදන සංවර්ධනය සඳහා අදළ වන ආයතන මගින් සිදු කරන ලදී. ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව මගින් ණය රක්ෂණ සහ ඇපකර සැපයීමේ සේවා සිදු කරන ලදී. අනෙකුත් අදළ ආයතන විශේෂයෙන්ම අභ්‍යන්තර සහ ජාත්‍යන්තර වෙළෙඳ සහ ආහාර අමාත්‍යාංශය සහ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය මගින් ද්විපාර්ශ්වික, කලාපීය සහ බහුපාර්ශ්වික සංවිධාන යටතේ ලබාගත හැකි පහසුකම් පිළිබඳ අපනයනකරුවන් දැනුවත් කිරීම සිදු කළ අතර, ශ්‍රී ලංකාවේ අපනයන සහ විදේශීය ගැනුම්කරුවන් අතර සම්බන්ධතා ගොඩ නගා ගැනීමට උපකාරී විය. වාණිජ මණ්ඩල වැනි ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සංවිධානද අපනයනකරුවන් සඳහා ආයතනික පහසුකම් සපයන ලදී.

අපනයන සංවර්ධන මණ්ඩලයේ තාක්ෂණික හා කුසලතා සංවර්ධන වැඩපිළිවෙල යටතේ නිෂ්පාදිත සඳහා විශේෂ වූ සම්මන්ත්‍රණ සහ සාමාන්‍ය වැඩමුළු ඇතුළත් වැඩපිළිවෙලවල් 63 ක් පවත්වන ලදී. කොහු භාණ්ඩ, මැණික් හා ස්වර්ණාභරණ, කාබනික තේ, කුළුබඩු, වාෂ්පශීලී තෙල්, බෙහෙත් පැලෑටි, කජු මද, ඇඟළුම්, පාවහන්, පලතුරු, එළවළු, ස්වභාවික මල් වගාව, ලුහු ඉංජිනේරු භාණ්ඩ සහ අත්කම් භාණ්ඩ ආදී නිෂ්පාදිත සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොළවලට සහභාගී වීම සඳහා අපනයනකරුවන්ට අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සහාය ලබා දෙන ලදී. එම වෙළෙඳපොළ වලින් දශලක්ෂ 241 ක් (1998 වසරේ අපනයන වලින් සියයට 0.1 ක්) වටිනා ඇනැවුම් ප්‍රමාණයක් ලබා ගැනීමට අපනයනකරුවන්ට හැකි විය. අපනයන සැකසුම් ගම්මාන වැඩපිළිවෙල (Export Processing Village) යටතේ දඹදෙණිය, පොල්ගහවෙල සහ තිස්සමහාරාම අපනයන සැකසුම් ගම්මානවලට සහාය ලබා දීම අපනයන සංවර්ධන මණ්ඩලය මගින් නොකඩවා සිදු කරන ලදී. අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සංවර්ධන වැඩපිළිවෙලවල් තුනක් යටතේ එනම්, ඇඟළුම් කර්මාන්තශාලා 200 වැඩපිළිවෙල, අත් යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය සඳහා දිරි ගැන්වීමේ වැඩපිළිවෙල සහ කෘෂිකාර්මික නිෂ්පාදිත සහ රබර් නිෂ්පාදිත ප්‍රතිදන වැඩපිළිවෙල යටතේ අපනයනකරුවන් 270 කට රුපියල් දශලක්ෂ 216 ක මූල්‍ය ආධාර සපයන ලදී.

අපනයනයට යොමු වූ සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපෘති සංවර්ධනය සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය මගින් දකුණ, වයඹ සහ මධ්‍යම පළාත්වල වැඩපිළිවෙලවල් කිහිපයක් අරඹන ලදී. අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සංවිධානය කරන ලද මධ්‍යම සහ වයඹ පළාත්වල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘතිවල වෙළෙඳ ප්‍රදර්ශනයන් මගින් රුපියල් දශලක්ෂ 2 ක අපනයන ඇනවුම් ලබා ගත හැකි විය. මහජන බැංකුව මගින් සංවිධානය කරන ලද "ජන නිපැයුම්" වෙළෙඳ ප්‍රදර්ශනයට සහ 'ශ්‍රී ලංකා ඉන්ට්‍රැඩ් 98' (Sri Lanka Intrad 98) යන කාර්මික හා ආයෝජන ප්‍රදර්ශනයට සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සහභාගී කර ගැනීමට කටයුතු කිරීමද අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සිදු කරන ලදී. මීට අමතරව ශ්‍රී ලංකාවේ වාණිජ හා කර්මාන්ත මණ්ඩල හා ඒකාබද්ධව සාක් වෙළෙඳ ප්‍රදර්ශනය 1998 සැප්තැම්බර් මස කොළඹදී සංවිධානය කිරීමටද අපනයන සංවර්ධන මණ්ඩලය සහාය වූ අතර සියළුම සාක් රට වලින් ප්‍රදර්ශකයන් 300 කට වැඩි

ප්‍රමාණයක් එයට සහභාගී වූහ. 1998 නොවැම්බර් මාසයේදී ඉරාකයට යවන ලද වෙළෙඳ දූත පිරිසට අපනයන සංවර්ධන මණ්ඩලය සහභාගී වූ අතර, ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත නැවත ඉරාක වෙළෙඳපොළට හඳුන්වා දීමේ අරමුණින් බැග්ඩෑඩ් නුවර පැවති 31 වන ජාත්‍යන්තර වෙළෙඳ සල්පිලට ශ්‍රී ලංකාවේ සහභාගිත්වය සංවිධානය කිරිම අපනයන සංවර්ධන මණ්ඩලය මගින් සිදු කෙරිණි.

ශ්‍රී ලංකා අපනයන ණය රක්‍ෂණ සංස්ථාව මගින් අපනයන වර්ධනය සඳහා අපනයන රක්‍ෂණ ආවරණ සහ බැංකු ඇපකර නිකුත් කිරිම වැනි සේවා සැපයීම නොකඩවා සිදු කරන ලදී. 1998 වසර තුළදී එක්සත් ජනපද ඩොලර් දශ ලක්‍ෂ 7.4 ක වටිනාකමක් ඇති රක්‍ෂණ ඔප්පු 60 ක් නිකුත් කළ අතර, එය මුළු අපනයන වටිනාකමින් සියයට 0.15 ක් පමණි. නැගෙනහිර ආසියානු රටවල හා රුසියානු විනිමය අර්බුදයේ අහිතකර බලපෑම් නිසා 1998 වසර විශේෂයෙන්ම ශ්‍රී ලංකා අපනයනකරුවන්ට අසීරු වසරක් විය. මුදල් අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මූලිකත්වයෙන් රුසියාවට යවන තේ අපනයන සඳහා විශේෂ රක්‍ෂණ ඔප්පු ක්‍රමයක් 1998 ඔක්තෝබර් 15 දින සිට අපනයන ණය රක්‍ෂණ සංස්ථාව මගින් ආරම්භ කරන ලදී. මෙම විශේෂ ආවරණය මාස 4 ක කාලසීමාවක් සඳහා වූ අතර අලාභයෙන් සියයට 75 ක සීමාවකට හා එක්සත් ජනපද ඩොලර් දශ ලක්‍ෂ 15 ක උපරිම සීමාවක් සඳහා යටත් වේ. කෙසේ වුවද, මෙම ක්‍රමය යටතේ අපනයන ණය රක්‍ෂණ සංස්ථාව මගින් නිකුත් කර ඇත්තේ එක්සත් ජනපද ඩොලර් දශ ලක්‍ෂ 2.7 ක මුළු වටිනාකමක් සහිත රක්‍ෂණ ඔප්පු 4 ක් පමණි. අපනයනකරුවන්ට සපයන ලද මූල්‍යාධාර පහසුකම් ගෙවීම් පැහැර හැරීමේ අවදානම වෙනුවෙන් අපනයන ණය රක්‍ෂණ සංස්ථාව මගින් වාණිජ බැංකු වෙත විවිධ ඇපකර ක්‍රම සපයා ඇත. මෙම ක්‍රම මගින් අවශ්‍ය මූල්‍ය පහසුකම කලට වේලාවට ලබා ගැනීමට අපනයනකරුවන්ට හැකි විය. 1998 වසරේදී අපනයන ණය රක්‍ෂණ සංස්ථාව මගින් පූර්ව නැව්ගත කිරීමේ ණය (Pre-shipment Credit), පශ්චාත් නැව්ගත කිරීමේ ණය (Post-shipment Credit), අපනයන නිෂ්පාදිත ණය සහ අපනයන කාර්යඵල ඇපකර (Export performance guarantee) ආදිය සඳහා රුපියල් දශ ලක්‍ෂ 142.8 ක මුළු වටිනාකමකින් යුත් ඇපකර 66 ක් නිකුත් කරන ලදී. මැණික් සහ ස්වර්ණාභරණ අපනයනකරුවන්ට විදේශීය වෙළෙඳ ප්‍රදර්ශනවලට සහභාගී වීමේදී තීරු බදු රහිතව පිවිසීමේ පහසුකම් ලබා දීම සඳහා හඳුන්වා දෙනු ලැබූ ණය සහතික යෝජනා ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යනු ලැබීය. මෙම යෝජනා ක්‍රමය යටතේ ඇපකර ආරක්‍ෂණයක් නොමැතිව විදේශීය ප්‍රදර්ශන සඳහා තීරු බදු රහිතව ප්‍රවේශ වීමට ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ ශ්‍රී ලංකා ජාතික සභාවෙන් නිකුත් කරන තාවකාලික ඇතුල් වීමේ අවසරපතක් ලෙස පිළි ගත් සහතිකයක් ලබා ගැනීමටද අපනයනකරුවන්ට සහාය දෙනු ලැබීය.

1998 වසරේදී වාණිජ මණ්ඩල මගින් අපනයනකරුවන්ට මුහුණ දීමට සිදු වී ඇති අභියෝග පිළිබඳ දැනීම වැඩි දියුණු කිරිම සඳහා සහ දේශීය ව්‍යවසායකයන් සහ ඔවුන්ගේ විදේශීය ගැනුම්කරුවන් අතර ව්‍යාපාර රැස්වීම් වැඩි දියුණු කිරිම උදෙසා දේශන ගණනාවක් පවත්වන ලදී. තවද, සාමාජිකත්වය මුහුණපා ඇති ප්‍රශ්න වැඩි ප්‍රමාණයක් නිරාකරණය කර ගැනීම සඳහා භාණ්ඩාගාරය, අපනයනකරුවන් සහ රේගුව සමඟ පැවති මාසික රැස්වීම්වලටද වාණිජ මණ්ඩල සහභාගී වූහ. විදේශීය වෙළෙඳ විමසීම්, විදේශීය භාණ්ඩ ගැනුම්කරුවන්, විකුණුම්කරුවන් සහ නියෝජිතයන් පිළිබඳ දත්ත පදනමක් පවත්වාගෙන යාමද ඔවුන් මගින් සිදු කෙරේ. සම්භවය පිළිබඳ සහතික (Certificates of origin), ඉන්වොයිසි සහ හරිත ආරක්‍ෂණ සහතික ආදී අපනයන ලේඛණ රාශියක් නිකුත් කිරීමද 1998 වසරේදී මණ්ඩල මගින් සිදු කෙරිණි. මීට අමතරව, තත්ත්වය හා බර පිළිබඳ සහතික, නියෝජිත සම්මුති, විකිරණශීලී ක්‍රියාකාරිත්වය පිළිබඳ සහතික සහ සම්භවය පිළිබඳ අන්තරාළ සහතික (entrepot certificates of origin) ද නිකුත් කරන ලදී. වෙළෙඳ ශක්තිය සහ ආයෝජන විභවතාවය පිළිබඳ දැනුවත්භාවය ඇති කිරිම අරමුණු කොටගෙන වාණිජ මණ්ඩල මගින් කර්මාන්ත, වෙළෙඳ සහ ආයෝජන ප්‍රදර්ශනද පවත්වන ලදී.

## නැව් ගාස්තු

සිංගප්පූරුව, ගල්ෆ් අරාබියානු රටවල්, ඩුබායි, කුවේට් සහ පකිස්ථානය යන ගමනාන්ත දක්වා ගමන් කරන නාවික සේවාවන් සියල්ල එක්ව ගත් පොදු ක්‍රමයක් (Freight of All Kind - FAK) අනුගමනය කරන ලදී. කෙසේ වුවද එක්සත් රාජධානිය, උතුරු මහාද්වීපය (උතුරු යුරෝපීය ගමනාන්ත), මධ්‍යධරණී ප්‍රදේශය, ප්‍රංශය, ඊජිප්තුව, ඇමරිකා එක්සත් ජනපදය සහ කැනඩාව වැනි ගමනාන්ත ඇතුළත් වන නැව් සේවාවන් වැඩි ප්‍රමාණයක් වෙළෙඳ ද්‍රව්‍ය මත පදනම් වූ නැව් ගාස්තු ක්‍රමයක් අනුගමනය කරන ලදී.

1998 වසරේදී සාමාන්‍ය මුහුදු නැව් ගාස්තුව කැපී පෙනෙන ලෙස වෙනස් විණි. එක්සත් රාජධානිය, උතුරු මහාද්වීපය, මධ්‍යධරණී ප්‍රදේශය, ප්‍රංශය, ඊජිප්තුව සහ සිරියාව වැනි ගමනාන්ත සඳහා සාමාන්‍ය නැව් ගාස්තු 1997 ට වඩා ඉහළ නැංවුණු අතර මැද පෙරදිග (ඩුබායි, කුවේට්, ජෙඩා), පකිස්ථානය සහ ඕස්ට්‍රේලියාව යන ගමනාන්ත සඳහා නැව් ගාස්තු පහත මට්ටමක පැවතිණි.

වසරේ අවසාන කොටසේදී සමහර ප්‍රධාන නාවික සේවා මගින් යුරෝපය සහ ඇමෙරිකා එක්සත් ජනපදය සඳහා ඔවුන්ගේ යෝජිත නැව් ගාස්තු සංශෝධනය කරන ලද අතර, එම ගාස්තු 1999 ජනවාරි 1 ද සිට ක්‍රියාත්මක කිරීමට ඔවුන් බලාපොරොත්තු වන ලදී. එම යෝජිත ගාස්තුවලට අනුව ඇමෙරිකා එක්සත් ජනපදය සඳහා අඩි 40 ක බහළු සඳහා එක්සත් ජනපද ඩොලර් 1,000 ක වැඩි වීමක් සිදු කිරීමට බොහෝ නැව් සේවා බලාපොරොත්තු වේ. යුරෝපයේ ගමනාන්ත සඳහා 1999 ජනවාරි සිට බහළු සඳහා එක්සත් ජනපද ඩොලර් 400 ක වැඩි වීමක්ද, නැවතත් 1999 අප්‍රේල් සිට එක්සත් ජනපද ඩොලර් 300 ක වැඩි වීමක්ද යෝජනා කර තිබේ.

නැව් ගාස්තු තීරණය කරනු ලබන්නේ ලෝක ඉල්ලුම හා සැපයුම් බලපෑම් සහ නැව් සේවා අතර පවතින තරඟකාරිත්වයේ ප්‍රමාණය මතයි. ශ්‍රී ලංකාව තුළදී දේශීය

නියෝජිතයන් ක්‍රියාත්මක කරන්නේ වැඩි වශයෙන්ම පිටරටවල සිට ක්‍රියාත්මක වන ඔවුන්ගේ ප්‍රධාන නැව් සමාගම් මගින් ඔවුන්ට නියම කර ඇති ගාස්තුය. එබැවින් එම ගාස්තු මගින් ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ අපනයනකරුවන්ට අයහපත් ප්‍රතිඵල ඇති විය හැක. මෙම තත්ත්වය යටතේ තවදුරටත් තරගකාරිත්වය සිඳී යාමක් සිදු වේ යැයි බිය පහළ වීම නිසා ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ගේ සංගමය නැව් ගාස්තු ඉහළ දැමීමට තරයේ විරෝධය දක්වයි. එබැවින් ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ සංගමය බලාපොරොත්තු වන පරිදි සුළු පරිමාණ අපනයනකරුවන්ට අහිතකර බලපෑමක් ඇතිවන්නට පෙර මෙම තත්ත්වය පිළිබඳ ප්‍රවේසම් සහිත අධ්‍යයනයක් සිදු කළයුතුව ඇත.

1997 දී මත භේදයට තුඩු දුන් පර්යන්ත මෙහෙයුම් ගාස්තු (Terminal Handling Charges) අපනයන කරුවන් අතර තවදුරටත් පීඩාවන් ඇති කරන ලදී. මේ සම්බන්ධයෙන් 1997 දී ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ සංගමයෙන් පවරන ලද පැමිණිල්ලක ප්‍රතිඵලයක් වශයෙන් සාධාරණ වෙළෙඳ කොමිසම මේ පිළිබඳ පරීක්ෂණ පවත්වන ලදී. පර්යන්ත මෙහෙයුම් ගාස්තුව තරගකාරිත්වයට ප්‍රතිවිරුද්ධ පිළිවෙතක් ලෙස සාධාරණ වෙළෙඳ කොමිසම තීරණය කරන ලද අතර එම ගාස්තුව ඉවත් කර ගන්නා ලෙස ලංකා නැව් නියෝජිතයන්ගේ සංගමයට (Ceylon Association of Ship's Agent - CASA) දන්වන ලදී. ලංකා නැව් නියෝජිතයන්ගේ සංගමය, සාධාරණ වෙළෙඳ කොමිසමේ තීරණයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කල අතර, මෙම ප්‍රශ්නය තවම සමථයකට පත් වී නැත. මේ අතර ලංකා නැව් නියෝජිතයන්ගේ සංගමය පර්යන්ත මෙහෙයුම් ගාස්තුව 1999 වසරේ සිට ඉහළ දැමීමට බලාපොරොත්තු වේ.

නැව් ගාස්තු කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නැව් ඉඩ පහසුකම් වෙන් කිරීමේ මධ්‍ය කාර්යාංශයෙහි ක්‍රියාකාරිත්වය පැහැදිලිව අර්ථ දක්වා නැත. ශ්‍රී ලංකා නැව් ඉඩ පහසුකම් වෙන් කිරීමේ මධ්‍ය කාර්යාංශය මගින් නැව් ගාස්තු පිළිබඳව සංඛ්‍යා ලේඛන සටහන් ලබා දෙන නමුත් ප්‍රතිපත්තිමය උපදේශයන් හෝ සේවාවන් නිසි පරිදි පවත්වාගෙන යාමක් සිදු නොකරයි. පැහැදිලිවම නැව් ගාස්තු සඳහා වන මතභේදයට තුඩු දෙන ප්‍රශ්නය සාකච්ඡා කිරීම සඳහා ශ්‍රී ලංකා නැව් ඉඩ පහසුකම් වෙන් කිරීමේ මධ්‍ය කාර්යාංශයෙහි මිනිස් බල සම්පත් යොද ගත හැකිය.

## 9.12 වෙළෙඳ සබඳතා, වෙළෙඳ හා තිශ්කාෂණ වැඩපිළිවෙලවල්

ලෝක ආර්ථික හා ශ්‍රී ලංකාවේ ඒකාබද්ධතාවය වැඩිකිරීමේ අරමුණ ඇතිව ඒකීය, ද්විපාර්ශවීය හා බහු පාර්ශවීය පදනම මත තීරු ගාස්තු අඩුකිරීමට හා කලාපීය ද්විපාර්ශවීක හා බහුපාර්ශවීක සබඳතා ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකාව 1998 වසරේදී ප්‍රධාන පියවරවල් කිහිපයක් ගන්නා ලදී.

1998 දී ශ්‍රී ලංකාව ඒකපාර්ශවීයව තීරු ගාස්තු මට්ටම් අඩුකළ අතර ගෙවුම්තුලන දුෂ්කරතා හේතුකොට 1971 දී පිළිගනු ලැබූ 1994 වෙළෙඳාම හා තීරුබදු පිළිබඳ පොදු ගිවිසුමෙහි නොපිළිගැනීම XVIII B වගන්තිය යටතේ පැවති ආරක්ෂණ ඉවත් කිරීම පිළිබඳව 1998 දී කටයුතු කළේය. මේ වගන්තියේ විධිවිධාන අනුව, ගෙවුම්තුලන තත්ත්වය යහපත් අතට පත්වන තෙක් ආනයන මත සීමාවන් පැනවීමට ශ්‍රී ලංකාවට හැකිව තිබිණි. ඒය ඉවත් කිරීමෙන් අනාගතයේ ඇතිවිය හැකි ඕනෑම ගෙවුම්තුලන දුෂ්කරතාවයක් යටතේ, තීරුබදු නොවන සීමාවන් පැනවීමේ හැකියාව ශ්‍රී ලංකාව විසින් ඉවත් කොට ඇත. වර්තමානයේ කුමන ආර්ථික හේතුවක් මතවත් ශ්‍රී ලංකාව තීරුබදු නොවන සීමාවන් නොපනවන අතර ජාතික ආරක්ෂාව හා වරායේ සේවාවන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අරමුදල් ගොඩනැංවීම සඳහා තීරුබදු සම්බන්ධයෙන් වූ අනිකුත් ගාස්තු (Paratariff) පවත්වාගෙන යයි.

කලාපයට ප්‍රතිලාභ අත්කර දෙමින් ඉන්දියාව භාණ්ඩ 2000 ක් සඳහා වූ ප්‍රමාණාත්මක සීමාවන් ඒකපාර්ශවිකව ඉවත් කිරීම හා දෙසැම්බර් මාසයේදී ඉන්දු ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (Indo-Lanka Free Trade Agreement) අත්සන් කිරීම සමග වසර තුළදී ඉන්දියාව සමග වූ ශ්‍රී ලංකාවේ වෙළෙඳ සබඳතා ඉහළ මට්ටමකට පත්විය. කෙසේ වුවද, මෙම භාණ්ඩ 2000 න් ශ්‍රී ලංකාව ඉන්දියාවට අපනයනය කරන්නේ සුළු ප්‍රමාණයක් පමණි. ඉන්දු-ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම ශ්‍රී ලංකාවේ ප්‍රථම නිදහස් වෙළෙඳ ගිවිසුමයි. එය ඉන්දු ලංකා ඒකාබද්ධ කොමිසම යටතේ පැවති 4 වන සාකච්ඡා වටයේ ප්‍රතිඵලයකි. නිෂේධාත්මක ලැයිස්තුව (Negative list) යටතේ රටවල් දෙක මගින් පැනවීමට අපේක්ෂිත, සීමා මගින් මෙම ගිවිසුමෙහි ඵලදායිතාවයට බලපෑම් ඇතිවිය හැක. කෙසේ වුවද, නිදහස් වෙළෙඳ වාතාවරණයක් අත්කරගැනීමට හා දේශීය කර්මාන්ත සඳහා ලබාදී ඇති ආරක්ෂණයන් ක්‍රමයෙන් ඉවත් කර ගැනීමට දෙරටෙහි ඇති අභිලාෂය මෙම ගිවිසුම මගින් පෙන්නුම් කෙරේ.

මෙම ගිවිසුම යටතේ, රටවල් දෙක මගින් සමහර භාණ්ඩ සඳහා වූ තීරුබදු කඩිනමින් ඉවත් කරනු ඇත. නිෂේධාත්මක ලැයිස්තුවේ (Negative list) ඇති භාණ්ඩ හැරුණු විට ඉතිරි භාණ්ඩ සඳහා සියයට 25 සිට සියයට 50 දක්වා වූ තීරුබදු අඩුකිරීම ඉක්මනින් ක්‍රියාත්මක වනු ඇත. තෝරාගත් භාණ්ඩ කිහිපයක හැරුණුවිට මෙම භාණ්ඩ මත වූ ඉතිරි තීරුබදු අවු. 3-8 දක්වා වූ කාලයක් තුළදී රටවල් දෙක මගින් ඉවත් කරනු ඇත. දකුණු ආසියානු වරණීය වෙළෙඳ වැඩපිළිවෙලේ (South Asian Preferential Trading Arrangement) සාකච්ඡා යටතේ මෙන්ම ඉන්දු ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ ද තීරුබදු නොවන සීමාවන් ඉවත් කිරීම ඉතා සෙමින් සිදුවනු දකිය හැක. ජාතික ආරක්ෂාව හා සෞඛ්‍ය හේතූන් මත අයිතම කිහිපයක් සඳහා හැරුණුවිට සියළුම තීරුබදු නොවන සීමාවන් ශ්‍රී ලංකාව මේ වනවිටත් ඉවත්කර තිබීම අවාසිදයක වනු ඇත.

ශ්‍රී ලංකාව රටවල් කිහිපයක් සමඟ වන සිය ඒකාබද්ධ කොමිසම් රැස්වීම් නිරතුරුව පවත්වයි. 1998 දී ශ්‍රී ලංකා පකිස්ථානු ඒකාබද්ධ කොමිසමේ රැස්වීම පැවැත්වුණු අතර, වෙළෙඳ ප්‍රසාරණය, වෙළෙඳ පිවිසුම, ණය පහසුකම් හා

**විශේෂ සටහන 10**

## ඉන්දු ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ඉන්දීය ජනරජය අතර නිදහස් වෙළෙඳ ගිවිසුම ලෙස තිල නම් දරූ ඉන්දු ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම ශ්‍රී ලංකා ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග හා ඉන්දියානු අගමැති ශ්‍රී අතල් බිහාරි වජ්පායි විසින් 1998 දෙසැම්බර් 28 වෙනි දින අත්සන් තබන ලදී.

ද්විපාර්ශවීය නිදහස් වෙළෙඳ ගිවිසුමක් යනු විශේෂිත භාණ්ඩ කොටසක් සඳහා රටවල් දෙකක් අතර පවත්නා තීරුබදු, තීරුබදු නොවන හා තීරුබදු සම්බන්ධයෙන් වූ අනිකුත් ගාස්තු අඩුකිරීම සඳහා එම දෙරට අතර පවත්නා ගිවිසුමකි. මෙහි ප්‍රාථමික පරමාර්ථය වන්නේ වැඩි විශේෂත්වයක් ඇති වෙළෙඳ හවුල්කරුවන් සමඟ වෙළඳාමට වූ බාධක ඉවත් කිරීමෙන් රටෙහි දිගුකාලීන ආර්ථික වර්ධනය හා සංවර්ධනය ඇති කිරීමයි. මෙම බාධක ඉවත් කිරීම ඉතා ඉක්මනින් හෝ ක්‍රමයෙන් කාලපරිච්ඡේදයක් තුළ සිදුවිය හැක. යම් කාල-පරිච්ඡේදයක් තුළදී ජාතික ආරක්ෂක හේතූන් මත සහ වෙළඳ බාධක ඉවත් කිරීම හේතුවෙන් වැදගත් දේශීය කර්මාන්තවලට ඇති වියහැකි හානි සැලකිල්ලට ගැනීමෙන් සමහර අලෙවි කළහැකි නිෂ්පාදිත ගිවිසුමකින් ඉවත් කළ හැකිය. මෙසේ ගිවිසුමෙන් ඉවත් කරන භාණ්ඩ අඩංගු ලැයිස්තු නිෂේධාත්මක ලැයිස්තු (Negative lists) ලෙස හැඳින් වේ. මෙම නිෂේධාත්මක ලැයිස්තුවල අඩංගු භාණ්ඩවලට සහන නොලැබෙන නමුත් ඒවා සාමාන්‍ය වෙළඳ කොන්දේසි යටතේ අලෙවි කෙරේ. වරණීය වෙළෙඳ ගිවිසුමක අරමුණ රටවල් අතර ස්වකීය නිෂ්පාදන වැඩිදියුණු කිරීම බැවින්, ගිවිසුමෙන් සම්භවය පිළිබඳ මූලධර්මය නියම කෙරේ. එබැවින් සහන ලබා ගැනීමට නම්, නිෂ්පාදනය සම්පූර්ණයෙන් එම රට තුළින්ම ලබාගත යුතු හෝ තෙවැනි පාර්ශවයේ රටකින් ආනයනය කළ කිසියම් ද්‍රව්‍යයක් අඩංගු වේ නම් අදාළ රට තුළ දී එය අති විශාල වෙනසකට භාජනය කොට තිබිය යුතුය. වෙනසකට භාජනය කිරීමට අවශ්‍ය ප්‍රමාණය, ගිවිසුමෙහි සම්භවය පිළිබඳ මූල ධර්මය යටතේ නියම කෙරේ.

ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳාමෙහි පළමු හවුල්කරු ලෙස ඉන්දියාව තෝරා ගැනීම සඳහා සුදුසුකම් කීපයකි. ඉන්දියාව ශ්‍රී ලංකාවට භූගෝලීය වශයෙන් ආසන්නම අසල්වැසි රට වන අතර ආසන්නම ආර්ථික අසල්වැසියාද වේ. පසුගිය වසර කීපයක් තුළදීම ශ්‍රී ලංකාවේ ඉතා වැදගත්ම ආනයන සැපයුම්කරුවන් අතරට ඉන්දියාව අයත් වූ අතර, පසුගිය වසර තුනේදී ප්‍රධාන සැපයුම්කරු බවටද පත්විය. මෙම ආසන්නභාවය සහ දේශ සීමා අතර අඩු තීරුබදු පැවතීම රටවල් දෙක අතර වෙළඳාම සහ ආයෝජනය මෙන්ම යම් තෙවැනි රටක් මගින් ඉන්දියානු වෙළඳපොළ ඉලක්ක කරගෙන ලංකාවේ ආයෝජනය කිරීමද පහසු කරවයි.

නවකාර්මීකරණය වූ රටවල්වල අත්දකීම් අනුව කටයුතු කරමින් ශ්‍රී ලංකාව සහ ඉන්දියාව වැනි රටවල්වලට තවදුරටත් වැඩි වර්ධන වේගයක් ලඟා කරගත නොහැකි බව නිදහස් වෙළෙඳ ගිවිසුම යෝජනා කරන්නන් විශ්වාස කරති. සංවර්ධිත ආර්ථිකවල වෙළෙඳපොළවල මන්දගාමීත්වය, එම රටවල වැඩි වෙමින් පවතින ආරක්ෂාකාරී පිළිවෙත්, දියුණු වෙමින් පවතින රටවල සහ නැගී එන ආර්ථිකවල අපනයනකරුවන් අතර ඉහළ යමින් පවතින තරඟකාරීත්වය, බලවත් රටවල් කේන්ද්‍ර කරගෙන ඇති වෙමින් පවතින වෙළෙඳ කලාප සහ එකම මට්ටමක පවතින හෝ අඩු වෙමින් පවතින ශුද්ධ විදේශීය ආධාර යනාදිය මීන් වැදගත් කරුණු කිහිපයකි. එබැවින් සංවර්ධනය වෙමින් පවතින රටවල් ආර්ථික වර්ධනය සහ අපනයන ප්‍රවර්ධනය සඳහා එකිනෙකාගේ සහයෝගය ලබාගැනීමට උත්සාහ කළ යුතුය. සැලකිය යුතු තරම් විශාල මධ්‍යම ප්‍රමාණයේ ආදයම් උපයන්නන් කණ්ඩායමකින් සමන්විත විශාල ආර්ථිකයක් වන ඉන්දියාවට, ලංකාව සඳහා වරණීය තීරුබදු ලබාදීමෙන් ලංකාවේ අපනයන පුළුල් කිරීමට අවස්ථාවක් ලබාදිය හැකිය.

නිදහස් වෙළෙඳ ගිවිසුම මගින් රටවල් දෙක අතර නිදහස් වෙළඳාම ප්‍රවර්ධනය සඳහා ඉහළ මට්ටමේ දේශපාලන කැපවීමක් පෙන්නුම් කරයි. ඉතා ඉක්මනින් සිදුවීමට යන ගෝලීයකරණ ක්‍රියාවලියේදී ඇතිවන අභියෝගවලට මුහුණදීම සඳහා තමන්ගේ තරඟකාරීත්වය වැඩිදියුණු කරගැනීමේ වැදගත්කම පිළිබඳව, එමගින් දෙරටෙහි නිෂ්පාදන හා වෙළෙඳ අවස්ථාවලට මෙමගින් සංඥා කරනු ලබයි. නිදහස් වෙළෙඳ ගිවිසුම මගින් සියළුම භාණ්ඩ සඳහා සියළුම තීරුබදු එකවර ඉවත් නොකරයි. උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (North American Free Trade Agreement -NAFTA) මෙන්ම තීරුබදු ඉවත්වීම සිදු වන්නේ කාලයත් සමග ඉවත්වීමේ කාලසටහනකට අනුවය. ඉන්දියාව විසින් සමහර භාණ්ඩ සඳහා තීරුබදු සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම කඩිනමින් සිදු කරනු ලබන අතර සමහර තෝරාගත් භාණ්ඩ සඳහා අර්ධ බදු සහන ප්‍රදානය කරනු ඇත. එම භාණ්ඩ සඳහා තීරුබදු ක්‍රමක්‍රමයෙන් අවුරුදු තුනක කාලසීමාවක් තුළදී ඉවත් කරනු ඇත. ශ්‍රී ලංකාවද, සමහර භාණ්ඩ සඳහා තීරුබදු ඉවත් කිරීම ඉතා කඩිනමින් සිදුකරනු ලබන අතර, සමහර භාණ්ඩ සඳහා අර්ධ බදු සහන ලබාදෙනු ඇත. එම භාණ්ඩ සඳහා තීරුබදු ක්‍රමක්‍රමයෙන් ඉවත් කිරීම ශ්‍රී ලංකාව මගින් අවුරුදු අටක කාලසීමාවක් තුළදී සිදුකරනු ඇත.

නිදහස් වෙළෙඳ ගිවිසුමේ නිෂේධක ලැයිස්තු සකස් කිරීම මගින් සමහර කර්මාන්තකරුවන්ට ආරක්ෂාවක් සලසනු ලැබේ. නිෂේධක ලැයිස්තුවල අඩංගු භාණ්ඩවලට තීරුබදු සහන ලබා දෙනු නොලැබේ. එවැනි නිෂේධක ලැයිස්තු මගින් නිදහස් වෙළෙඳ ගිවිසුමෙහි ක්‍රියාකාරීත්වයට බාධා පමුණුවන නමුදු ඒවා මේ අවස්ථාවේදී ගිවිසුමෙහි ඇතුලත් කළයුතු නොවැළැක්විය හැකි කොටසක් බවට

**විශේෂ සටහන - 10 (සම්බන්ධයි)**

පත් වී ඇත. සමහර දේශීය කර්මාන්ත විදේශීය තරඟකාරිත්වයට නිරාවරණයවීම කල් දැමීමට අවස්ථාවක් මෙමගින් උදා කරගත හැකි බැවින් ඒ තුළින් ඇති වියහැකි අස්ථායී ප්‍රතිඵල මග හැරීමට හැකි වීමට ඉඩ ඇත. එබැවින් ඊළඟට, තෝරාගත යුතු හොඳම ක්‍රියාමාර්ගය විය යුත්තේ නිෂේධක ලැයිස්තු අවම කිරීමයි. රටවල් දෙකෙහි නිෂේධක ලැයිස්තු පිළිබඳව අවසාන තීරණයක් ගතයුතුව ඇත.

නිදහස් වෙළෙඳ ගිවිසුමෙහි ඇතුලත් කරගත් අනෙකුත් වැදගත් නිර්ණායකයන් අතර, 1994 වෙළෙඳම හා තීරුබදු පිළිබඳ පොදු ගිවිසුමෙහි iii වන වගන්තියෙහි අන්තර්ගත වූ ජාතික සැලකීම (National Treatment) පිළිබඳ නිර්ණායකයේ මූලධර්මද වේ. රාජ්‍ය වෙළෙඳ ආයතන පිහිටුවීම හා පවත්වාගෙනයාම 1994 වෙළෙඳම හා තීරුබදු පිළිබඳ පොදු ගිවිසුමෙහි XVII වගන්තියට යටත්ව සිදුකළ හැකිය. ගෙවුම් තුලනයේ අපහසුතාවයන් මත හෝ ආනයන කරන රටෙහි ආර්ථිකයට බරපතල හානි සිදුවීමේ හෝ සිදුවීමට අනතුරු හැඟවෙන අවස්ථාවකදී තාවකාලිකව වරණීය සැලකිල්ල අත්හිටුවීමේ ප්‍රතිඵලයක් ඇති කිරීමෙන් ආරක්ෂක පියවර ගැනීමට ගිවිසුම මගින් ඉඩ ලබාදේ. දේශීය වෙළෙඳපොළෙහි නිෂ්පාදන පිරිවැයට වඩා අඩු මිලකට විකිණීම (dumping) හෝ සහනාධාර (subsidy) වැනි ඕනෑම අසාධාරණ වෙළෙඳ ක්‍රම ආදියට විරුද්ධව පියවර ගැනීම සඳහා දේශීය නීති භාවිතා කිරීමටද හැකිය. නිදහස් වෙළෙඳ ගිවිසුම ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය අවම වශයෙන් වාර්ෂිකවත් සමාලෝචනය කිරීම මෙන්ම, රේගු කටයුතු සම්බන්ධයෙන් රටවල් දෙකට අදාළ තීරුබදු අනුකූලව යොදා ගැනීම පිළිබඳව විවාදයට තුඩු දුන් කරුණු සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මට්ටමේ සම්බන්ධීකරණ කමිටුවක් පිහිටුවීමට නිදහස් වෙළෙඳ ගිවිසුම මගින් ඉඩ සලසා ඇත. ගිවිසුමෙහි ආරවුල් විසඳීම සඳහා කොන්දේසි ඇතුලත් වේ. එක රටක් මගින් හය මාසයක කල්දීමකින් ගිවිසුම අත්හිටුවීමේ අදහස ලිඛිතව අනෙක් රටට දැනුම් දීමෙන් ගිවිසුම අත්හිටුවීම සිදුකළ හැකිය. ගිවිසුම සම්බන්ධ ඕනෑම වෙනස්කිරීමක් දෙරට අතර අන්‍යොන්‍ය එකඟතාවයකින් සිදුකළ හැකිය.

නිදහස් වෙළෙඳ ගිවිසුම මගින් වරණීයව තීරුබදු හා ඊට සම්බන්ධ වූ අනෙක් ගාස්තු (Para-tariff) හෝ තීරුබදු නොවන බාධක ඉවත් කිරීමක් සිදු නොකරයි. එබැවින්, එවැනි බාධක ඉවත්කිරීම සම්බන්ධීකරණ කමිටුවේ කේන්ද්‍රීය අවස්ථාවක් විය හැකිය. ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පවතින බාධක අසමමිතික නම්, සම්බන්ධීකරණ කමිටුව මගින් එවැනි වෙනස්කම් සමථයකට පත්කිරීම පිළිබඳව සාකච්ඡා කර තීරණය කරගැනීම හෝ තීරුබදුකරණය (tariffication) මගින් සුදුසු පරිදි ඉහළ තීරුබදු පැනවීමෙන් එම තීරුබදු සම්බන්ධ අනෙක් ගාස්තු හා තීරුබදු නොවන බාධක නිසා ඇතිවිය හැකි බලපෑම් නැති කිරීම සිදුකළ යුතුය.

ඕනෑම වෙළෙඳ ගිවිසුමකින් හෝ වෙළෙඳ ප්‍රතිපත්තියක වෙනස්කම් වලින් පාරිභෝගිකයන්ට, අපනයනකරුවන්ට සහ ආනයනකරුවන්ට සහ ගිවිසුමට බැඳෙන රටවල නිෂ්පාදකයන්ට බලපෑම් ඇතිවේ. එමෙන්ම වරණීය වෙළෙඳ ගිවිසුමේ බලපෑම් නිසා වෙළෙඳම වෙනත් දිසාවකට හැරීමේ (Trade diversion) ප්‍රමාණය අනුව එය, ලෝකයේ ඉතිරි රටවලටද බලපෑම් ඇති කරයි. තීරුබදු අඩුකිරීම නිසා ගිවිසුමට බැඳෙන රටවල දේශීය පාරිභෝගිකයන්ට මුහුණදීමට සිදුවන මිල අඩුවීමෙන් කෙටිකාලීනව ඔවුන්ගේ සුභසාධනය වැඩිදියුණු වේ. ආනයන හා අපනයනකරුවන්ගේ වෙළෙඳ ගණුදෙනු පරිමා වැඩිවීමත් සිදුවිය හැකි අතර එමගින් ඔවුන්ගේ ආදායම් මට්ටම් ඉහළ නැංවීමට පුළුවන. අපනයන වෙළෙඳපොළට භාණ්ඩ සපයන නිෂ්පාදකයන් හා කර්මාන්තකරුවන්ට වඩා නිදහස් වෙළෙඳම තුළින් වාසි ලබාගැනීමට හැකිවන අතර දේශීය වෙළෙඳපොළට භාණ්ඩ සපයන නිෂ්පාදකයන් හා කර්මාන්තකරුවන්ට තරඟකාරිත්වයට මුහුණදීමට සිදුවීම සහ ඔවුන්ගේ වෙළෙඳපොළ කොටස අහිමිවීම සිදුවිය හැක. තීරුබදු හා සම්බන්ධ රජයේ ආදායම රජයට අහිමිවීමද සිදුවිය හැක. කෙසේ වුවද වෙළෙඳම හරහා රාජ්‍ය මූල්‍ය ලබාගැනීම වෙළෙඳමට අහිතකර වෙනස්කම් ඇතිවිය හැකි බැවින් එය එතරම් බරපතල කරුණක් නොවනු ඇත.

වරණීය වෙළෙඳ ගිවිසුමක් නිසා ඇතිවන වෙළෙඳ දිසාව වෙනස්වීම මගහැරීමට ඉතා අපහසු වේ. යම් භාණ්ඩයක බද්දට පෙර මිල වෙනත් රටක එවැනි භාණ්ඩයක මිළට වඩා වැඩිවුවත් අඩු වරණීය තීරුබදු නිසා සමහර ඉන්දියානු භාණ්ඩ ශ්‍රී ලාංකිකයන්ට ලාභදායී වියහැක. ඉන්දියාවේ නිපදවන භාණ්ඩ සහ ලෝකයේ අනෙක් රටවල නිෂ්පාදනය කරන භාණ්ඩ අතර තත්ත්වයෙහි විශාල වෙනසක් ඇත්නම් එමගින් ලෝකයේ සම්පත් බෙදීම, ලෝකයේ සුභසාධනය සහ ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයන්ගේ සුභසාධනය විකෘති වේ.

දිගුකාලයේදී නිදහස් වෙළෙඳාම, කාර්යක්ෂමතාවය, විදේශීය ආයෝජනය, තාක්ෂණික දැනුම ගලාඒම සහ දැනුම බෙදීයාම වැනි දිගුකාලීන වර්ධනයට අවශ්‍ය වන අංශයන් ප්‍රවර්ධනය කරයි. විශාල වෙළෙඳපලක් හරහා ලබාගත හැකි වාසි, විශේෂ කාර්යයන් සඳහා වැඩි පුහුණුවක් ලැබීම, මහා පරිමාණ නිෂ්පාදනයේ වැනි අංශ ඒකරාශී වීමෙන් වර්ධනය තවදුරටත් වේගවත් වනු ඇත. ගිවිසුමට බැඳී ඇති රටවල වත්මන් නිෂ්පාදනය කරන කර්මාන්තවලට වඩා වැඩි සාපේක්ෂ වාසි හෝ තරඟකාරී වාසි ඇති කර්මාන්තවලට වඩා විශාල වෙළෙඳපොළක් ලැබීමේ වාසි භුක්ති විඳීමට හැකිවනු ඇත. කිසියම් සාපේක්ෂ වාසියක් නොමැති වුවද, වෙළෙඳ බාධක හා ප්‍රවාහන සීමාවන් ඉවත් කිරීම නිසා එකම කර්මාන්තය තුළ සිදුවන වෙළෙඳම (Intra Industry Trade) උදා : යුරෝපීය සංගමයේ දකගත හැකි වෙළෙඳ රටාවට සමාන අර්ධ ලෙස සැකසූ භාණ්ඩ වෙළෙඳමේ වැඩිවීමක් සිදුවිය හැක.

නිදහස් වෙළෙඳ ගිවිසුමේ ප්‍රතිඵලයක් ලෙස ඉන්දියාවෙන් සහ අනෙක් රටවලින් ඇතිවිය හැකි

විශේෂ සටහන - 10 (සම්බන්ධයි)


ආයෝජන වැඩිවීම මගින් වාසි ලබාගැනීමට ද ශ්‍රී ලංකාව බලාපොරොත්තු වේ. මෙම වාසි ලබාගැනීම තීරණය වන්නේ ලංකාවේ වෙළෙඳ හා ආයෝජනය සම්බන්ධ ක්‍රියාපිළිවෙලවල්වල සාපේක්ෂ කාර්යක්ෂමතාව, වරාය සේවා සහ මංමාවත් පද්ධති ආදිය ඇතුළු යටිතල පහසුකම්වල වර්ධනයේ ප්‍රමාණය සහ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන නිමි භාණ්ඩ පිලිගැනීමට සහ ආනයනය කරන අමුද්‍රව්‍ය සඳහා පහසුකම් සැපයීමට ඉන්දියාව දක්වන කැමැත්ත මතය. ශ්‍රී ලංකාවේ පවත්නා පහළ මට්ටමක තීරුබදු ව්‍යුහය සහ තීරුබදු හා සම්බන්ධ වූ අනෙකුත් ගාස්තු සහ තීරුබදු නොවන අනෙකුත් බාධක නොමැතිකම ඉන්දියාවට වාසිදයක වනු ඇත. කෙසේ වුවද, ශ්‍රී ලංකාවට විදේශ ආයෝජන ආකර්ශනය කරගැනීම සඳහා තරඟකාරී බව පවත්වා ගැනීමට හා කාර්යක්ෂම වීමට නම් යටිතල පහසුකම් තවදුරටත් වර්ධනය කරගත යුතුව ඇත. රජයේ ආයතනවලට, පෞද්ගලික අංශයේ සහභාගිත්වයද එකතු කර ගැනීමෙන් මේ සම්බන්ධයෙන් විශේෂ කාර්ය භාරයක් ඉටුකළ හැකිය. මංමාවත් වැනි යටිතල පහසුකම් පොදු භාණ්ඩ වේ. ඒවා දිගුකාලීන වර්ධනයක් සඳහා විශාල කාර්යභාරයක් ඉටු කරයි. පෞද්ගලික භාණ්ඩ මෙන්ම, පොදු භාණ්ඩද සැලසුම් කළයුතු අතර, නිෂ්පාදනය හා බෙදාහැරීමද කාර්යක්ෂම සහ කලට වේලාවට සිදුකළ යුතුවේ. මෙම ක්‍රියාවලියට ව්‍යවසායක කටයුතු සඳහා දක්ෂතාවයක් අවශ්‍ය වේ.

නිදහස් වෙළෙඳ ගිවිසුම හේතුවෙන් දිරිගැන්වුනු, ශ්‍රී ලංකාවේ සිටින විභවතාවයක් ඇති ආයෝජකයන්ද යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සැලසුම් දක ගැනීමට කැමැත්ත දක්වනු ඇත. එබැවින්, ශ්‍රී ලංකාව යටිතකල පහසුකම් දියුණු කිරීමට යථාර්ථවාදී, පුළුල් සැලැස්මක් පිළියෙල කළ යුතුව ඇති අතර එමගින් ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම සඳහා කාර්යභාරයක් කිරීමට නිදහස් වෙළෙඳ ගිවිසුමට හැකිවනු ඇත.

නිදහස් වෙළෙඳ ගිවිසුමෙන් ශ්‍රී ලංකාවට ඇතිවන දිගුකාලීන බලපෑම ඒ හා සමාන ඓතිහාසික සිදුවීම ඇගැයීමෙන් තක්සේරු කළහැක. 1977 දී ශ්‍රී ලංකාව ප්‍රබල ප්‍රතිපත්තිමය වෙනසක් සිදුකළ අතර එමගින් අති විශාල ප්‍රමාණයක තීරුබදු සහ තීරුබදු නොවන බාධක ඉවත් කෙරිණි. ඉන්පසුව දශක දෙකක කාලසීමාවක් තුළදී ශ්‍රී ලංකාවට විශාල විදේශීය ආයෝජන ප්‍රමාණයක්, විශාල ප්‍රමාණයක ආනයන සහ අපනයන මෙන්ම වේගවත් ආර්ථික වර්ධනයක්ද ලඟාකර ගැනීමට හැකිවිය. මේ සියල්ල ලබාගන්නා ලද්දේ රටෙහි සිවිල් ආරවුල් මගින් සිදුවන බාධාවලට ද මුහුණ දෙමිනි. ශ්‍රී ලංකාව පෙන්නුම් කරන ලද සතුටුදායක අපනයන ප්‍රගතිය මගින් ලෝකයේ ඕනෑම රටක් හා තරඟ කර ලෝක වෙළෙඳපොළෙහි අයත් කොටස සාර්ථකව දිනා ගැනීමට ඇති හැකියාව පෙන්නුම් කරයි. උතුරු ඇමෙරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුමෙන් පෙන්නුම් කරන්නේ 1994 ගිවිසුම අත්සන් කිරීමෙන් පසු කැනඩාව සහ මෙක්සිකෝව යන රටවල් දෙකට වැඩි අපනයන පරිමාවක් සහ වැඩි සෘජු ආයෝජන ප්‍රමාණයක් ලඟා කරගත් බවයි. එබැවින් නිදහස් වෙළෙඳ ගිවිසුම කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ හොත් ඉදිරි වසර කීපය තුළදී ශ්‍රී ලංකාවට එමගින් වාසි ලබාගැනීමට හැකිවනු ඇත.


**1 රූප සටහන**


**1994 උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (උ.ඇ.නි.වේ.ගි.) ක්‍රියාත්මක කිරීමට පෙර හා පසු මෙක්සිකෝවේ හා කැනඩාවේ විදේශ සෘජු ආයෝජකයන්ගේ වර්ධනය**




**2 රූප සටහන**

**එක්සත් ජනපද ඩොලර් වටිනාකම අනුව අපනයන වටිනාකම් දර්ශක හා 1994 උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීමට පෙර හා පසු මෙක්සිකෝවේ හා කැනඩාවේ අපනයන දිශාවන් (දර්ශකය 1994 =**




මූලාශ්‍රය : International Financial Statistics

තාක්ෂණික සහයෝගිතාව වැනි ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කරන ලදී. නෝර්වේ සමඟ වූ වාර්ෂික උපදෙස් සේවාවේ 4 වන සැසිය 1998 දී පැවැත්වූ අතර, නිශ්චිත වැඩපිළිවෙලක් සඳහා වූ අවශ්‍යතාවය එහිදී සාකච්ඡාවට බඳුන් විය.

ශ්‍රී ලංකාව ඉරානය සමඟ ද්විපාර්ශවික සාකච්ඡා ආරම්භ කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස කිලෝග්‍රෑම් දශලක්ෂ 2.3 කින් වැඩි වූ පංගු ප්‍රමාණයක් සහිතව ආහාර සඳහා තෙල් වැඩපිළිවෙලෙහි 5 වන අදියර යටතේ ඉරානය, ශ්‍රී ලංකාවෙන් තේ ආනයනය කිරීම නැවත ආරම්භ කරන ලදී.

ඒකාබද්ධ කොමිසමක මින් පෙර ක්‍රියාත්මක නොවූ, ආර්ථික වශයෙන් වැදගත් රටවල් කිහිපයක් සමඟ ද්විපාර්ශවික සාකච්ඡා වටයන්ටද ශ්‍රී ලංකාව ඇතුළු විය. නැව් පහසුකම්වල වැදගත්කම සැලකිල්ලට ගෙන, ඉතාලිය සමඟ ද්විපාර්ශවික ගිවිසුමක් සැලසුම් කරන ලදී. ඒ හා සමානව, තේ අපනයනය සඳහා රුසියානු ජනපදය හා ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍යයන්ගේ නැගෙනහිර යුරෝපීය රටවල් කිහිපයක් සමඟ ද්විපාර්ශවික සාකච්ඡා පවත්වන ලදී. මෙම සාකච්ඡාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස රුසියාව, උස්බෙකිස්ථානය, යුක්රේනය, චෙක් සමූහාණ්ඩුව හා ස්ලෝවැක් සමූහාණ්ඩුව සමඟ වෙළඳ ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාවන් සඳහා වූ කෙටුම්පත් ගිවිසුම් හුවමාරු කරගන්නා ලදී. රුමේනියාව සමඟ වූ වෙළඳ ගිවිසුම එකඟතාවයකට පත්වී දෙපාර්ශවයම ස්ථිර කළ අතර, බුකාරෙස්ට්හි පැවැත්වීමට නියමිත ඊළඟ ඒකාබද්ධ කොමිසම් සභා රැස්වීමේදී එය මූලාරම්භ කරනු ඇත.

දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සමුළුවේ (South Asian Association for Regional Co-operation (සාක්)) 10 වෙනි සමුළුව, 1998 කොළඹදී පවත්වනු ලැබීය. එම රැස්වීමේදී සප්තා ගිවිසුමේ තෙවන වටයේ වෙළෙඳ සාකච්ඡා කඩිනමින් අවසන් කිරීමටත්, සම්භවය පිළිබඳ මූලධර්මය යටතේ, දේශීය නිමැවුම් අත්කර ගැනීමේ අවශ්‍යතාවය අඩුකිරීමටත්, කලාපයේ අනාගත නිදහස් වෙළෙඳ කලාපයක් (South Asian Free Trade Area) ඇතිකිරීමට සියළු විස්තර සහිත ගිවිසුමක් සඳහා කෙටුම්පත් සකස් කිරීමට විශේෂඥයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් පිහිටුවීමටත් රාජ්‍ය නායකයන් තීරණය කළහ.

සප්තා ගිවිසුම යටතේ තෙවන වටයේ සාකච්ඡා 1998 නොවැම්බර් මසදී අවසන් විය. මෙම වටයේදී ශ්‍රී ලංකාව අනිකුත් සාක් සාමාජික රටවල් වලින් සියයට 10 සිට සියයට 20 දක්වා වූ පරාසයක වූ තීරුබදු සහන කිහිපයක් ලබාගත් අතර, තීරුබදු සහන ලැබෙන භාණ්ඩ මත වූ සියළුම තීරුබදු නොවන සීමාවන් ඉවත් කරන ලදී. බංගලාදේශය හා භූතානය නිෂ්පාදන ද්‍රව්‍ය 7 ක් සඳහා තීරුබදු සහන ප්‍රදානය කරන ලදී. ඉන්දියාව නිෂ්පාදන ද්‍රව්‍ය 25 ක් සඳහා තීරුබදු සහන ප්‍රදානය කළ අතර පකිස්ථානය නිෂ්පාදන ද්‍රව්‍ය 6 ක් සඳහා සහන ලබාදෙන ලදී. මාලදිවයින තීරුබදු සහන ඉදිරිපත් කළ අතර, සියළුම සාමාජික රටවල් සඳහා භාණ්ඩ 358 ක තීරුබදු නොවන සීමාවන් ඉවත් කළේය. මින් කොටසක් පමණක් ශ්‍රී ලංකාවට ප්‍රයෝජනවත් විය හැක.

සම්භවය පිළිබඳ මූලධර්මයේ දේශීය නිමැවුම් අන්තර්ගතය පිළිබඳ අවශ්‍යතාවයේ දක්වා ඇති පරිදි අපනයන කරන රට සැලකිය යුතු කොටසකින් එම නිෂ්පාදන සැකසීමේදී දායකවීම මත තීරුබදු සහනයන් ලබාදීම රඳා පවතී. තෙවන වටයේ සාකච්ඡා අවසානයේදී මෙම අවශ්‍යතාවය සියයට 50 සිට සියයට 40 දක්වා අඩු කිරීමට වූ යෝජනාවට අනුමැතිය ලැබිණි. ඉන්දු ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ පනවා ඇති නියමයන්ට වඩා මෙම නියමය ඉහළ මට්ටමක පවතී. කෙසේ වුවද, එවැනි නියමයන් තිබීම දේශීය නිමැවුම් අන්තර්ගතය සපුරා ඇති බවට සහතික පත්‍ර නිකුත් කිරීමේදී නිලධාරිවාදය සම්බන්ධවීම නිසා වෙළෙඳ වැඩපිළිවෙලට බාධා පමුණුවනු ඇත.

ශ්‍රී ලංකා-යුරෝපා හවුලේ ඒකාබද්ධ කොමිසමේ 14 වන සැසි වාරය 1998 දී පවත්වනු ලැබීය. මෙම රැස්වීමේදී ගොතන ලද ඇඳුම් හා රෙදිපිළිවල සම්භවය පිළිබඳ මූලධර්මය සඳහා සංශෝධනයක් ලබාගැනීමෙන්, වරණය පිළිබඳ පොදු ක්‍රමය (Generalized System of Preferences (GSP)) යටතේ සහනදායී තීරුබදු ලබාගැනීම සඳහා ශ්‍රී ලංකාව සාකච්ඡා පැවැත්වීය.

ශ්‍රී ලංකාවට වරණය පිළිබඳ පොදු ක්‍රමයට සහභාගි වන රටවලින් බදු සහන නොකඩවා සැලසිණි. එම රටවල් සියළුම දියුණු වෙමින් පවතින රටවල් වලට ප්‍රති තීරුබදු සහන ලැබීමේ අපේක්ෂාවෙන් තොරව තීරුබදු සහන ලබාදුනි. විවිධ රටවල් වලින් සහන ලබන අපනයනයන්ගේ කොටස සියයට 7- 42 ක් අතර පරාසයක පවතී. ඇමරිකා එක්සත් ජනපදයට කරනු ලබන අපනයනයන් අඩුම සහනයන් ලැබූ අතර, කැනඩාවට කරනු ලබන අපනයනයන්ට ඉහළම සහනයන් ලැබුණි. ආනයනය කරන ලබන රටවල් ලබන නොයෙකුත් ආරක්ෂාකාරී පියවර අනුගමනය කිරීමත් වරණය පිළිබඳ පොදු ක්‍රමය පිළිබඳ ශ්‍රී ලාංකික අපනයනකරුවන් නොදැන සිටීම සාමාන්‍යයෙන් අපනයනයනවලින් සුළු කොටසක් පමණක් සහන ලැබීමට හේතුවූවා වියහැක. සම්භවය පිළිබඳ මූලධර්මය යටතේ දේශීය නිමැවුම් අන්තර්ගත අවශ්‍යතාවය මත තවදුරටත් සහන ලබාගැනීමෙන් ශ්‍රී ලංකාවට සහන ලබන අපනයන ප්‍රමාණය වැඩිදියුණු කළ හැකිවනු ඇත. මේ ක්‍රමය අනුව සිය සාමාජිකයන් සඳහා විශේෂ සහන ලබාගැනීමට සාමූහික සම්භවය පිළිබඳ මූලධර්මය යටතේ සාක් රටවල්වලට බලපෑම් කළ හැක. මේ මිණුම් දණ්ඩ යටතේ දේශීය නිමැවුම් අන්තර්ගතය තීරණය කිරීමේදී සාක් සාමාජික රටවලින් ආනයනය කරනු ලැබ ඕනෑම අනිකුත් සාමාජික රටක් සිය නිෂ්පාදනය සඳහා යොදගනු ලැබූ යෙදවුම් දේශීය යෙදවුම් ලෙස සැලකිය හැකිවනු ඇත. සාමූහික සම්භවය පිළිබඳ මූලධර්මය යටතේ සහන ලබාගැනීමට හා එම ක්‍රමය අපනයනකරුවන් අතර ජනප්‍රිය කිරීමට ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුව දැනටමත් පියවර ගෙන ඇත.

වෙළෙඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමයට (Global System of Tariff Preferences (GSTP)) සහභාගී වන දියුණුවෙමින් පවතින රටවල් වලින් සහනයන් ලබාගැනීමේ ලා ශ්‍රී ලංකාව තවදුරටත් ඉදිරියට යනු ලැබීය. මෙම ක්‍රමය යටතේ, දියුණුවෙමින් පවතින රටවල් කණ්ඩායම එකිනෙකා අතර, තීරුබදු සහන හුවමාරු කරගත්හ. 1998 දී ශ්‍රී ලංකාව දෙවන වටයේ සාකච්ඡා සඳහා ඉදිරිපත් කරනු ලබන සිය පිරිනැමීම් ස්ථිර කළේය.

බැංකොක් ගිවිසුම යටතේ, ශ්‍රී ලංකාව, අඛණ්ඩව තීරුබදු සහනයන් භුක්ති විඳීය. (ඉන්දියාව, බංගලාදේශය, දකුණු කොරියාව, ලාඕසය හා ශ්‍රී ලංකාවේ සාමාජිකත්වය සහිතව) චීනය මෙම ගිවිසුමේ සාමාජිකයෙකු වීමට බලාපොරොත්තු වන අතර, සාමාජික රටවල් සමඟ තීරුබදු සහන සඳහා දැන් සාකච්ඡා පවත්වයි. සීමිත රටවල් ප්‍රමාණයක් පමණක් ආවරණයවීම, මෙම ගිවිසුම යටතේ ක්‍රියාකාරකම් මධ්‍යස්ථ මට්ටමක පැවතීමට හේතුව ලෙස සාමාජික රටවල් සලකයි. එබැවින් පිජී දූපත් මෙම කණ්ඩායමට එකතුකර ගැනීමේ උත්සාහයක ඔවුන් යෙදී සිටිති. 1998 දී ශ්‍රී ලංකාව පිජී දූපතට රුපියල් දශ ලක්ෂ 68 ක් වටිනා භාණ්ඩ අපනයන කළ අතර, රුපියල් දශ ලක්ෂයක් වටිනා භාණ්ඩ ආනයන කළේය.

අන්තර්ජාතික ස්වභාවික රබර් ගිවිසුමේ (International natural Rubber Agreement) ප්‍රබල සාමාජිකයකු වූ, මැලේසියාව ඉන් ඉවත් වීමත් සමඟ එම ගිවිසුම නව අභියෝගවලට මුහුණ දිනි. අනුමාන කරන පරිදි තායිලන්තයද ඉවත් වුවහොත් ගිවිසුම තවදුරටත් බාධකයන්ට මුහුණ දෙනු ඇත. අන්තර්ජාතික ස්වභාවික රබර් ගිවිසුමේ මිල උච්චාවචනය පාලනය කිරීමෙහි නියැලුනු, ජාතික ස්වභාවික රබර් සංවිධානයට (INRO) ස්වභාවික රබර් මිල ගණන් ක්‍රමයෙන් පිරිහීම වැලැක්වීමට නොහැකි වූ අතර එය ශ්‍රී ලංකාව ඇතුළු සියළුම රබර් නිපදවන රටවලට බලපෑවේය. සංවිධානයේ සිදුවන වෙනස්කම් සමීපව අධ්‍යයනය කිරීම හා එහි රැඳී සිටීමේ වැය හා ප්‍රතිලාභ නැවත අගය කිරීමට ශ්‍රී ලංකාවට සිදුවෙනු ඇත. බෙංගාල බොක්ක ආශ්‍රිතව පිහිටි රටවල් ඒකාබද්ධ කෙරෙන බිම්ස්ට්-එක් (BIMST-EC (Bangladesh, India, Myanmar, Sri Lanka, Thailand-Economic Co-operation) (බංගලා දේශ, ඉන්දියා, මියැන්මාර්, ශ්‍රී ලංකා, තායිලන්ත-ආර්ථික සහයෝගීතාව) හා කලාපීය සහයෝගීතාව සඳහා වූ ඉන්දියානු සාගර වට සංගමය (Indian Ocean Rim Association for Regional Co-operation ) යන කලාපීය කණ්ඩායම් දෙකේ රැස්වීම් වලටද ශ්‍රී ලංකාව සහභාගි විය. කලාපීය සහයෝගිතාව සඳහා වූ ඉන්දියානු සාගර වට සංගමයෙහි සාමාජිකත්වය අප්‍රිකාව, ආසියාව හා ඕෂියානියාව යන මහද්වීප දක්වා පැතිරෙන ඉන්දියානු සාගරයේ පිහිටි රටවල් අයත් වේ. වර්තමානයේ ශ්‍රී ලංකාව මෙම සංවිධානයෙහි උප-සභාපතිත්වය උසුලයි.

ශ්‍රී ලංකාව ජී-24 කණ්ඩායමේ රටවල්වල සාමාජිකයෙකු වන අතර, 1998 දී ජී-15 කණ්ඩායමේ රටවල්වලට ඇතුලත් කරගන්නා ලදී. මෙම දෙකම දියුණුවන රටවල්වල කණ්ඩායමිය. ජී-24 කණ්ඩායමේ අරමුණ නම් ජාත්‍යන්තර ආර්ථික හා මූල්‍ය ක්‍රමයේ අසමමිතික බලපෑම්වලට හඬ නැංවීම හා ඒ සඳහා පොදු විසඳුමක් සෙවීමයි. 1998 දී ශ්‍රී ලංකාව කණ්ඩායමේ ප්‍රථම උප-සභාපතිත්වය දරූ අතර, 1999 අප්‍රේල් මසදී සභාපතිත්වය භාරගනු ඇත. ජී-15 අරමුණ නම් අන්‍යෝන්‍ය විශ්ව ගැටළු දකුණු-දකුණු-දර්ශණය ඇසුරින් විසඳා ගැනීමයි. ප්‍රතිපත්ති හා ක්‍රියා විශ්ව මට්ටමෙන් සංවිධානය කිරීමේ හා සහයෝගීතා වැඩපිළිවෙලවල් දියුණු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට උදවු කිරීමේ අරමුණින්, දියුණුවෙන රටවල් අතර, අඛණ්ඩ උපදේශාත්මක සේවාවක් සපයන මණ්ඩලයක් ලෙස එය සකස්කර ඇත.

විශේෂයෙන්ම ලෝක වෙළඳ සංවිධානය හා වෙළඳ ගිවිසුම් සඳහා වූ අමාත්‍ය මණ්ඩල අතර සම්බන්ධතා කමිටුව යටතේ පිහිටවනු ලැබූ කෘෂිකර්මය සඳහා වූ උප කමිටුව, ලෝක වෙළඳ සංවිධානයේ කෘෂිකර්මය සඳහා වූ ගිවිසුම හේතුකොටගෙන ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට වන බලපෑම පිළිබඳ පර්යේෂණයන් පවත්වයි. නිෂ්පාදන පිරිවැයට වඩා අඩු මිලකට විකිණීම (Anti-dumping) හා ප්‍රතිතෝලන බදු (Countervailing duties) සඳහා වූ උපකමිටු උපදේශ මත සකස් කරන ලද නීති කෙටුම්පත් ශ්‍රී ලංකාවේ හා මේ සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ සැලකිල්ලට භාජනය වෙමින් පවතී.

## 9.13 අභ්‍යන්තර වෙළෙඳාම හා ආයතනික වැඩපිළිවෙල

ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර වෙළෙඳාම නිදහස් වෙළෙඳ පසුබිමක් මත අවම මැදිහත්වීම් සහිතව ක්‍රියාත්මක වේ. මිල තරඟය ඇති කිරීමට, මිල ගණන් ස්ථාවරව පවත්වාගෙන යාමට හා මිල හා සපයන ප්‍රමාණය දැඩි උච්චාවචනයට භාජනය වන පාරිභෝගික හා නිෂ්පාදක සුභසාධනය මත අනර්ථකාරී ප්‍රතිඵල ඇතිවිය හැකි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය කිහිපයක සැපයුම සහතික කිරීමට රජය මැදිහත් වේ. අභ්‍යන්තර හා අන්තර්ජාතික වාණිජ කටයුතු හා ආහාර අමාත්‍යාංශය හා එහි අලෙවි කටයුතු කරන සංවිධානයන් වන සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව (ස.තො.ස.) සළුසල, ලංකා ජෙනරල් ට්‍රේඩින් කම්පැණි ලිමිටඩ්, කිරියා කිරි පෞද්ගලික සමාගම, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය එහි අනුබද්ධ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය හා රාජ්‍ය ඖෂධ සංස්ථාව මගින් මෙම මැදිහත්වීම සිදුකෙරේ. අභ්‍යන්තර හා අන්තර්ජාතික වාණිජ කටයුතු හා ආහාර අමාත්‍යාංශය හා සම්බන්ධ පාලන මණ්ඩල දෙකක් වන අභ්‍යන්තර වෙළෙඳම පිළිබඳ දෙපාර්තමේන්තුව හා සාධාරණ වෙළෙඳ කොමිසම, ඖෂධ නිෂ්පාදන මිල පාලනය කිරීම හා අසාධාරණ වෙළෙඳ කටයුතු පිළිබඳ සෝදිසි කිරීම සිදු කළේය. සමහර අවස්ථාවන්හි එකම කාර්යය ආයතන දෙක මගින්ම සිදුවීම හේතුකොටගෙන, වෙළෙඳ කටයුතු පිළිබඳ සෝදිසි කරන වඩා ශක්තිමත් ආයතනයක් ඇති කිරීමේ අරමුණින් මෙම ආයතන දෙක ඒකාබද්ධ කිරීමට

1997 දී යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. යෝජිත ඒකාබද්ධකරණය සඳහා වූ ව්‍යවස්ථා කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුව මගින් පිළියෙල කරමින් පවතී.

අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ හා නිෂ්පාදකයාගේ සුභසාධනයට බලපාන භාණ්ඩ, සැපයුම හා මිල ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා ස.තො.ස. භාණ්ඩ තොග දේශීය වශයෙන් මිලට ගැනීමේ හා ආනයනය කිරීමේ නිරත විය. ස.තො.ස. වෙළෙඳපොළට මැදිහත් වන්නෙකු ලෙස කටයුතු කරන අතරම සිය ආයතනයේ මූල්‍ය ස්ථාවරත්වය ද ආරක්ෂා කරගත යුතු වේ. 1997 දී මිලදී ගත් මෙට්‍රික් ටොන් 1,570 හා සසඳන කල, දේශීය වශයෙන් මිලට ගත් ලොකු ළූණු ප්‍රමාණය, 1998 දී මෙට්‍රික් ටොන් 30 ක් වැනි ඉතා අඩු ප්‍රමාණයකට පහත වැටිණි. 1998 දී ලොකුළූණු සඳහා පැවති වාසිදයක මිල ගණන් දේශීය මිලදී ගැනීම් පහත වැටීමට හේතුවිය. එමනිසා ස.තො.ස.ට නිෂ්පාදකයන්ට සහයෝගය දක්වීම සඳහා මැදිහත්වීම අවශ්‍ය නොවීය. දේශීය වශයෙන් මිලට ගත් වියළි මිරිස් ප්‍රමාණයද, අඩු අස්වැන්න හා ගොවීන්ට ලැබුණු සාධාරණ ලෙස ඉහළ මිල ගණන් හේතුකොටගෙන 1998 දී පහත වැටිණි. 1997 දී මිලට ගත් මෙට්‍රික් ටොන් 1,797 හා සසඳන කල 1998 දී මිලට ගත් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 90 ක් විය. අඩු දේශීය සීනි නිෂ්පාදනය අඩු දේශීය මිලදී ගැනීම්වලට තවදුරටත් හේතුවිය. 1998 දී ස.තො.ස. සීනි මෙට්‍රික් ටොන් 650 ක් මිලට ගත්තේය. එම ප්‍රමාණය පසුගිය වසරේ මිලට ගත්, මෙට්‍රික් ටොන් 290 ට වඩා වැඩි වුවද, 1996 දී මිලට ගත් මෙට්‍රික් ටොන් 4,608 ට වඩා සැලකිය යුතු ලෙස පහත් මට්ටමක පවතී.

1996 දී අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය කිහිපයක බලපත්‍ර අවශ්‍යතාවය ඉවත් කිරීමත් සමඟ, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනයෙන් සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවට හිමි වූ කොටස, 1997 දී හා 1998 දී සැලකියයුතු ලෙස පහත වැටිණි. දේශීය මිලදී ගැනීම් ප්‍රමාණවත් නොවන අවස්ථාවන්හිදී සිය සිල්ලර වෙළෙඳසැල්වලට සැපයීම සඳහා පමණක් ස.තො.ස. එවැනි භාණ්ඩ ආනයනය කළේය. එසේ වුවද, වඩා හොඳ දේශීය වී අස්වැන්නක් ලැබීම හා ලොකුළූණු ආනයනය කරන ප්‍රධාන රටවල් (ඉන්දියාව හා පකිස්ථානය) වල අඩු අස්වැන්න හේතුකොටගෙන එම රටවල් ලොකු ළූණු අපනයනයට පැනවූ සීමාවන් සඳහා ගැලපීම් කළපසු, 1997 ආනයනය කළ එම භාණ්ඩයන්ගේ ප්‍රමාණයන් 1998 ආනයනය කළ ප්‍රමාණය හා සැසඳිය හැක. 1998 දී ස.තො.ස. ලොකු ළූණු මෙට්‍රික් ටොන් 5,148 ක් (මුළු ආනයන වලින් සියයට 7 ක්), වියළි මිරිස් මෙට්‍රික් ටොන් 198 ක් (මුළු ආනයන වලින් සියයට1 ක්) හා සහල් මෙට්‍රික් ටොන් 14,953 (මුළු ආනයන වලින් සියයට 9 ක්) ආනයනය කළේය. එසේ වුවද, ලංකාවේ තිරිඟු පිටි කරන එකම ආයතනය වන ප්‍රීමා ලංකා සමාගමේ නිෂ්පාදනයට බාධා පැමිණීම හේතුකොටගෙන, ආනයන බලපත්‍ර මත ඇති එකම භාණ්ඩය වන තිරිඟු පිටි, ආනයනය මෙට්‍රික් ටොන් 5,213 සිට මෙට්‍රික් ටොන් 46,283 දක්වා ඉහළ ගියේය.

1998 තොග වෙළෙඳසැල් 7 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් 1998 දී ක්‍රියාත්මක වූ ස.තො.ස. වෙළෙඳසැල් ගණන සිල්ලර වෙළෙඳ සැල් 147 ක්ද, තොග වෙළෙඳසැල් 42 ක්ද විය. 1998 ස.තො.ස. මුළු වෙළෙඳ පිරිවැටුම 1997 දී වාර්තා වූ රුපියල් දශ ලක්ෂ 5,392 සිට රුපියල් දශ ලක්ෂ 5,282 දක්වා අඩුවිය. 1997 වර්ෂයෙහි පැවති අඩුවීමට ප්‍රතිවිරුද්ධව 1998 දී ස.තො.ස. වරලත් අලෙවි නියෝජිතයන්ගේ පිරිවැටුම වර්ධනය විය. 1998 ස.තො.ස. වරලත් නියෝජිත වෙළෙඳසැල් වල මුළු විකුණුම් රුපියල් දශ ලක්ෂ 613 ක් වූ අතර, එය 1997 වාර්තා වූ රුපියල් දශ ලක්ෂ 432 කට වඩා සැලකියයුතු ලෙස වැඩි වුවද, 1996 වාර්තා වූ රුපියල් දශ ලක්ෂ 698 ට වඩා අඩුය. මෙම සතුටුදයක ක්‍රියාකාරිත්වයට ස.තො.ස. වරලත් අලෙවි නියෝජිත වෙළෙඳසැල්වල ජංගම විකුණුම් හඳුන්වාදීම සහ නව ස.තො.ස. වරලත් අලෙවි නියෝජිතයන් 260 ක් හා සුපිරි ස.තො.ස. වරලත් අලෙවි නියෝජිතයන් 18 ක් පත්කිරීම හේතුවිය. ස.තො.ස. සිය ලාභ ඉපැයීමේ උපාය මාර්ගයේ අංගයක් ලෙසින් මෙන්ම ශ්‍රී ලංකා නිෂ්පාදන විදේශයන්හි ජනප්‍රිය කිරීමේ අරමුණින්ද, 1998 දී විදේශ රටවල්වල ස.තො.ස. වරලත් අලෙවි නියෝජිත වෙළෙඳසැල් ආරම්භ කිරීම ඇරඹීය. එම පළමු අලෙවි නියෝජිතයා ඕස්ට්‍රේලියාවෙහි පත්කරනු ලැබූ අතර, 1999 දී තෝරාගත් රටවල් කිහිපයක අලෙවි නියෝජිතයන් පත්කෙරෙනු ඇත. සළුසල, ලංකා ජෙනරල් ට්‍රේඩින් කොම්පැණි හා කිරියා කිරි පෞද්ගලික සමාගම වැනි අභ්‍යන්තර හා අන්තර්ජාතික වාණිජ කටයුතු හා ආහාර අමාත්‍යංශයේ අනිකුත් අලෙවිකරණ ආයතන, අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩවල මිල හා ගුණාත්මක බව පෙන්නුම් කරන ආධාරක ලෙස කටයුතු කළේය. සාධාරණ තරඟකාරිත්වය තහවුරු කිරීමේ වැදගත් කාර්යභාරයක් මෙම ආයතන මගින් ඉටුවිය. රාජ්‍ය ඖෂධ සංස්ථාව හා සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවද මේ හා සමාන කාර්යභාරයක් ඉටු කළේය. තීරුබදු අත්හැරීම් හා තීරුබදු වෙනස්කිරීම් තුළින්, මහා භාණ්ඩාගාරයද අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සැපයුම කෙරෙහි බලපෑමක් ඇති කළේය.

නිදහස් වෙළෙඳ වාතාවරණයක් තුළ, වෙළෙඳුන්ගේ විධිමත් ක්‍රියාපිළිවෙත් තහවුරු කිරීමේ කාර්යයන්හි අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුව හා සාධාරණ වෙළෙඳ කොමිසම තවදුරටත් යෙදී සිටියහ. පාරිභෝගික අයිතීන් පිළිබඳ පාරිභෝගිකයන්ගේ දැනුවත් බව වැඩිකිරීම, පාරිභෝගික කණ්ඩායම් ඇති කිරීමට උනන්දු කිරීම, පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගැනීම, සාධාරණ වෙළෙඳ පිළිවෙත් ඇතිකිරීම, අභ්‍යන්තර වෙළෙඳාම විධිමත් කිරීම හා අවශ්‍ය අවස්ථාවලදී මිල පාලනයක් පවත්වාගෙන යාම සඳහා මෙම ආයතන දෙක සැලකියයුතු ප්‍රයත්නයක් දැරීය.

මිල පාලන පනත, පාරිභෝගික ආරක්ෂණ පනත හා පොහොර ආඥා පනතේ විධිවිධානයන්ට අනුව අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුව කටයුතු කළේය. ආනයනය කරන ලද බෙහෙත් හා ඖෂධ උපකරණ 1998 දී මිල පාලනයන්ට යටත් විය. අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුව මිල පාලන

පනත යටතේ, පරීක්ෂණ කටයුතු 175 ක් මෙහෙය වූ අතර, ඉන් 53 ක් වැරදි බව සොයා ගන්නා ලදී. මිල පාලන පනත යටතේ හදිසි වැටලීම් 2,275 ක් මෙහෙය වූ අතර උසාවියේ පැමිණිලි 1,507 ගොනු කරන ලදී. පොහොර පනත යටතේ, සිදුකළ පරීක්ෂණ වලින්, පොහොර වැරදි අන්දමින් මිශ්‍ර කිරීම, ප්‍රමිතීන්ට අනුකූල නොවන මිශ්‍රණයන් විකිණීම, ගබඩා කිරීමේ බෙදාහැරීමේ හා විකිණීමේ නීති උල්ලංඝනය කිරීම හා අදාළ සිද්ධීන් 82 ක් සොයා ගැනීමට හැකිවිය. අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුවට භාණ්ඩ හා සේවා බද්ද අවිධිමත් ලෙස පැනවීම පිළිබඳවද පාරිභෝගික පැමිණිලි ලැබුණු අතර, ඒ පිළිබඳවද පරීක්ෂා කරන ලදී.


සම්මන්ත්‍රණ පැවැත්වීම හා සිය ප්‍රකාශනයන් තුළින්, අභ්‍යන්තර වෙළෙඳ දෙපාර්තමේන්තුව සිය පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙල අඛණ්ඩව සිදු කරන ලදී. සියළුම මදුරු දහර, ශ්‍රී ලංකා ප්‍රමිති අංක 453 නියමයන්ට අනුව වියයුතු බවට දෙපාර්තමේන්තුව විසින් නියෝගයක් නිකුත් කර ඇත. දෙපාර්තමේන්තුව, එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජීය සංවිධානයේ සහයෝගීතාවය යටතේ ඇති ආසියානු පැසිෆික් කලාපීය අන්තර් ජාතික පාරිභෝගික සංගමයේ ක්‍රියාකාරී කමිටුවේ අඛණ්ඩව කටයුතු කරයි.

සාධාරණ වෙළෙඳ කොමිසම ඖෂධ වර්ගවල මිල තීරණය කිරීම දිගටම සිදු කළේය. දේශීයව නිෂ්පාදනය කළ හෝ පැකට් කළ ඖෂධ සංයෝග සඳහා පළමුවරට උපරිම සිල්ලර විකුණුම් මිලක් නියම කරන ලදී. කොමිසම තරඟකාරිත්වයට හානිකර පිළිවෙත් 6 ක්, පාරිභෝගික පැමිණිලි 4 ක් හා සමාගම් ඒකාබද්ධ වීමක් පිළිබඳව පරීක්ෂණ පැවැත් විය. දේශීය වෙළෙඳපොළෙහි නිෂ්පාදන පිරිවැයට වඩා අඩු මිලකට විකිණීම (Anti-dumping) පිළිබඳ පැමිණිලි සාධාරණ වෙළෙඳ කොමිසමට ඉදිරිපත් නොවූ අතර, 1998 ඒ පිළිබඳ පරීක්ෂණ නොපැවැත්විණි.

## 9.14 සංචාරක කර්මාන්තය

සංචාරක කර්මාන්තය 1996 දී අත්දුටු දැඩි පසුබෑමෙන් පසුව 1998 දී යථා තත්ත්වයට පත්විය. සංචාරක පැමිණීම් සංඛ්‍යාව 1995 දී 403,101 සිට 1996 දී 302,265 දක්වා පහත වැටිණි. 1997 දී සංචාරක පැමිණීම් 366,165 දක්වා සියයට 21 කින් වැඩිවිය. 1998 වසර මුලදී සිදුවූ ප්‍රධාන ත්‍රස්තවාදී පහරදීම් දෙකෙහි බලපෑමද නොතකා, ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ඉලක්කය වූ 388,000 ට ඉතා ආසන්න වශයෙන් ළඟා කරගනිමින් 1998 දී සංචාරක පැමිණීම් 381,063 දක්වා සියයට 4 කින් වැඩිවිය. නැගෙනහිර ආසියානු රටවල ව්‍යවහාර මුදල්වල අගය ක්ෂයවීමේ ප්‍රති-ඵලයක් ලෙස එම රටවල් වලින් වූ තරඟකාරිත්වය හා ලෝක ආර්ථික පසුබෑමේ බලපෑමද මෙම මඳ වර්ධනයට හේතුවිය. සංචාරකයෙකුගෙන් උපයන ලද සාමාන්‍ය ආදායම ඉහළ යාමක් පිළිබිඹු කරමින්, සංචාරක පැමිණීම්වල වර්ධන

### 9.9 රූප සටහන
### සංචාරක සංඛ්‍යා ලේඛණ (1997-100)




අනුපාතයට වඩා වැඩි අනුපාතයකින් එනම් සියයට 21 කින් සංචාරක ව්‍යාපාරයෙන් ලද දළ ඉපැයුම් 1998 දී ඉහළ ගියේය. සාමාන්‍යයෙන් දිගුකලක් නැවතීමේ ප්‍රවනතා-වයක් ඇති (Average Duration of Stay) ඉහළ ආදායම් ලබන යුරෝපීය රටවලින් පැමිණි සංචාරකයන්ගේ කොටස වැඩිවීම මෙයට හේතුවිය.

සංචාරක පැමිණීම්වල වර්ධනය අනුව යමින්, සංචාරක රාත්‍රී ගණන හා සමස්ත කාමර උපයෝජන අනුපාතය සියයට 7 බැගින් වැඩිවිය. කලාපීය පදනම අනුව කොළඹ නගරයේ හා කඳු රටෙහි හැර, අන් සියළුම කලාපයන්ගේ කාමර උපයෝජන අනුපාතයන්ගේ වර්ධනයක් වාර්තා විය. දකුණු වෙරළබඩ, මහ කොළඹ හා පෞරාණික නගරවල ඉහළ වර්ධන අනුපාතයන් වාර්තා විය.

ප්‍රධාන වශයෙන් කඳුරට හා දකුණු වෙරළබඩ හෝටල් සංඛ්‍යාව වැඩිවීම හේතුවෙන්, ශ්‍රේණිගත නවාතැන් අංශයේ හෝටල් ඒකක සංඛ්‍යාව 158 සිට 163 දක්වා වැඩිවිය. ඉහළ හෝටල් ඒකක සංඛ්‍යාවත් සමඟ කාමර ධාරිතාවයද 12,370 සිට 12,772 දක්වා වැඩිවිය.

### 9.12 සංඛ්‍යා සටහන
### සංචාරක ව්‍යාපාරය පිළිබඳ සංඛ්‍යා ලේඛන

| ශීර්ෂය | 1996 | 1997(අ) | 1998(ආ) | ප්‍රතිශත වෙනස 1997 | ප්‍රතිශත වෙනස 1998 |
|---|---|---|---|---|---|
| 1. සංචාරක පැමිණීම් | 302,265 | 366,165 | 381,063 | 21.1 | 4.1 |
| 2. සංචාරක දින(රාත්‍රී) ගණන(දහස්) | 2,974 | 3,680 | 3,950 | 23.7 | 7.3 |
| 3. කාමර උපයෝජන අනුපාතය(%) | 40.3 | 49.1 | 52.8 | 21.8 | 7.5 |
| 4. දළ සංචාරක ලැබීම්(රු.දශලක්ෂ) | 9,195 | 12,316 | 14,873 | 33.9 | 20.8 |
| 5. ඒක පුද්ගල සංචාරක ලැබීම් (රුපියල්) | 30,420 | 33,635 | 41,584 | 10.6 | 23.6 |
| 6. මුළු සේවා නියුක්තිය | 76,711 | 82,080 | 83,427 | 7.0 | 1.6 |
| සෘජු | 31,963 | 34,200 | 34,780 | 7.0 | 1.7 |
| වක්‍ර | 44,748 | 47,880 | 48,647 | 7.0 | 1.6 |

මූලයන් : සංචාරක මණ්ඩලය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිතයි
(ආ) තාවකාලිකයි

සංචාරක පැමිණීම් වලින් සියයට 63 කට දායක වෙමින් බටහිර යුරෝපය මෙරටට සංචාරකයන් පැමිණෙන ප්‍රධාන ප්‍රභවය ලෙස පැවැතිණි. මෙම කලාපයෙන් පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව සියයට 13 ක වර්ධනයක් වාර්තා කළ අතර, මුළු සංචාරක පැමිණීම් වලින් එම කලාපයේ කොටස සියයට 58 සිට සියයට 63 දක්වා වැඩිවිය. ජර්මනියෙන් හා නෙදර්ලන්තයෙන් වූ ඉහළ සංචාරක පැමිණීම් මෙම වර්ධනයට සැලකිය යුතු ලෙස දායක වූ අතර, ස්වීඩනය හා බෙල්ජියම හැර කලාපයේ වූ අනිකුත් සියළුම රටවලින් ඉහළ සංචාරක පැමිණීම් වාර්තා විය. පසුගිය වසර දෙක තුළදී වැඩිම සංචාරකයන් ගණනක් පැමිණි ප්‍රභවය වූ එක්සත් රාජධානිය අභිබවා යමින් ජර්මනිය සංචාරක පැමිණීම්වල මුල් තැන ගත්තේය.

ප්‍රධාන වශයෙන් ඉන්දියාව, තායිලන්තය හා මැලේසියාවෙන් වූ සංචාරක පැමිණීම්වල අඩුවීම හේතුකොටගෙන, ආසියාවෙන් වූ සංචාරක පැමිණීම් සියයට 12 කින් අඩුවිය. ආසියානු කලාපයේ සංචාරක පැමිණීම් කෙරෙහි නැගෙනහිර ආසියානු අර්බුදය බලපාන්නට ඇත. නැගෙනහිර යුරෝපය, උතුරු ඇමරිකාව හා ඔස්ට්‍රලේෂියාවෙන් පැමිණි සංචාරකයන්ගේ ගණන් පිළිවෙලින් සියයට 13, 10 හා 4 කින් වැඩිවිය.

මුළු සංචාරක පැමිණීම් වලින් සියයට 69 ක් අන්තර් කලාපීය ගුවන් යානා මගින් පැමිණි අතර තවත් සියයට 20 ක් කලාපීය ගුවන් යානා මගින් පැමිණියහ. 1997 වූ සියයට 46 හා සසඳන කල එයාර් ලංකා ගුවන් යානා මගින් පැමිණි සංචාරකයන් සංඛ්‍යාව 1998 දී පැමිණි මුළු සංචාරකයන්ගෙන් සියයට 42 ක් විය. කුලී ගුවන් යානා මගින් පැමිණි සංචාරකයන් සංඛ්‍යාව 1998 දී අඛණ්ඩව වර්ධනය විය. සියයට 119 ක වර්ධනයක් වාර්තා කරමින් 1997 දී වූ සියයට 5 (සංචාරකයන් 19,555) හා සසඳන විට 1998 දී මුළු සංචාරක පැමිණීම් වලින් සියයට 11 ක් (සංචාරකයන් 42,755) කුලී ගුවන් යානා මගින් පැමිණියහ. බ්‍රිතාන්‍ය ගුවන් සේවය (British Airways) ශ්‍රී ලංකාවේ සිය ව්‍යාපාරික කටයුතු අත්හිටුවීම මෙයට අර්ධ වශයෙන් හේතු වූ අතර ඒ බව කුලී ගුවන් යානා වලින්, එක්සත් රාජධානියෙන් පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව දෙගුණයකට වඩා වැඩිවීම මගින් පෙන්නුම් කෙරේ. අනිකුත් රටවල් වලින් කුලී ගුවන් යානාවලින් පැමිණි සංචාරකයන්ගේ ගණන කුලී ගුවන් යානා වලින් පැමිණි මුළු සංචාරකයන්ගෙන් සියයට 66 ක් වූ අතර, එම ප්‍රමාණය සියයට 101 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. විවේකී සංචාරක කලාප දියුණු කිරීමේලා කුලී ගුවන් යානා ඉතා වැදගත් මෙහෙවරක් ඉටු කරන බැවින්, ශ්‍රී ලංකාවට කුලී ගුවන් යානා පැමිණීම වැඩිකිරීම සඳහා තවදුරටත් ප්‍රයත්න දැරීම කළයුතුය.

සාමාන්‍යයෙන් රටතුල සංචාරකයකු නැවතී සිටින කාලය 1997 දී දින 10.1 සිට 1998 දී දින 10.4 දක්වා ආන්තික වර්ධනයක් පෙන්වීය. කුලී ගුවන් යානා මගින් පැමිණෙන සංචාරකයන් සාමාන්‍යයෙන් වඩා වැඩි කලක් රට තුළ රැඳී සිටින බව දක්නට ලැබිණි. 1998 දී කුලී ගුවන් යානා මගින් පැමිණෙන සංචාරකයන් සාමාන්‍යයෙන් අන් සංචාරකයන්ට වඩා දින 3 ක් රට තුළ රැඳී සිටියහ. රටවල් පදනම මත ඉහළම කාලයක් එනම් දින 15 ක් ජර්මානු සංචාරකයන් රට තුළ රැඳී සිටි අතර, ඉන්පසු ඉහළ කාලයක් නැවතී සිටීම වාර්තා කළේ ඕස්ට්‍රියාව (දින 13), නෙදර්ලන්තය (දින 12.5) හා එක්සත් රාජධානිය (දින 12) වැනි රට වලින් පැමිණි සංචාරකයන්ය. 1997 දීද ඉහළම නැවතීමේ සාමාන්‍ය කාලය වූ දින 14 වාර්තා කළෙත් ජර්මානු සංචාරකයන්ය.

සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාවේ ගුවන් අවකාශය කළමනාකරණය හා පරිහරණය තුළින් සංචාරක ව්‍යාපාරයේ වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. සතියක ගුවන් වාර සංඛ්‍යාව හා ආසන ධාරිතාව (Seating Capacity) වැඩිකර ගැනීම සඳහා 1998 දී දෙපාර්තමේන්තුව එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව හා ප්‍රංශය ඇතුළු රටවල් 7 ක් සමඟ ද්විපාර්ශවික ගිවිසුම් අත්සන් කළහ. වසර අවසානයේ ක්‍රියාත්මක වූ කුලී ගුවන් යානා සංඛ්‍යාව නවයක් දක්වා ඉහළ නංවමින් ඉතාලි හා ප්‍රංශ නව කුලී ගුවන් යානා දෙකක් 1998 දී දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූහ. විශේෂයෙන් බටහිර යුරෝපීය රටවල් වලින් ඇති වූ ගුවන් ගමන් ධාරිතාවයේ වැඩිවීම කර්මාන්තයට වාසිදායක වනු ඇත. 1999 දී එයාර් ලංකා සමාගමේ අපේක්ෂිත ගුවන් යානා සංඛ්‍යාව වැඩිකිරීම සංචාරක පැමිණීම් කෙරෙහි එලදායී ලෙස බලපානු ඇත.

මුළු සංචාරක පැමිණීම් වලින් සියයට 93 කට දායක වෙමින් 1998 දීද නිවාඩු ගතකිරීම් සංචාරක පැමිණීම්වල ප්‍රධාන අරමුණ විය. ඉතිරිය ව්‍යාපාරික කටයුතු, නෑදයන් හා මිතුරන් බැහැ දැකීම සඳහා විය. පරිසරාත්මක සංචාරක කටයුතු (Eco-Tourism) හා සංස්කෘතිකමය සංචාරක කටයුතු (Culture-Tourism) වැනි නව ආකාරයේ විනෝදස්වාදය සඳහා වූ සංචාරක කටයුතු වැඩිදියුණු කිරීමට ඇති හැකියාව තවදුරටත් තහවුරු කරමින්, වන ජීවී උද්‍යාන, උද්භිද උද්‍යාන, සත්ව උද්‍යාන හා සංස්කෘතික ත්‍රිකෝණය නැරඹීමට ගිය සංචාරකයන්ගෙන් ලද ආදායම 1998 දී තවදුරටත් ඉහළයාමක් දක්නට ලැබුණි. රුපියල් දශ ලක්ෂ 30 ක ඇස්තමේන්තුගත වියදමකින්, පින්නවල අලි අනාථාගාරයට යාබදව, අක්කර 38 ක භූමි භාගයක ඉදිකිරීමට යෝජිත පින්නවල නවීන සත්වෝද්‍යානයේ වැඩ කටයුතු ශ්‍රී ලංකා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව මගින් 1998 දී ආරම්භ කරන ලදී. විදේශීය සංචාරකයන් සඳහා සංස්කෘතික හා කලා ක්ෂේත්‍රයන්හි වින්දනය ලබාදීම පිණිස කොළඹ කොටුවේ පිහිටුවීමට යෝජිත ජාතික කලා හා සංස්කෘතික මධ්‍යස්ථානයේ පිහිටුවීමේ වැඩකටයුතු ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය මගින් 1998 දී ආරම්භ කරන ලදී. මෙම නවාංගයන්, දැනටමත් ජනප්‍රිය වෙමින් පවත්නා, නව ආකාරයේ විනෝදස්වාදය සඳහා වූ සංචාරක කටයුතු දියුණු කිරීමට නියත වශයෙන්ම උදව් වෙනු ඇත. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය (Sri Lanka Convention Bureau) 1998 දීද රැස්වීම්, සංචාර,

සම්මේලන ප්‍රදර්ශන (MICE) සඳහා සංචාරකයින්ගේ පැමිණීම් වැඩිදියුණු කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කළේය. කාර්යාංශය 1998 දී සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන 8 ක් මෙහෙය වූ අතර මෙම සංචාරක කාණ්ඩය යටතේ සංචාරකයන් 1,925 ක් රට තුළට ගෙන ඒමට සමත්විය. රැස්වීම්, සංචාර, සම්මේලන ප්‍රදර්ශන (MICE) සංචාරක පැමිණීම් සඳහා ආසියාවේ නවීනතම මධ්‍යස්ථානය ලෙස ශ්‍රී ලංකාව ජනප්‍රිය කරවීම සඳහා කාර්යාංශය ජාත්‍යන්තර ප්‍රචාරක කටයුතු කිහිපයකට සහභාගි විය. කෙසේ වුවද, රට තුළ සිදුවන අපරාධ සංචාරකයන්ට කරන හිරිහැර, වෙරළ තීරය අපවිත්‍ර කිරීම වැනි ද මෙවැනි උසස් පරමාර්ථ සහිත ක්‍රියාවන්ගේ ප්‍රතිඵල වලට සැලකියයුතු ලෙස හානි පමුණුවනු ඇත.